





# වාර්ෂික වාර්තාව

# 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
අංක 80,ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථන : +94 112 432 059 – 60 | www.srilanka.travel

# වාර්ෂික වාර්තාව 2016

srilanka

WONDER OF ASIA

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**

සංචාරක, ක්‍රිස්තියානි ආගමික කටයුතු සහ වනජීවි අමාත්‍යාංශය

## පටුන


| අන්තර්ගතය | පිටු අංකය |
| --- | --- |
| සංවර්ධන ප්‍රගතිය 2016 .................................................... | 1 |
| අරමුණු .................................................... | 1 |
| 2013 සිට 2016 දක්වා සංචාරක පැමිණීම් වර්ධනය .................... | 1 |
| ප්‍රධානතම මූලික වෙළඳපල 10 .................................................... | 2 |
| රටේ සුවිශේෂී සංවර්ධන ක්‍රියාකාරකම් සහ සහායක දූත මණ්ඩල | 2 |
| බටහිර යුරෝපය .................................................... | 3 |
| එක්සත් රාජධානිය .................................................... | 4 |
| ජර්මනිය .................................................... | 11 |
| ප්‍රංශය .................................................... | 14 |
| නෙදර්ලන්තය .................................................... | 17 |
| **ස්වීඩනය** .................................................... | 18 |
| ඉතාලිය .................................................... | 19 |
| ඔස්ට්‍රියාව .................................................... | 21 |
| බෙල්ජියමය .................................................... | 21 |
| නෝර්වේ .................................................... | 23 |
| ඇමරිකා එක්සත් ජනපදය .................................................... | 23 |
| **දකුණු ආසියාව** .................................................... | 24 |
| ඉන්දියාව .................................................... | 24 |
| නැගෙනහිර ආසියාව .................................................... | 27 |
| චීනය .................................................... | 28 |
| ජපානය .................................................... | 31 |
| මැලේසියාව .................................................... | 34 |
| සිංගප්පූරුව .................................................... | 38 |
| දකුණු කොරියාව .................................................... | 39 |
| තායිලන්තය .................................................... | 41 |
| මැදපෙරදිග ...............................................,...... | 42 |
| නැගෙනහිර යුරෝපය .................................................... | 45 |
| රුසියාව .................................................... | 46 |
| චෙක් ජනරජය .................................................... | 47 |
| පෝලන්තය .................................................... | 49 |
| ඕස්ට්‍රේලේසියාව .................................................... | 51 |
| ඕස්ට්‍රේලියාව .................................................... | 51 |
| BLOGGING, වෙබ් අඩවි සැකසීම සහ ඩිජිටල් මාධ්‍ය ................. | 54 |
| දේශීය ජනමාධ්‍ය .................................................... | 61 |
| ගමනාන්ත සහ සමාජ වගකීම් .................................................... | 65 |
| නව නිෂ්පාදිතයන් සහ NICHE SEGMENT අලෙවිකරණය ............ | 67 |
| දේශීය ඉසව් .................................................... | 68 |
| අවසාන ගිණුම් .................................................... | 75 |
| විගණන වාර්තාව .................................................... | 92 |

# සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම පණිවිඩය එක් කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙමි.

සමාලෝචිත වසර තුළ මිලියන 46 ක වැඩිපුර සංචාරකයන් ප්‍රමාණයක් ලොව පුරා සංචාරය සඳහා එක්වී ඇත. මෙම සංඛ්‍යාව බිලියන 1.23 ක් දක්වා වර්ධනය වීම, ගත වූ වසරට සාපේක්ෂව සියයට 3.9 ක වර්ධනයකි. මේ අතරින් යුරෝපයෙන් වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ ඇති අතර (50.2%), දකුණු ආසියාවෙන් අවම වශයෙන් (1.6%) සංචාරය කර ඇත. කෙසේ වෙතත්, සෑම කලාපයකින්ම ඉහලම වර්ධනය ආසියා පැසිෆික් කලාපයෙන් වාර්තා වූ අතර එය සියයට 8.4 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීමේ වර්ධනයේ ඓතිහාසික අවස්ථාව 2016 වර්ෂයේ දී පළමු වරට සිදු විය. ඒ සංචාරකයන්ගේ පැමිණීම මිලියන 2 ක් වීමයි. මින් අදහස් කෙරෙනුයේ පෙර වසරට වඩා සංචාරකයන් 250,000 කට වැඩි පිරිසක් අප වෙත ලගාවීමකි. එය වසරකදී 14% ක සැළකියයුතු වර්ධන වේගයක් කරා ලඟා වීමකි.

විදේශ විනිමය ආදායම 18.5% කින් වර්ධනයවීම ද වඩා වැදගත් කරුණකි. එනම් වසර 2015 දී රු. මිලියන 405,492 (ඇමෙරිකානු ඩොලර් මිලියන 2,980.60) සිට වසර 2016 දී රු. මිලියන 512,293 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 3,518 ක්) බවට වර්ධනය වී ඇත. සංචාරකයින්ගේ දෛනික වියදම වසර 2015 දී ඇමෙරිකානු ඩොලර් 164.1 ක සිට වසර 2016 දී ඇමෙරිකානු ඩොලර් 168.2 ක් දක්වා ඒක පුද්ගලයෙකු සඳහා වැඩි කිරීමට අපට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ තෙවන විශාලතම විදේශීය විනිම ප්‍රභවය ලෙස සංචාරක කර්මාන්තය පත් වි ඇත.

සංචාරක කර්මාන්තයේ පුරෝගාමීන් වන ඉන්දියාව හා චීනය සිටියදීත් ආසියාව අඛණ්ඩව අපේ ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපල ලෙස පැවතුණේ සියලූ පැමිණෙන සංචාරකයන්ගෙන් සියයට 45.1 ක් සනිටුහන් කරමිනි. බටහිර යුරෝපය දෙවන ස්ථානයට පත්ව ඇත්තේ 31.4% ක කොටසකිනි. මෙම කලාප දෙකම 2016 දී ද්විත්ව සංඛ්‍යා වර්ධනයක් වාර්තා කර ඇත.

ගරු ජෝන් අමරතුංග

සංචාරක, ක්‍රිස්තියානි ආගමික කටයුතු සහ වනජිවි අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2016

| නම | තනතුර | කාලය පරිච්ඡේදය |
|---|---|---|
| පී එම්. විතාන මහතා | සභාපති - වැඩබලන | 2015 ඔක්තෝබර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| එම්. බී. කිරිඇල්ල මහතා | අධ්‍යක්ෂක ජනරාල් - SLTDA | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| රුවනි ඩයස් බණ්ඩාරනායක මහත්මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2016 පෙබරවාරි මස 15 - 2016 ජූනි මස 06 දින |
| සුතේෂ් බාලසුබ්‍රමනියම් මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2016 නොවැම්බර් මස 02 - 2016 දෙසැම්බර් මස 31 දින |
| කපිල ජයසේකර මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 මාර්තු මස 09 දින |
| ශිරාණි වීරකෝන් මහත්මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2016 මාර්තු මස 09 - 2016 දෙසැම්බර් මස 31 දින |
| කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 15 - 2016 දෙසැම්බර් මස 31 දින |
| හිරාන් කුරේ මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අමල් ගුණතිලක මහත්මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 ඔක්තෝබර් මස 27 දින |
| ඇන්ජලීන් ඔන්ඩච්චි මහත්මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අශෝක හෙට්ටිගොඩ මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| මහේන් කාරියවසම් මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| වසන්ත ලීලානන්ද මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2015 නොවැම්බර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| හාරිත් පෙරේරා මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික | 2016 නොවැම්බර් මස 16 - 2016 දෙසැම්බර් මස 31 දින |

### ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් - 2016

| තනතුර | නම | කාලය පරිච්ඡේදය |
|---|---|---|
| සභාපති - වැඩබලන | පී. එම්. විතාන මහතා | 2015 ඔක්තෝබර් මස 13 - 2016 දෙසැම්බර් මස 31 දින |
| කළමනාකාර අධ්‍යක්ෂක | රුවනි ඩයස් බණ්ඩාරනායක මහත්මිය | 2016 පෙබරවාරි මස 15 - 2016 ජූනි මස 06 දින |
| | සුතේෂ් බාලසුබ්‍රමනියම් මහතා | 2016 නොවැම්බර් මස 02 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අධ්‍යක්ෂක අලෙවි | මධුභානි පෙරේරා මහත්මිය | 2013 ජනවාරි මස 01 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අධ්‍යක්ෂක මහජන සම්බන්ධතා | දුෂාන් වික්‍රමසූරිය මහතා | 2014 ජූලි මස 10 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අධ්‍යක්ෂක - ගමනාන්ත සමාජ වගකීම් | ඉන්ද්‍රජිත් ද සිල්වා මහතා | 2015 මාර්තු මස 01 - 2016 දෙසැම්බර් මස 31 දින |
| අධ්‍යක්ෂක - මූල්‍ය | එන්. පී. දායාරත්න මහතා | 2015 ජූලි මස 02 - 2016 දෙසැම්බර් මස 31 දින |

# ප්‍රවර්ධන ප්‍රගතිය 2016
# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

2016 අරමුණ

1. 2016 වසර තුළදී මිලියන 2.2 ක සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීම සඳහා තිරසාර පියවර ගැනීම දේශීය හා විදේශීය සංචාර මෙහෙයවන්නන් දිරිගැන්වීම සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කරගැනීම.

2. 2016 අවසානය වන විට එක් සංචාරකයෙකුගේ දෛනික වියදම ඩොලර් 170 ක් දක්වා වියදම් වැඩි කිරීම මගින් ඵලදායී හා ප්‍රතිඵලදායී සංචාරක ව්‍යාපාරයක් නිර්මාණය කිරීම.

3. 2016 වසර අවසානය වනවිට ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස ප්‍රචලිත කිරීම සඳහා සංචාරකයන් අඛන්ඩව රැඳී සිටීම දිරිගැන්වීමට සාමාන්‍යයෙන් දින 10 ක් සඳහා ඉලක්කගත සංචාරක පැකේජ හඳුන්වාදීම.

4. 2016 වනවිට උපායමාර්ගික වශයෙන් ශ්‍රී ලංකා සන්නාම වටිනාකම ඩොලර් බිලියන 80 දක්වා ඉහළ නැංවීම සඳහා සංස්කෘතික, ඓතිහාසික, ආගමික හා පාරිසරික සංචාර කර්මාන්තය අවධාරණය කරමින් අලෙවිකරණ වැඩසටහන පෙන්වීම.

5. 2016 වසර අවසානය වනවිට තිරසාර සංවර්ධනය මගින් සංචාරක ආදායම ඩොලර් බිලියන 3.6 දක්වා ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳාම් සහ ව්‍යාපාර සමඟ සබඳතා හා මූල්‍යපාතික සන්ධාන සැලසුම් කිරීම, නිෂ්පාදන මිශ්‍රණ නවීකරණය / ප්‍රවර්ධනය කිරීම.

### සමස්ත සංචාරක පැමිණීමේ වර්ධන වේගය - 2013 සිට 2016 දක්වා

2016 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට සංචාරකයින් 2,050,832 ක් පැමිණ ඇති අතර එය වසරකට 14.0% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2015 වසර අවසන් පැමිණීම 1,798,380 කි. වැඩිම සංචාරකයින්ගේ පැමිණීම වාර්තා වූයේ පසුගිය දෙසැම්බර් මාසයේදීය. එය 224,791 කි. එනම් එය පසුගිය වසරට සාපේක්ෂව 9.1% ක වර්ධනයකි. ඉහළම පැමිණීම වාර්තාවූ ගමනාන්තයන් වූයේ ඉන්දියාව, චීනය සහ යුරෝපයයි.



| 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|
| වෙළඳ කලාපය | සමස්ත පැමිණීම් | ප්‍රතිශත | වෙළඳ කලාපය | සමස්ත පැමිණීම් | ප්‍රතිශත |
| ඉන්දියාව | 316,247 | 17.59 | ඉන්දියාව | 356,729 | 17.39 |
| චීනය | 214,783 | 11.94 | චීනය | 271,577 | 13.24 |
| එක්සත් රාජධානිය | 161,845 | 9.00 | එක්සත් රාජධානිය | 188,159 | 9.17 |
| ජර්මනිය | 115,868 | 6.44 | ජර්මනිය | 133,275 | 6.50 |
| මාලදිවයින | 90,617 | 4.79 | මාලදිවයිනේ | 96,440 | 4.70 |
| ප්‍රංශය | 86,126 | 5.04 | ප්‍රංශය | 95,167 | 4.64 |
| ඕස්ට්‍රේලියාව | 63,554 | 3.53 | ඕස්ට්‍රේලියාව | 74,496 | 3.63 |
| රුසියාව | 61,846 | 3.44 | රුසියාව | 58,176 | 2.84 |
| ඇමරිකාව | 47,211 | 2.63 | ඇමරිකාව | 54,254 | 2.65 |
| ජපානය | 39,358 | 2.10 | ජපානය | 44,122 | 2.15 |
| එකතුව | 1,197,455 | 66.58 | එකතුව | 1,372,395 | 66.92 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ප්‍රධාන ප්‍රභව ස්ථාන 10 විශ්ලේෂණයෙන් පිළිබිඹු වන්නේ ඉන්දියාව රටට ප්‍රමුඛතම සංචාරක නිෂ්පාදකයෙකු වන බවයි. 2016 වන විට දෙවන විශාලතම සංචාරක සපයන්නා වන්නේ චීනයයි. සමාලෝචිත වර්ෂය තුළ මෙරටට පැමිණි මුළු සංචාරක ප්‍රමාණයෙන් තුනෙන් එකක කොටසක් ඉන්දියාව හා චීනයට අත් විය.

මුළු සංචාරක සංඛ්‍යාවෙන් 9.17% ක් වාර්තා කරන එක්සත් රාජධානිය සංචාරක කර්මාන්තයේ තුන් වැනි ප්‍රධාන ප්‍රභවය බවට පත්ව තිබේ. 2015 දී හය වන ස්ථානයේ සිටි ප්‍රංශය 2016 දී පස් වන ස්ථානය හිමි කරගත්තේය. 2016 දී මාලදිවයින හය වන ස්ථානයට පත් වූයේ 2015 දී පස් වන ස්ථානයේ සිටය. ඕස්ට්‍රේලියාව, රුසියාව, ඇමෙරිකා එ. ජනපදය පිළිවෙලින් හත් වන, අට වන හා නව වන ස්ථානයේ 2016 දී පැවතුනි. ජපානය ඉහළම ශ්‍රේණිගත ලැයිස්තුවෙන් ඉවත් ව තිබේ. 2016 වන විට මුළු සංචාරකයින්ගේ සංචාරක ආදායමෙන් සියයට 66.92 ක්ම වෙළඳපොලේ ප්‍රමුඛතම සමාගම් දහය විසින් වාර්තා කරන ලදී. මෙය පසුගිය වසරට සාපේක්ෂව 0.34% ක සුළු වර්ධන තත්වයකි.

## සංචාරක ව්‍යාපාර සඳහා වෙළඳ ප්‍රදර්ශන / මාර්ග ප්‍රදර්ශන, රටෙහි සුවිශේෂී ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ සහායක මෙහෙයුම් හා අනුග්‍රහය

2016 වර්ෂයේ ආදායම් සංඛ්‍යා ලේඛනවලට අනුව, විවේක ගැනීමේ අරමුණ සඳහා ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගෙන් ලැබුණු ආදායම අනුව එක් එක් කලාපයට පහත දැක්වෙන ශ්‍රේණිගත කිරීම ලබා දෙයි.

| කලාප | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| බටහිර යුරෝපය | 1 |
| දකුණු ආසියාව | 2 |
| නැගෙනහිර ආසියාව | 3 |
| මැද පෙරදිග | 4 |
| නැගෙනහිර යුරෝපය | 5 |
| උතුරු ඇමරිකාව | 6 |
| ඕස්ට්‍රේලේසියාව | 7 |
| අප්‍රිකාව | 8 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් | 9 |

## බටහිර යුරෝපය

බටහිර යුරෝපයේ අංක 01 ලෙස ශ්‍රී ලංකා සංචාරකයින් සඳහා ආදායම් උත්පාදන කලාපය පහත පරිදි හැඩ ගැසෙනු ඇත.

| කලාපිය නම | බටහිර යුරෝපය |
|---|---|
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 51% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 5 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| නිවාඩු කාලය පැමිණිම මගින් ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| විවේක සංචාරකයන් 2015 | 410,709 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| සම්පූර්ණ පැමිණිම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| සමස්ත පැමිණිම ශ්‍රේණිගත කිරීම 2015 | 552,442 |
| දිනකට වැය වූ මුදල (එ.ජ. ඩොලර්) 2015 | 163 |
| ගතවන කාලය (දින) | 14 |
| විවේක සංචාරකයන් විසින් ආදායම (ඇ. ඩො.) 2015 | 957,770,557 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 1,288,290,936 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

විශ්ලේෂණයට අනුව, පහත සඳහන් පරිදි ඉහලම ආදායම් ප්‍රභවයන් 15 යටතේ ලැයිස්තු ගතකර ඇති බටහිර යුරෝපීය කලාපයේ රටවල් 06.

| පදිංචි රට | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| එක්සත් රාජධානිය | 2 |
| ජර්මනිය | 3 |
| ප්‍රංශය | 4 |
| නෙදර්ලන්තය | 6 |
| ස්වීඩනය | 14 |
| ඉතාලිය | 15 |
| ඩෙන්මාර්කය | 16 |
| ස්විට්සර්ලන්තය | 17 |
| ඔස්ට්‍රියාව | 18 |
| වෙනත් (බටහිර යුරෝපය) | 20 |
| ස්පාඤ්ඤය | 21 |
| බෙල්ජියම | 23 |
| නෝර්වේ | 32 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## එක්සත් රාජධානිය (United Kingdom-

| රට | එක්සත් රාජධානිය |
|---|---|
| භාෂාව | ඉංග්‍රීසි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 36% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 28 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| විවේක සංචාරකයන් 2015 | 103,001 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| සමස්ත පැමිණීම් 2015 | 161,845 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 187 |
| නිවාඩු කාලය (දින) 2015 | 15 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 283,533,119 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 445,514,292 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 වර්ෂය තුළ පහත දැක්වෙන ප්‍රවර්ධන වැඩසටහන් එක්සත් රාජධානියේ පවත්වන ලදී.

## ලෝක සංචාරක වෙළඳපොල :WTM- 2016

සංචාරක කර්මාන්තයේ ප්‍රධාන පෙළේ උත්සවයක් වන 37 වන ලෝක සංචාරක වෙළෙඳපොළ 2016 නොවැම්බර් පළමුවන සතියේ ලන්ඩනයේ “එක්සෙල්” ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී ඇරඹිනි. මෙය ලෝක ගමන් හා සංචාරක කර්මාන්තය සඳහා ප්‍රමුඛතම තෙදින ව්‍යාපාර - ව්‍යාපාර (B2B) ප්‍රදර්ශනයයි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB- 2017 වර්ෂය හා ඉන් අනතුරුව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ සංචාරක ව්‍යාපාරයේ අනාගත වර්ධනය සඳහා ප්‍රධාන පණිවුඩ හුවමාරු කරගැනීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ හවුල්කරුවන් 61 දෙනෙකු සමග ඒකාබද්ධව සහභාගි විය. මෙවර WTM ප්‍රදර්ශනය සඳහා සූදානම් කිරීමේදී සැලකිය යුතු වෑයමක් දැරීමට සිදු විය.



ප්‍රධාන තේමාව ලෙස “වෙරළ හා වනජීවී” හා දර්ශනය, සාරධර්ම, උරුමය, අභිමානය, ප්‍රීතිය උපතේමාවන් සහිතව මෙම වසරේ WTM දර්ශනය සුවිශේෂී මාධ්‍ය ව්‍යාපාර, සම්මුඛ සාකච්ඡා සහ උසස් ප්‍රාරම්භක රෑ ස්වීම් සහිත අමාත්‍ය මණ්ඩල සමුළුවට වෙනත් රටවල අමාත්‍යවරුන් සමග අපේ සභාපතිතුමා සහභාගීවී සිටියේ ජාලගත කිරීමේ අවස්ථාවක් ලෙස සලකමිනි.






## එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා බාහිර වෙළඳ ප්‍රචාරණය - 2016 දෙසැම්බර් 5 සිට 18 දක්වා

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එක්සත් රාජධානියේ සංචාරකයින් අතර වෙළෙඳ සන්නාම දැනුවත් කිරීම සඳහා WTM ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉතා ආකර්ශනීය එළිමහන් දැන්වීම් ප්‍රචාරණ වැඩසටහනක් පැවැත්වීය. මෙම ව්‍යාපාරය එහි පහත සඳහන් ස්ථානවල ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ප්‍රදේශ තුල පවත්වන ලදී.

| Station | Tube Line | Bound | Platform Number | Design |
|---|---|---|---|---|
| Baker Street | Jubilee Line | Northbound | Platform 10 | Dumbulla Cave |
| Bank | Northern Line | Southbound | Platform 3 | Water Rafting |
| Bank | Central Line | Westbound | Platform 5 | Elephants |
| Bank | Waterloo & City Line | | Platform 8 | Spa |
| Bond Street | Central Line | Westbound | Platform 1 | Water Rafting |
| Covent Garden | Piccadilly Line | Eastbound | Platform 2 | Surfer |
| Green Park | Victoria Line | Southbound | Platform 4 | Tea Plantation |
| Holborn | Central Line | Westbound | Platform 1 | Leopard |
| Holborn | Central Line | Eastbound | Platform 2 | Rock |
| Knightsbridge | Piccadilly Line | Eastbound | Platform 1 | Dumbulla Cave |
| Leicester Square | Piccadilly Line | Westbound | Platform 1 | Tea Plantation |
| Leicester Square | Northern Line | Southbound | Platform 3 | Elephants |
| Leicester Square | Northern Line | Northbound | Platform 4 | Spa |
| Oxford Circus | Central Line | Westbound | Platform 1 | Water Rafting |
| Oxford Circus | Bakerloo Line | Southbound | Platform 3 | Dumbulla Cave |
| Oxford Circus | Victoria Line | Northbound | Platform 6 | Surfer |
| Tottenham Court Road | Central Line | Eastbound | Platform 2 | Tea Plantation |
| Tottenham Court Road | Northern Line | Northbound | Platform 3 | Leopard |

ස්ථානයේ නම : Holborn



ස්ථානයේ නම : Tottenham Court Road




## ප්‍රදර්ශන මධ්‍යස්ථානය බර්මින්හැම් - 2016 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 2 දක්වා

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය NEC - Birmingham හි ජාතික විවාහ මංගල්‍ය ප්‍රදර්ශනයට සහභාගි වූයේ "ආසියාවේ ආශ්චර්ය" යන ප්‍රතිරූපය, ප්‍රදර්ශනය කරමින් අපි මනාල යුවලයන් හා ඔවුන්ගේ පවුල් මුණගැසුණේ මංගල උත්සව හා මධුසමය සඳහා අප රට පිළිබඳ පුළුල් වැටහීමක් ලබා දෙමිනි. එක්සත් රාජධානියේ වෙළෙඳපොළ තුළ මංගල උත්සව සහ මධුසම චාරිකාවාන් සඳහා විශාල හැකියාවන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් හඳුනාගෙන ඇත. එය ප්‍රවර්ධනය කිරීම සඳහා උත්සව අවස්ථා දෙකක් සංවිධානය විය. ජාතික මනාලියන් සඟරා, පුවත්පත් සහ අනාගත ක්‍රමෝපායන් පිළිබඳව කලාපීය මාධ්‍යයන් සමග රැස්වීම් හා සාකච්ඡා අපගේ සහභාගිත්වයේ ප්‍රධාන අරමුණ විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වෙළඳ සහකරුවන් සහ සඟරා සමග ද රැස්වීම් පැවැත්වීය.






### එක්සත් රාජධානියේ වෙළඳපළ තුළ සඟරා පිළිබඳ දැන්වීම් ප්‍රචාරය

"BBC wildlife" විසින් ශ්‍රී ලංකාවේ අලින්, වලසුන් සහ දිවියන් පිළිබඳ සම්පූර්ණ පිටුවක වාර්තාවක් ගෙන එන ලදී. එක්සත් රාජධානියේ විශාලතම සංචාරක සංවිධානය වන සංචාරක නියෝජිතයින් සහ සංචාර මෙහෙයවන්නන් නියෝජනය කරන ABTA ආයතනය ”වනජීවී, තේ සහ සංස්කෘතිය යන තේමාව යටතේ 2016 දී ගමන් කිරීමේ ප්‍රවණතා පිළිබඳව වැඩි විස්තර දැන ගැනීම සඳහා සංස්කෘතිය පිළිබඳ සම්පූර්ණ පිටුවක් ප්‍රචාරය කර තිබේ.




එක්සත් රාජධානියේ ප්‍රධාන පෙළේ සඟරාවක් වන ”ASTA" සඟරාව 2016 දී පැමිණීමට නියමිත හොඳම ගමනාන්ත 10 අතුරින් එකක් ලෙස ශ්‍රී ලංකාව ලෙස ප්‍රසිද්ධ කරමින් පූර්ණ පිටුවක් ගෙන ඒම ශ්‍රී ලංකාවට මෑතකදී ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිය. “Good Things Magazine/ Hale & Bowdon/ Media City / DIDSBURY / SAPORK" විසින් එක්සත් රාජධානිය තුල ශ්‍රී ලංකාව පිළිබඳ දැන්වීම් ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී. වනජීවින්, විලාසිතා, තේ සහ සූර්යාලෝකය කෙරෙහි උනන්දුවක් දක්වන එක්සත් රාජධානියේ සංචාරකයින් මෙම සඟරා හරහා ආකර්ෂණය වූහ.




2016 දී සංචාරක අවශ්‍යතා දැන ගැනීමට අපේක්ෂා කරන පරිදි ABTA හි සංචාරක ප්‍රවනතා (Travel Trends) නම් වාර්තාවේ ගමනාන්ත 12 ක් හුවා දැක්විය. එහි ශ්‍රී ලංකාව 12 වන ගමනාන්ත ස්ථානයට පත්විය.




### එක්සත් රාජධානියේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් පසුගියදා ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් රාජධානියේ උපාධි අපේක්ෂක සිසුන් 30 දෙනෙකු සඳහා ශ්‍රී ලංකාව පිළිබඳව විස්තරාත්මක සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ දී පැවැත්වුනි.



### එක්සත් රාජධානියේ සුළු නියෝජිතයින් පුහුණු කිරිම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකාවේ සංචාරක ස්ථාන පිළිබඳව දැනුවත් කිරීමට අදාළව සුළු නියෝජිතයන් 35 කට අධික ප්‍රමාණයක් පුහුණු කර ඇත.





## ඩබ්ලින් නිවාඩු සංදර්ශනය, අයර්ලන්තය

අයර්ලන්ත සංචාරකයින් ඉලක්ක කරමින් ඩබ්ලින් හි මෙම ප්‍රවර්ධන වැඩසටහන පැවැත්විනි. ඩබ්ලින් පාරිභෝගික ප්‍රදර්ශනයට සහභාගිවීම මගින් මෙරට පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර අයර්ලන්ත සංචාරකයන් 41,000 කට වැඩි පිරිසකට ආමන්ත්‍රණය කිරීමට අපට හැකි විය. මෙම ප්‍රදර්ශනය සඳහා සංචාරකයන් සහ සංචාරක වෘත්තිකයින් 775 කට ආසන්න සංඛ්‍යාවක් විවිධ රටවල් / සංචාරක මණ්ඩල 103 කට වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරමින් සහභාගී විය. මෙම වසරේ ජනවාරි නිවාඩු සමයේදී වෙළඳ හා මහජන ප්‍රදර්ශනය සඳහා අමුත්තන් 41,900 ක් හා ප්‍රදර්ශකයින් 541 දෙනෙකු සහභාගී වූහ.





## ගමනාන්ත සංචාරක සංදර්ශනය, ලන්ඩන්

මෙය ලන්ඩන් නුවර සංචාරයේ නියුතු සංචාරකයින් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාව සහභාගිවන වාර්ෂික උත්සවයකි.



## ටෙලිග්‍රාෆ් එළිමහන් වික්‍රමාන්විත සහ සංචාරක සංදර්ශනය

මෙම වසරේ පැමිණීම අනුව සංවිධායකයන් පවසන පරිදි සාමාන්‍ය වයස අවුරුදු 58 ක් වූ පිරිමි ප්‍රතිශතය 55% ක් හා ස්ත්‍රී 45% ක් ලෙස සංචාරකයන් 5 දෙනෙකුට ආසන්න වශයෙන් 4 ක් පමණ ප්‍රදර්ශනය නැරඹීමෙන් පසුව සංචාරය කිරීමට සැලසුම් කර තිබේ.



## විවාහ මංගල සංදර්ශනය - ලන්ඩන්

මංගල සහ මධුසමය පිළිබඳ උනන්දුවක් දක්වන එක්සත් රාජධානියේ විදෙස් සංචාරකයන් ඉලක්ක කරගෙන පවත්වනු ලැබූ විවාහ මංගල ප්‍රදර්ශනය ලන්ඩන් නගරයේ දී සාර්ථක ලෙස පවත්වනු ලැබීය.

එක්සත් රාජධානියේ විශාලතම "Bridal Catwalk" ප්‍රදර්ශනය, ප්‍රමුඛ දේශීය නිර්මාණකරුවන් හා සාමාන්‍ය තලයේ නිර්මාණකරුවන් සඳහා 2016 වසරේ ලන්ඩන් නුවරදී නවීන ප්‍රවණතා ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා කර දෙන ලදී. විවිධ මංගල කටයුතු නිපුනයන් විසින් පවත්වන ලද මංගල රඟහල සැසි සංචාරකයන් අමන්දානන්දයට පත් කිරීමට සමත් වූයේ වේදිකා සජීවී විකාශන සඳහා සහභාගී වීමට ප්‍රේක්ෂකයන් අතරින් සාමාජිකයන් තෝරා ගැනීමෙනි. එය ප්‍රවීණයන් සමඟ අන්නෝන්‍ය සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා ප්‍රේක්ෂකයන් අද්විතීය අවස්ථාවක් විය. මෙම ප්‍රදර්ශනය ප්‍රමුඛ පෙළේ වෙළඳ සන්නාමයන් වන "Debenhams" Ivory & Co" Moss Bros and Allure Bridals" වෙතට ආකර්ෂණය විය. සිල්ලර වෙළඳුන් සහ ප්‍රමුඛ පෙළේ මංගල සැපයුම්කරුවන් විසින් පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවාවන් රැසක් එකම ස්ථානයකින් ඔවුන්ගේ අතිවිශේෂිත මොහොත සඳහා ඇණවුම් කිරීමට සහ මිලදී ගැනීමට මෙම ප්‍රදර්ශනය කදිම තෝතැන්නක් විය.

## ටෙලිග්‍රාෆ් සංචාරක සංදර්ශනය






## එක්සත් රාජධානියේ ක්‍රිකට් ප්‍රචලිත කිරීම

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ එක්සත් රාජධානියේ සංචාරය ප්‍රවර්ධනය ක්‍රිකට් රසිකයන් / උනන්දුවක් දක්වන්නන් ඉලක්ක කර ගනිමින් 2016 ජූනි 04 සිට 2016 ජූලි 02 දක්වා පැවැත්විනි.

ජූනි 4 දිනත් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සමඟ පවුල් විනෝද දිනය ජූනි 5 දින පැවැත්විනි. London Oval - Kia Oval ක්‍රිකට් පිටිය - එක් දින තරගය - ජූනි 29 / Cardiff - Cardiff ක්‍රිකට් ක්‍රීඩාංගනය - එක් දින තරගය - ජූලි 02 ක්‍රිකට් ආධාර දිවා ආහාරය Lord's ක්‍රීඩාංග නය දීර්ග කාමරය තුල දියත් කිරීම - ජූනි 4 / එක්සත් රාජධානියේ ඩයස්පෝරාව - ක්‍රිකට් කණ්ඩායමේ පවුල් විනෝද දිනය - 5 වනදා ජූනි.



## ආසියානු ගෘහනිර්මාණ හා කලා සල්පිල

එක්සත් රාජධානියේ උනන්දුවක් දක්වන සංචාරකයින් ඉලක්ක කරගත් මෙය 2016 මාර්තු 03 සිට 6 වැනිදා දක්වා "London Asia House Design" හි දී පවත්වන ලදී. මේ වසරේ ආසියා ගෘහනිර්මාණ සහ කලා සල්පිල ශ්‍රී ලංකා බීරළු, ලේස් හා අතින් නිමැවූ වෙනත් නිෂ්පාදන වල විශිෂ්ට තේරීමක් සහිතව ලන්ඩනයේ ආසියා හවුස් හි 2016 මාර්තු 3 සිට 6 දක්වා වෙළඳ ප්‍රදර්ශනය පවත්වන ලදී. ආසියා හවුස් යනු ලන්ඩන් සංස්කෘතික මධ්‍යස්ථානයට අනුබද්ධ කොටසකි.

ආසියානු කලාවන් ගවේෂණය කිරීම, දැන ගැනීම සහ විනෝදවීමට අවස්ථාව ලබාදීම සඳහා සුවිශේෂී අවස්ථා තෝරාගැනීමේ වාර්ෂික සිදුවීම් 100 කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කරයි. ආසියාවේ හා මැදපෙරදිග විසිරී සිටින ප්‍රදර්ශකයින් 30 කට අධික ප්‍රමාණයක් එක් වෙමින් ප්‍රදර්ශනය කරන ලද හොඳම සහ අතිශයින්ම විශිෂ්ට භාණ්ඩ පෙළක් එළිදැක්විණි.







### එක්සත් රාජධානියේ 68 වනි ශ්‍රී ලංකා නිදහස් දින සැමරුම

වැඩබලන මහකොමසාරිස් සුගීෂ්වර ගුණරත්න මහතා විසින් පෙබරවාරි 5 වන දින ශ්‍රී ලංකාව පිළිබඳ උනන්දුවක් දක්වන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන්, සභා මන්ත්‍රීවරුන්, පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්යාලය සහ විදේශ නියෝජිතයින්, ලන්ඩනයේ ජාත්‍යන්තර සංවිධාන, නගරාධිපතිවරු සහ සභා මන්ත්‍රීවරුන්, විද්වතුන් සහ ව්‍යාපාරික ප්‍රජාව සඳහා පිළිගැනීමේ උත්සවයක් පවත්වන ලදී.





### ZEST මාධ්‍ය සමූහය, ට්‍රැවල් එක්ස්ට්‍රාර්, ස්වාධීන පුවත් සහ මාධ්‍ය, සංචාරක මැගසින් අලෙවි ඩේලි එක්ස්ප්‍රස් / සන්ඩේ එක්ස්ප්‍රස්

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මාධ්‍ය දැනුවත් කිරීමේ සංචාරයක් ZEST මාධ්‍ය සමූහය, ට්‍රැවල් එක්ස්ට්‍රා, ස්වාධීන පුවත් සහ මාධ්‍ය, සංචාරක සඟරා අලෙවිය, ඩේයිලි එක්ස්ප්‍රස් / සන්ඩේ එක්ස්ප්‍රස් සඳහා 2016 නොවැම්බර් 18 සිට 22 දක්වා බාහිර මාධ්‍යවේදී වැඩසටහන යටතේ දියත් කෙරිනි. එහි මාධ්‍යකරුවන් පස් දෙනෙකු විසින් කොළඹ, නුවර, හම්බන්තොට, ගාල්ල, බෙන්තොට යනාදී සංචාරක ස්ථාන තම සංචාරයේදී නරඹන ලදී. ZEST මාධ්‍ය සමූහය, ට්‍රැවල් එක්ස්ට්‍රා, ස්වාධීන පුවත් සහ මාධ්‍ය, සංචාරක මැගසින් විකිණීම, ඩේයිලි එක්ස්ප්‍රස් / සන්ඩේ එක්ස්ප්‍රස්" ලිපි සකස් කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය ජාතික සංචාරකයන් ඉලක්ක කරගත් වැඩසටහන 2015 මාර්තු මසදී ZEST මාධ්‍ය සමූහය, ට්‍රැවල් එක්ස්ට්‍රා, ස්වාධීන පුවත් සහ මාධ්‍ය, සංචාරක මැගසින් විකිණීම, ඩේලි එක්ස්ප්‍රස්/ සන්ඩේ එක්ස්ප්‍රස් හරහා ප්‍රකාශයට පත්කෙරේ.

### නැගෙනහිර දෛනික මාධ්‍ය සහ නෝර්වේ සැන්දෑ පුවත්, ජ්ලැනට් ඇප්පීට්ටි

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මාධ්‍ය හුරුකරවීමේ සංචාරයක් "ඊස්ටර්න් ඩේලි ප්‍රස්" සහ

නෝර්වේ සැන්දෑ පුවත්, Planet Appetite" සඳහා 2016 නොවැම්බර් 01 සිට 08 දක්වා බාහිර ජනමාධ්‍යවේදී වැඩසටහන යටතේ දියත් කළේය. එහි මාධ්‍යකරුවන් 3 දෙනෙකු කොළඹ, ගාල්ල, නුවරඑළිය, මහනුවර, සීගිරිය, දඹුල්ල, පාසිකුඩා යන ප්‍රදේශ ආවරණය කරමින් දිවයිනේ සංචාරය කෙරිනි. බ්‍රිතාන්‍යය ජාතික සංචාරකයන් ඉලක්ක කර "ඊස්ටර්න් ඩේලි ප්රෙස්" සහ නෝර්වේ සැන්දෑ පුවත්, ප්ලැනට් ඇප්පීටිට්" ලිපි පලවීමට නියමිත අතර වැඩසටහන 2017 ජනවාරි දී "ඊස්ටර්න් ඩේලි ප්රෙස්" සහ නෝර්වේ සැන්දෑ පුවත්, ප්ලැනට් ඇප්පීටිට් හරහා ප්‍රකාශයට පත් කෙරේ.

## ද වොෂින්ටන් ටයිම්ස්, ෆෝබ්ස් සඟරාව




ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මාධ්‍ය දැනුවත් කිරීමේ සංචාරයක් "ද වොෂින්ටන් ටයිම්ස්, ෆෝබ්ස් සඟරාව" සඳහා 2016 ජනවාරි 19 සිට 30 දක්වා බාහිර මාධ්‍යවේදී වැඩසටහන යටතේ සිදු කෙරිනි. එහි මාධ්‍යකරුවන් දෙදෙනෙකු කොළඹ, අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල, සීගිරිය, මහනුවර, පින්නවල, කොග්ගල, යාල, තංගල්ල, දික්වැල්ල, රූමස්සල යනාදී අයස්කාන්ත ප්‍රදේශ නරඹන ලදී. "ද වොෂින්ටන් ටයිම්ස්, ෆෝබ්ස් සඟරාව" පිටු 2 ක දිගු වෙබ් ලිපි සකස් කරනු ලබන්නේ ඇමරිකානු එක්සත් ජනපද සංචාරකයන් ඉලක්ක කරගෙන සහ වැඩසටහන පෙබරවාරි 2016 දී, "ද වොෂින්ටන් ටයිම්ස්, ෆෝබ්ස" සඟරාව හරහා ප්‍රකාශයට පත් කෙරුණි. ඇමරිකානු එක්සත් ජනපදයේ ප්‍රධාන සඟරාවක් වන "ද වොෂින්ටන් ටයිම්ස්, ෆෝබ්ස් සඟරාව" ආසන්න වශයෙන් මිලියන 4.3 ක පාඨක පිරිසක් අතරට පත්වුනි (මාසිකව).

## ජාත්‍යන්තර මාධ්‍ය කණ්ඩායම් (සහභාගීත්වය UNWTO සමුළුව)




ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මාධ්‍ය හුරු කරවීමේ සංචාරයක් "Agencia EFE News Portala" El Pais" Pro Travel Magazine සඟරාව සඳහා 2016 ජූලි 9 සිට 15 දක්වා ආගන්තුක මාධ්‍යවේදී වැඩසටහන යටතේ පැවැත්විනි. ඒ සඳහා එහි මාධ්‍යවේදීන් 3 දෙනෙකු කොළඹ නගරය, මහනුවර ප්‍රදේශය, පින්නවල අලි අනාථාගාරය, පාසිකුඩා වෙරළ අඩවි, ත්‍රිකුණාමලය යනාදී සංචාරක ප්‍රදේශ නරඹන ලදී. "Agencia EFE" Planeta Futuro" Sri Lanka through Fresh eyeKs යන පිටු 5-6 කින් යුත් ලිපි එක්සත් රාජධානිය, ස්පාඤ්ඤ ජාතික සංචාරකයන් ඉලක්ක කර 2016 දෙසැම්බර් මස Agencia EFE News Portala" El Pais" Pro Travel Magazine සඟරාව හරහා ප්‍රකාශයට පත් කෙරුණි. එක්සත් රාජධානිය, ස්පාඤ්ඤ ජාතිකයන් අතර ප්‍රචලිත ප්‍රධාන සඟරාවක් වන Agencia EFE News Portala" El Pais" Pro Travel Magazine සඟරාව ආසන්න වශයෙන් 77,000 ක පාඨක පිරිසක් අතරට පත් වන්නකි (මාසිකව).

## ජර්මනිය

| | |
|---|---|
| පදිංචි රට | ජර්මනිය |
| භාෂාව | ජර්මන් |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 55% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 16 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| නිවාඩු කාලය පැමිණීම මගින් ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| විවේක සංචාරකයන් 2015 | 88,895 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| සම්පූර්ණ පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 115,868 |
| දිනකට වැය වූ මුදල (එ.ජ. ඩොලර්) 2015 | 140 |
| ගතවන කාලය (දින) | 15 |
| විවේක සංචාරකයන් විසින් ආදායම (ඇ. ඩො.) 2015 | 188,165,647 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 245,259,881 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### 2016 ITB ජර්මනිය

50 වැනි වතාවටත් පැවැත්වන ITB බර්ලින උත්සවය අන් කවරදාකටත් වඩා 2016 මාර්තු මස 9 සිට 13 දක්වා උත්කර්ෂවත්ව පැවැත්විනි. රටවල් හා කලාප 187 ක් නියෝජනය කරමින් ප්‍රදර්ශන සමාගම් 10,000 කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රදර්ශන කුටි 26 ක් තුල ව්‍යාපාරික සංචාරකයන් 120,000 දෙනෙකුගේ හමුවීම සිදු විය. නිවාඩු දින ගමනාන්තයන් සහ නව ගමනාන්තයන් හා ගමන් පහසුකම් පිළිබඳව සොයා බැලීමට සති අන්තයේදී ITB බර්ලින් වෙත 60,000 ක සාමාන්‍ය ජනතාවක් සහභාගී විය.








### ජර්මන් රාජ්‍ය සංචාරය තුල සංචාරක ප්‍රවර්ධනය, ආහාර හා සංචාරක ප්‍රචලිත කිරීම්

බර්ලින්හි හා පළාත් අගනගරයෙහි ඉහළ මට්ටමේ ව්‍යාපාරික සබඳතා තරකිරීමේ අවස්ථා දෙකක් සංවිධානය කිරීම හා ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා ෆෙඩරල් චාන්සලර්වරයා, එරට ජනාධිපති, පාර්ලිමේන්තුවේ සභාපති, ප්‍රතිපත්ති සම්පාදකයින් සමග සහයෝගයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන - කාර්යාංශය කටයුතු කළේය. ශ්‍රී ලංකා සංචාරක

කර්මාන්තය පිවිසුම් දොරටුව අසල ප්‍රදර්ශනය කිරීම සඳහා සංචාරක තේමාවන් 8 කින් යුත් ලංකාවේ සංචාරකයන්ගේ ආකර්ෂණීය බැනර් ප්‍රදර්ශනය කෙරිනි. සහභාගිවන්නන් තුල කියවීමේ රුචිය වෙනුවෙන් ශ්‍රී ලංකා සමරු පොත්, ආර්ථික සංසදය පිළිබඳ සංචාරක ප්‍රවර්ධන ද්‍රව්‍යයන් එක් එක් මේසය වෙත (ජර්මන්/ ඉංග්‍රීසි භාෂා) බෙදා දෙනු ලැබීය.





**ජර්මනියේ බර්ලින් හි සංස්කෘතික සැණකෙළියේ ශ්‍රී ලංකා නියෝජනය**

ශ්‍රී ලංකා සංගමය බර්ලින් (SLAB) ශ්‍රී ලංකාව නියෝජනය කලේ වටිනා උරුමය සහ සංස්කෘතිය නිරූපණය කරන නර්තන ශිල්පීන් සමග බර්ලිනයේ වීදි කම්පනය කරවන සුළු කන්කළු රිද්මයානුකූල නර්තන සමගය. මෙම වැඩසටහන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් බර්ලින් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් පැවැත්විනි.






**ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධන අමාත්‍යාංශය මගින් ජර්මානු රාජ්‍ය දින පැවති පාරිභෝගික ප්‍රවර්ධනය**

2016 අගෝස්තු 28 දින පවත්වන ලද රාජ්‍ය දිනයට ශ්‍රී ලංකාව එක් විය. මෙය සංවිධානය කරන ලද්දේ ආර්ථික සංස්ථා සහ සංවර්ධන (BMZ) ෆෙඩරල් අමාත්‍යාංශය විසිනි. ප්‍රධාන වේදිකාව තුල සංස්කෘතික ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාව විසින් සංවිධානය කෙරිනි. පාරිභෝගික දැනුවත් කිරීම වර්ධනය කිරීම සඳහා සංචාරක ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ තෑගි බෙදාදීම සිදු කෙරිණි. අමුත්තන්හට ශ්‍රී ලංකීය තේ වලින් මෙම අවස්ථාවේ සංග්‍රහ කෙරිනි.





## ව්‍යාපාර හුරුකිරීමේ සංචාරය

කණ්ඩායමට ගුවන් ටිකට්පත් සඳහා අනුග්‍රහය දැක්වූ ඕමාන් එයාර් හි නියෝජිතයන් ඇතුළුව ප්‍රධාන ජර්මානු සංචාර මෙහෙයුම්කරුවන් 10 දෙනෙකු සඳහා ව්‍යාපාර හුරු කිරීමේ සංචාරයක් සංවිධානය කරන ලදී. මෙම කණ්ඩායම 2016 ඔක්තෝබර් 6 වනදා සිට ඔක්තෝබර් 10 වන දින දක්වා දිවයිනේ ගත කළහ. සීගිරි බලකොටුව, දළදා මාලිගාව, මින්නේරිය ජාතික සෆාරි උද්‍යානය සහ ශ්‍රී ලංකාවේ ආයුර්වේද නිවාඩු නිකේතනයේ ඔවුන් සංචාරය කර ඇත. ජර්මානු සංචාර මෙහෙයවන්නන් 10 දෙනා සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය හෙළි කිරීමට මෙමගින් අවස්ථාව ලැබුණු අතර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සාමාජිකයින්ට B2B සැසිය සඳහා සහභාගී වීමට ද අවස්ථාවක් ලැබුණි. සංචාරක ආයතන 26 ක් B 2 B සැසිය සඳහා සහභාගී විය.





## ෆ්‍රැන්ක්ෆර්ට් මිෂන් සංවිධානය කළ ශ්‍රී ලංකා සැඳෑව

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ආහාරපාන, ශ්‍රී ලංකා සංචාරක වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කිරීම, ශ්‍රී ලංකා සමරු භාණ්ඩ ප්‍රවර්ධන කිරීම ආදී වැඩසටහන් ඇතුළත් සිසුන් 50 ක (කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය හදාරන) පිරිසක් අතර සිදු කෙරිනි. ශ්‍රී ලාංකේය සංස්කෘතිය පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීම මෙහි අරමුණ විය. ශ්‍රී ලංකාවේ කාබනික ගොවිතැන පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ උනන්දුවක් ඇති වී තිබේ.






## DOCMA රූපවාහිනීය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 ජූලි 13 සිට 24 දින දක්වා ඩොක්මා ටී. වී මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාව පවත්වන ලදී. එහි මාධ්‍යකරුවන් 6 දෙනෙකු කොළඹ, පින්නවල අලි අනාථාගාරය, කෑගල්ලේ මිලේනියම් ව්‍යාපෘතිය, දළදා මාලිගාව, තිස්සමහාරාමය, වස්ගමුව ජාතික වනෝද්‍යානය, මිරිස්ස, උඩවලව ජාතික උද්‍යානය යනාදී අයස්කාන්ත ප්‍රදේශ ආවරණය කරමින් තම සංචාරයේදී නරඹන ලදී. "එල්ස්ටර්න්ස් රීසින්" නම් විනාඩි 90 ක දිගු චිත්‍රපට වාර්තාවක් සකස් කරනු ලබන්නේ ජර්මානු ජාතික සංචාරකයන් ඉලක්ක කරගෙන වන අතර එම වැඩසටහන 2016 දෙසැම්බර් දී ඩෝක්මා ටී. වී හරහා විකාශය කෙරුණි. ජර්මනියේ ප්‍රධාන පෙළේ නාලිකාව වන DOCMA TV ආසන්න වශයෙන් මිලියන 1.5 ක ජනතාව අතරට මෙය සම්ප්‍රේෂණයවිණි (වසරකට).

## ප්‍රංශය

| | |
|---|---|
| පදිංචි රට | ප්‍රංශය |
| භාෂාව | ප්‍රංශ |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 49% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 21 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| නිවාඩු කාලය පැමිණීම මගින් ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| විවේක සංචාරකයන් 2015 | 79,604 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| සම්පූර්ණ පැමිණීම ශ්රේණිගත කිරීම 2015 | 6 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 86,126 |
| දිනකට වැය වූ මුදල (එ.ජ. ඩොලර්) 2015 | 154 |
| ගතවන කාලය (දින) | 13 |
| විවේක සංචාරකයන් විසින් ආදායම (ඇ. ඩො.) 2015 | 159,739,755 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 172,827,322 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## IFTM TOP RESA සංචාරක පොළ

"International French Travel Mart - IFTM TOP RESA 2016 යනු ඩෝවිවිල් ඉතිහාසයේ පැවති ඓතිහාසික විශාලතම වෘත්තීය ගමන් චාරිකා ප්‍රදර්ශනයකි. එය TOP RESA ලෙස හැඳින්වන්නේ 2009 වසරේ දී ප්‍රතිනම්කිරීමත් සමඟය මෙවර Paris Porte De Versailles හිදී පැවැත්විනි. එය 2016 සැප්තැම්බර් මස 20 දින සිට 23 වනදා දක්වා පැවැත්විණි. IFTM යනු වෙළෙඳපොළක්, මූලික රැස්වීම් ස්ථානයක් වන අතර ප්‍රංශයේ සහ ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ ප්‍රබල ස්ථානයක් දරයි. එය නව වෙළෙඳ ගනුදෙනු සබඳතා ස්ථාපනය කිරීම සහ ව්‍යාපාර පවත්වාගෙ නයාම සහ උසස් තත්ත්වයේ සබඳතා සහතික කිරීම හා තීරණ ගැනීමේ බලතල සහිත උසස් වෘත්තිකයින් ආකර්ෂණය කිරීම සඳහා වූ කදිම සංවාද මණ්ඩපයකි. IFTM ප්‍රදර්ශකයින්ගේ සංයුතිය ලොව පුරා සංචාරක කර්මාන්තයේ සමස්ත සේවා වර්ණාවලිය නියෝජනය කරයි.







## ප්‍රංශයේ කෑන්ස් නුවර පැවැත්වෙන 2016 කෑන්ස් සිනමා උළෙල

මෙම උළෙල 2016 මැයි මස 11 දින සිට මැයි මස 22 වන දින දක්වා ජාත්‍යන්තර චිත්‍රපට වෘත්තිකයින් සහ

ජාත්‍යන්තර මාධ්‍යවේදීන් ඉලක්ක කර පැවැත්විණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ජාතික චිත්‍රපට සංස්ථාව සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ප්‍රංශයේ CANNES සිනමා උළෙලේ ජාත්‍යන්තර ගමෙහි මණ්ඩපයක් සකස් කෙරිනි. දිවයින පිලිබඳ දැනුවත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය ස්ථානයන් ප්‍රදර්ශනය කිරීම, ශ්‍රී ලංකාව සිනමා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු අතර විය.






## PROMOAGV ප්‍රංශ සංචාරක නියෝජිත ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රංශයේ ප්‍රමුඛතම සංචාරක නියෝජිතයා වන PROMOAGV සමග සංචාරක ගමනාන්ත සංචාරක ප්‍රවර්ධනයක් සංවිධානය කළේය. ශ්‍රී ලංකාව සඳහා උපරිම විකුණුම් ප්‍රමාණයක් කල නියෝජිතයින් හට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා PROMOAGV වෙබ් අඩවියෙන් තරගයක් නිර්මාණය කරන ලදී. ප්‍රංශයේ නියෝජිතයන් 1500 ක් වෙත ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද අතර සහ නියෝජිතයින් 30 ක් තෝරාගත් ජයග්‍රාහකයන් විය. ඔවුන් ශ්‍රී ලංකාවේ දින පහක් දිනපතා සංචාරකයින්ගේ ආකර්ෂණීය ස්ථාන වෙත සංචාරය කළ අතර ලංකාව සංචාරක ගමනාන්තය ලෙස අනාගත ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවසානයේ දේශීය සංචාරක නියෝජිතයින් 50 ට වැඩි පිරිසක් සමග B2B හමුවීම් පැවැත්විය.

## ප්‍රංශයේ B2B ප්‍රංශ සංචාරක ගමන් සේවා නියෝජිතයන්

ප්‍රංශ සංචාරකයන් අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා හා වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමක් ලෙස ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ප්‍රංශ සංචාරක නියෝජිතයින් පිරිසක් පිළිගැනීමට ලක් කෙරිනි.



## SNAV අධ්‍යක්ෂක මහලේකම් සමග සාකච්ඡා කිරීම්

SNAV හි උපසභාපති වන රිචර්ඩ් සවුබීල, එහි මහලේකම් ජීන් මාක් රෝස් සහ Selectour Afat හා SNAV හි අධ්‍යක්ෂ බර්නාඩ් ගාසියා ඇතුළු නියෝජිත පිරිසක් SNAV පිළිබඳ මූලික සාකච්ඡා පැවැත්වීමට මෙරටට පැමිණීම සිදු විය.

## බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති SANV සමුළුව

ප්‍රංශයේ විශාලතම සංචාරක නියෝජිත සංගමය වන Les Enterprises du Voyage (LEV- සිය වාර්ෂික සම්මේලනය 2016 ඔක්තෝබර් 31 වන දින ප්‍රංශයේ සංචාරකයන් සඳහා ඉන්දියන් සාගරයේ ප්‍රධාන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව නැවත සහතික කරලීමක් කොළඹ දී දියත් කෙරිනි.






**ප්‍රංශය (TV 5)**

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ආරාධිත මාධ්‍යවේදී වැඩසටහන යටතේ පෙබරවාරි මස 11 සිට 21 වන දින දක්වා විද්‍යුත් ලිබ්ර් නිෂ්පාදකයන් පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පවත්වන ලදී. එහිදී මාධ්‍යවේදීන් 4 දෙනෙක් කොළඹ, රත්නපුර, බෙන්තොට, ගාල්ල, තිස්සමහාරාමය, වැල්ලවාය, ඇල්ල, බදුල්ල, නුවරඑළිය, මහනුවර, පින්නවල, අනුරාධපුර, යාපනය, මන්නාරම, හලාවත, මීගමුව ආදී ස්ථාන දැක බලා ගැනීම සිදු විය. "open skies-Sri Lanka" නම් ප්‍රංශ ජාතිකයින් ඉලක්ක කර ගනිමින් විනාඩි 52 ක වාර්තා චිත්‍රපට සකස් කර විද්‍යුත් ලිබ්ර් මාධ්‍ය හරහා 2016 ඔක්තෝබර් මස විකාශය කෙරිනි.



**SHINE FRANCE – ටෙලිවිෂන් ඩු රීල් (ප්‍රංශ TV නාලිකා M6)**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 පෙබරවාරි 24 සිට 28 වැනි දින දක්වා ටෙලිවිෂන් ඩු රීල් (ප්‍රංශ රූපවාහිනී නාලිකා එම්6) දැනුවත් කිරීමේ චාරිකාව සංචාරක මාධ්‍යවේදී වැඩසටහන යටතේ පැවැත්විය. එහිදී මාධ්‍යවේදීන් 17 දෙනෙක් කොළඹ, බගවන්තලාව, කුකුළේගම කඳවුරු පරිශ්‍රය, කුඹල්ගම, කල්තොට යන ප්‍රදේශ ආවරණය කෙරිනි. "Running wild" නම් විනාඩි 110 ක් හා විනාඩි 45 දිගු වාර්තා චිත්‍රපට 2 ක් ප්‍රංශ ජාතික සංචාරකයන් ඉලක්ක කර සකස් කර 2016 ඔක්තෝබර් මස Television du Reel (ප්‍රංශ රූපවාහිනී නාලිකාව M6) හරහා විකාශය කෙරිනි.

**FR 2 WORLD DISCOVERY රූපවාහිනී නාලිකාව**

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 අගෝස්තු 13 වන දින සිට එම මස 28 වැනි දින දක්වා FR 2 ලෝක ඩිස්කවරි රූපවාහිනී නාලිකාව සඳහා බාහිර මාධ්‍යවේදි වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ චාරිකාවක් සංවිධානය කෙරිනි. එහි මාධ්‍යවේදීන් දෙදෙනෙක් කොළඹ, නුවර, දඹුල්ල, අනුරාධපුරය, මඩකලපුව, ආරුගම්බේ, යාල, ගාල්ල යනාදී සංචාරක ස්ථාන දැකබලා ගැනීම සිදු විය. "FR 2 WORLD DISCOVERY රූපවාහිනී නාලිකාව නම් විනාඩි 52 ක් දිගු වාර්තා චිත්‍රපට දෙකක් ප්‍රංශ ජාතික සංචාරකයන් ඉලක්ක කර සකසා එය 2016 ඔක්තෝබර් මස "FR 2 World DiscoveryK" රූපවාහිනී නාලිකාව මගින් විකාශය කෙරිනි.

**ප්‍රංශ ලෝකප්‍රකට රූපවාහිනී නාලිකා TV5**

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 අගෝස්තු මස 07 වන දින සිට අගෝස්තු මස 29 වැනි දින දක්වා ප්‍රංශයේ ලෝකප්‍රකට රූපවාහිනී නාලිකා 5 හි මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාව සිදු කෙරිනි. එහි මාධ්‍යකරුවන් 6 දෙනෙකු කොළඹ, මඩකලපුව, කුඩුම්බිමලෛ, සීගිරිය, යාපනය, කල්පිටිය යන ප්‍රසිද්ධ සංචාරක ස්ථාන නැරඹීම සිදු විය. "Echappees Belles" නම් විනාඩි 90 ක් දිගු වාර්තා චිත්‍රපට ප්‍රංශ සංචාරකයන් ඉලක්ක කරගෙන සකසා එය 2016 ඔක්තෝබර් මස ප්‍රංශ ලෝකප්‍රකට රූපවාහිනී නාලිකා 5 හරහා විකාශය කෙරුණි. ප්‍රංශයේ ප්‍රධාන පෙළේ නාලිකාව වන මෙම නාලිකාව ආසන්න වශයෙන් 800,000 සිට මිලියනයක් වන ප්‍රේක්ෂක ජනතාව (එක් විකාශයක් සඳහා) නරඹන එකකි.

## නෙදර්ලන්තය

| පදිංචි රට | නෙදර්ලන්තය |
|---|---|
| භාෂාව | ලන්දේසි, ප්‍රංශ |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 82% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 8 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 6 |
| නිවාඩු කාලය පැමිණීම මගින් ශ්‍රේණිගත කිරීම 2015 | 11 |
| විවේක සංචාරකයන් 2015 | 26,056 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 10 |
| සම්පූර්ණ පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 14 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 32,742 |
| දිනකට වැය වූ මුදල (එ.ජ. ඩොලර්) 2015 | 164 |
| ගතවන කාලය (දින) | 17 |
| විවේක සංචාරකයන් විසින් ආදායම (ඇ. ඩො.) 2015 | 70,913,228 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 89,109,645 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### බෙල්ජියම් සමඟ ඒකාබද්ධවන නෙදර්ලන්ත මාර්ග ප්‍රදර්ශනය

ආරාධිත අමුත්තන් වන විවිධ සංචාරක චාරිකා ක්‍රියාධරයන්, සංචාරක ආයතන, DMC. MICE විශේෂඥයින් සහ මාධ්‍ය සම්බන්ධ කර ඇම්සටර්ඩෑම් නගර මධ්‍යයේ පිහිටි NH Grand Krasnapolsky හෝටලයේදී 2016 මාර්තු 15 වන දින ශ්‍රී ලංකා සංචාරක ආයතනය විසින් පිළිගැනීමක් සිදු කෙරිනි. ඇම්ස්ටර්ඩෑම්හි පැවති මාර්ග ප්‍රදර්ශනය සඳහා කර්මාන්තයේ නිරතවන්නන් 13 දෙනෙකු සහ එම ප්‍රදේශයෙන් ආරාධිතයින් 60 කට අධික පිරිසක් ඊට සහභාගි වූහ.





### VAKANTIEBEURS - UTRECHT ජාත්‍යන්තර සංචාරක හා විනෝදාස්වාද සැණකෙළිය, නෙදර්ලන්තය

ශ්‍රී ලංකානු පීඨිකාව උට්රෙච්ට් නගරාධිපති හා ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් විවෘත කෙරිනි. ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍රයේ සාමාජිකයින් 9 දෙනෙකු ඊට සහභාගී වූහ. මෙම ප්‍රදර්ශනයේ නරඹන්නන් අතරින් ගණුදෙනුකරුවන් 121,573 ක් සහ 19,154 ක් වෘත්තිකයන් පැමිණ ඇත. සංචාරය මගින් ජනමාධ්‍යවේදීන්, බ්ලොග්කරුවන්ගේ සම්බන්ධතා ගණනාවක් ලබා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූප වර්ධනයක් Vakantiebeurs නිල වෙබ් අඩවිය තුළ විකාශය වූ අතර එය 2016 ජනවාරි 13 සිට 17 දක්වා පැවැත්විනි.



## "National Geographic" සංචාරක සඟරාවේ දැන්වීම




## ස්වීඩනය

| පදිංචි රට | ස්වීඩනය |
|---|---|
| භාෂාව | ස්වීඩන් |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 70% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 10 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 14 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 21 |
| විවේක සංචාරකයන් 2015 | 13,407 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 16 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 23 |
| සමස්ත පැමිණීම් 2015 | 18,423 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 15 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 33,190,973 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 45,608,808 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## ෆින්ලන්තයේ මැට්කානෝර්ඩික් සංචාරක ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව මැට්කානෝර්ඩික් සංචාරක ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත කළමනාකරණ සමාගම් (DMCs- කිහිපයක නියෝජිතයින් සහභාගී කරවන ලදී. 2016 ජනවාරි 21 සිට 24 දක්වා පවත්වනලද නෝර්දික් සංචාරක ප්‍රදර්ශනය ෆින්ලන්තයේ Messukeskus හා හෙල්සින්කි එක්ස්පෝ සම්මේලන මධ්‍යස්ථානයේ පැවැත්විණි.






### ශ්‍රී ලංකා වෙරළ වොලිබෝල් ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම යටතේ ස්වීඩන් නිලධාරීන් දෙදෙනෙකුගේ නිලසංචාරය

බීච් වොලිබෝල් ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා උචිතම වෙරළ ප්‍රදේශ තෝරාගැනීම සඳහා ස්වීඩනයෙන් නිලධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන ලදී. සංචාරය කල ස්ථාන අතර මීගමුව, කළුතර, බෙන්තොට, හික්කඩුව, හම්බන්තොට, උණාවටුන, පාසිකුඩා වූ අතර මෙහිදී අන්තර්ජාතික බීච් වොලිබෝල් ක්‍රීඩකයින්, ක්‍රීඩක කණ්ඩායම් සහ විදේශීය සංචාරකයන් ඉලක්ක කෙරිනි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකාවේ බීච් වොලිබෝල් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා බීච් වොලිබෝල් ක්‍රීඩාවේ නිරතව සිටින ප්‍රධාන නිලධාරීන් දෙදෙනෙකුට ආරාධනා කිරීම හා ශ්‍රී ලංකාවේ බීච් වොලිබෝල් ක්‍රීඩාව දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් සුදුසු ස්ථානයක් ලෙස බෙන්තොට හඳුනාගෙන ස්කැන්ඩිනේවියානු රටවල් ඉලක්ක කර බීච් වොලිබෝල් සඳහා වෙරළ තීරය ඇතුළු බෙන්තොට නිවාඩු නිකේතනය සංවර්ධනය කිරීමට බෙහෙවින් උනන්දුවක් දක්වන අතර ඉහළ නිලධාරීන් විසින් අවට පිහිටි සංචාරක ආකර්ෂණ ස්ථාන ලෙස බෙන්තොට ඉස්මතුකර ඇත. තවද, ඉහත නිලධාරීන් විශේෂයෙන්ම ස්කැන්ඩිනේවියානු සංචාරකයන් ඉලක්ක කරගනිමින් බීච් වොලිබෝල් ක්‍රීඩාව දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා බෙන්තොටට අමතරව මීගමුව ප්‍රදේශය ද හඳුනාගෙන ඇත.

### MAT සඟරාව

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 මැයි 01 - 08 වන දින දක්වා MAT සඟරා මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාව පවත්වන ලදී. එහි මාධ්‍යකරුවන් 2 දෙනෙකු කොළඹ, ත්‍රිකුණාමලය, නිලාවේලි, සීගිරිය, නුවර, නුවරඑළිය, මීගමුව, යනාදී සංචාරක ප්‍රදේශ ආවරණය කෙරිනි. පිටු 5 - 6 ක් පුරා වූ වාර්තාවක් " MAT සඟරාව" සකස් කර ස්වීඩන් ජාතික සංචාරකයන් ඉලක්ක කර එම සඟරාවේ 2016 දෙසැම්බර් ප්‍රකාශයට පත්කෙරුණි. ස්වීඩනයේ ප්‍රධාන පෙළේ සඟරාව වන MAT සඟරාව ආසන්න වශයෙන් 109,000 ක පාඨක පිරිසක් අතරට පත්වන්නකි (මාසිකව).

### ඉතාලිය

| පදිංචි රට | ඉතාලිය |
| --- | ---: |
| භාෂාව | ඉතාලි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 65% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 13 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 15 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 15 |
| විවේක සංචාරකයන් 2015 | 16,510 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 15 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 17 |
| සමස්ත පැමිණීම් 2015 | 24,293 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 153 |
| නිවාඩු කාලය (දින) 2015 | 13 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 33,164,529 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 48,798,661 |
| | |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### TTG INCONTRI TRAVEL FAIR, ඉතාලියේ රිමිනීහි සංචාරක වෘත්තිකයින් සඳහා දින 3 වැඩමුළුව – 2016 ඔක්තෝබර් 13 සිට 15 දක්වා

TTG Incontri යනු සංචාරක කර්මාන්තයේ ප්‍රධානතම B2B ප්‍රදර්ශනයයි. එය වෙළඳපොළ අධ්‍යයනය කරන ප්‍රවේශයක් වන අතර ප්‍රදර්ශකයින්ගේ / අමුත්තන්ගේ ගුණාත්මකභාවය, ප්‍රමාණය හා අවස්ථා වසරක පාසා

ඉදිරි වර්ධනය සිදු වන්නකි. එය සත්‍ය සංචාරක ව්‍යාපාරයේ පිළිඹිබුවකි. TTG Incontri යනු ජාත්‍යන්තර වශයෙන් නිල සුදුසුකම් ලබා ඇති එකම ඉතාලි වෙළඳ ප්‍රදර්ශනයකි. එය ITTFA සාමාජිකයෙකි. (ජාත්‍යන්තර සංචාරක වෙළඳ ප්‍රදර්ශන සංගමය). එය ජාත්‍යන්තර ප්‍රදර්ශකයින් එකට එක්කර ඔවුන්ගෙ අවශ්‍යතා ඉටු කරන ස්ථානයකි.

එමගින් නව සම්බන්ධතා උත්පාදනය කිරීම, නව නිෂ්පාදන හඳුන්වාදීම සහ සමාගම් ප්‍රතිරූප ඉහළ නැංවමින් ඉලක්කගත වෙළෙඳපොළක් කරා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ස්ථානයක් වන අතර ඉන් 70% කට වඩා වැඩි සංඛ්‍යාවක් ඉතාලි පාරිභෝගිකයින්ට ඉතාලි හා ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය නියැලෙන සමාගම් වලින් සමන්විතය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ඉතාලි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව 2016 ඔක්තෝබර් මස 13 සිට 15 දක්වා ඉතාලියේ රිමිනිහි TTG Incontri සංචාරක ප්‍රදර්ශනය පැවැත්විය. ඉතාලියේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් යුරෝපයේ වෙළඳපොළවලට එක්ව වන සංචාරකයින් අතරින් Walkers Tours" Ayubowan Tours &Travels" D Holidays" Authenticities" Jetwing" Ceylon Roots" Aitken Spence Travels" Crystal Holidays" Heritage expeditions" Air wingTours" Connaissance De Ceylon" Wayfarers" Viluxur Holidays" Diamond Leisure සහ Shangrila යන සමාගම් සම ප්‍රදර්ශකයන් ලෙස සහභාගී වූහ.





## BIT - අන්තර්ජාතික සංචාරක හුවමාරුව, ඉතාලියේ මිලාන් හි පැවති

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හුවා දැක්වීම සඳහා ඉතාලි වෙළෙඳපොළ සංචාරක හා හෝටල් ක්ෂේත්‍රයේ ඉහළම සමාගම් 18 ක් සඳහා වූ BIT ජාත්‍යන්තර සංචාරක හුවමාරුව 2016 පෙබරවාරි 11 සිට 13 දක්වා ඉතාලියේ මිලාන්හි දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පැවැත්විය.





## RAI රූපවාහිනිය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 අගෝස්තු 08 සිට අගෝස්තු 20 දක්වා RAI රූපවාහිනී නාලිකාව සඳහා මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාවක් බාහිර මාධ්‍ය වැඩසටහන යටතේ පවත්වන ලදී. එහි මාධ්‍යකරුවන් 2 දෙනෙකු කොළඹ, මීගමුව, යාපහුව පෞරාණික ස්ථාන, අනුරාධපුරය පැරණි නගරය, යාපනය නගරය, නාගදීප විහාරය, ත්‍රිකුණාමලය, මඩකලපුව, ආරුගම්බේ වෙරළ පරිශ්‍රය, පොළොන්නරුව ඓතිහාසික ප්‍රදේශ, සීගිරිය ප්‍රදේශය, දඹුල්ල ප්‍රදේශය, වස්ගමුව, රිවස්ටන්, මහනුවර ස්ථාන, නුවරඑළිය, මීගමුව නගරය යනාදී සංචාරක වැදගත් ප්‍රදේශ ආවරණය කරමින් නරඹන ලදී. "කිළිමංගයරෝ" වාර්තා චිත්‍රපට සමග එක් එක් පරිච්ඡේදය සඳහා විනාඩි 12 - 14 ක් දිග වාර්තාවක් ඉතාලි ජාතික සංචාරකයන් ඉලක්ක කර සකසා එය 2016 ඔක්තෝබර් මාසයේ දී RAI රූපවාහිනිය හරහා විකාශය කරන ලදී.








## ඔස්ට්‍රියාව

| පදිංචි රට | ඔස්ට්‍රියාව |
|---|---|
| භාෂාව | ජර්මානු, හංගේරියානු, ස්ලෝවීනියානු, ඔස්ට්‍රියානු |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 51% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 19 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 18 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 26 |
| විවේක සංචාරකයන් 2015 | 11,979 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 21 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 29 |
| සමස්ත පැමිණීම් 2015 | 14,253 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 15 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 29,066,564 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 34,584,334 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## FERIEN MESSE WIEN - ඔස්ට්‍රියාව

විදේශීය සංචාරක ප්‍රදර්ශනය 2016 ජනවාරි 14 වන දින සිට 2016 ජනවාරි 16 දක්වා ශ්‍රී ලංකා වෙළඳ හවුල්කරුවන් 5 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඔස්ට්‍රියාවේ දී පැවැත්විණි. මෙම අවස්ථාවට ඔස්ට්‍රියාවේ සංචාරක නියෝජිතයින් පිරිසක් හා සංචාරකයින් එක්වීම සිදු විය.

## බෙල්ජියමය

| පදිංචි රට | බෙල්ජියමය |
|---|---|
| භාෂාව | ප්‍රංශ, ජර්මානු, ලන්දේසි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 55% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 15 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 23 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 25 |
| විවේක සංචාරකයන් 2015 | 11,995 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 28 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 33 |
| සමස්ත පැමිණීම් 2015 | 13,054 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 11 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 21,829,041 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 23,756,257 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය








## බ්‍රසල්ස් නිවාඩු ප්‍රදර්ශනය - අන්තර්ජාතික සංචාරක වෙළඳ ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 පෙබරවාරි 04 වනදා සිට 2016 පෙබරවාරි 07 වන දා දක්වා පැවති උක්ත කාර්යය සඳහා වූ ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගී විය. මේ සඳහා එරට ශ්‍රී ලංකාවේ තානාපතිවරයා ආරම්භක උළෙලට සහභාගී විය. ක්ෂේත්‍රයේ නිරත කර්මාන්තකරුවන් දෙදෙනෙක් ශ්‍රී ලංකා කුටිය තුල රැඳී සිටියහ. මේ වසරේ පැවති ප්‍රදර්ශනයට දහසකට අධික පිරිසක් සහභාගී විය.



## මාර්ගස්ථ ප්‍රදර්ශනය - බෙල්ජියම

බ්‍රසල්ස්හි පිහිටා ඇති ශ්‍රී ලංකානු සමාගම් 16 ක් සමඟ එක්ව බෙල්ජියමේ සාර්ථක මාර්ගස්ථ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පැවැත්වීය. එම ප්‍රදේශයේ ආරාධිතයින් 70 කට අධික පිරිසක් ආරාධිතව පැමිණ සිටියහ.



## රේඩියෝ ටෙලිවිෂන් BELGE FRANCOPHONE ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

බාහිර ජනමාධ්‍යවේදී වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මාධ්‍ය හුරුකිරීමේ සංචාරයක් රේඩියෝ ටෙලිවිෂන් BELGE FRANCOPHONE සඳහා 2016 පෙබරවාරි 09 සිට 21 දින දක්වා පැවැත්විය.

එහි මාධ්‍යකරුවන් 03 දෙනෙකු පින්නවල අලි අනාථාගාරය, යාල ජාතික උද්‍යානය, සීගිරිය, අනුරාධපුරය, පොළොන්නරුව යනාදී වැදගත් ස්ථාන නරඹන ලදී. "Le Jardian Extra ordinaire" නමින් විනාඩි 35 ක් දිග එක් එක් කථාංග සහ කෙටි චිත්‍රපට දෙකක් බෙල්ජියම් ජාතිකයන් ඉලක්ක කර සකසා 2016 මැයි මස RTBF මගින් විකාශය කෙරිනි. බෙල්ජියමේ ප්‍රධාන පෙළේ නාලිකාව වන RTBF ආසන්න වශයෙන් මිලියන 1,400,000 ක් පමණ ප්‍රේක්ෂක ජනතාව (සතියකට) නරඹන්නකි.





## නෝර්වේ

| පදිංචි රට | නෝර්වේ |
|---|---|
| භාෂාව | නෝර්වීජියානු, බොක්මාල්, නයිනර්ස්ක්, සැමි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 52% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 18 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 32 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 36 |
| විවේක සංචාරකයන් 2015 | 6,665 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 31 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 34 |
| සමස්ත පැමිණීම් 2015 | 12,007 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 10 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 10,817,995 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 19,488,622 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## නෝර්වේජියානු සංචාරක ප්‍රදර්ශනය - නෝර්වේ

ශ්‍රී ලංකා සංචාරක, ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ නෝර්වේහි ව්‍යාපාරික පාර්ශ්වකරුවන් ආකර්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය නෝර්වේජියානු සංචාරක ප්‍රදර්ශනයට සහභාගී විය.





## ඇමෙරිකා එක්සත් ජනපදය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වොෂින්ටන් ඩී. සී. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක ප්‍රදර්ශනයට එක්විය. එය 2016 ජනවාරි මස 06 සිට 10 දක්වා නිව්යෝක් හි Jacob K Javits සම්මේලන මධ්‍යස්ථානයේ 13 වන වරටත් අඛණ්ඩව පැවැති අතර ශ්‍රී ලංකාවේ ගමනාන්ත කළමනාකරණ සමාගම් 10 හා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සහභාගී විය.

ආසියාව සඳහා වූ නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක කර්මාන්ත සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලංකාව සහභාගි වූයේ සංචාරක වෘත්තිකයින්ට පුළුල් දැනුවත් කිරීමක් ඇති කිරීමටය. සංචාරක ප්‍රදර්ශනය අතරතුරදී එක්සත් ජනපද සංචාරක කර්මාන්තයේ වෘත්තිකයින් හා පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලාංකික සංචාරක සමාගම් නවයක් සමඟ ඉදිරි සංචාර අවස්ථා පිළිබඳව එළදායී සාකච්ඡා පවත්වා ඇත.

## දකුණු ආසියාව

| පදිංචි රට | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| ඉන්දියා | 5 |
| මාලදිවයින | 10 |
| වෙනත් - දකුණු ආසියාව | 31 |
| පකිස්තානය | 36 |
| බංගලිදේශය | 43 |

| පදිංචි රට | දකුණු ආසියාව |
|---|---|
| භාෂාව | |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 56% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 4 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| විවේක සංචාරකයන් 2015 | 243,732 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| සමස්ත පැමිණීම් 2015 | 459,415 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 163 |
| නිවාඩු කාලය (දින) 2015 | 12 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 483,088,694 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 910,582,904 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ඉන්දියාව




| පදිංචි රට | ඉංදියාව |
|---|---|
| භාෂාව | හින්දි, බෙංගාලි, තෙළිගු, මරාති, දෙමළ, උර්දු, ගුජරාටි, කන්නඩ, මලයාලම්, ඔද්යියා පන්ජාබි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 70% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 11 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| විවේක සංචාරකයන් 2015 | 178,061 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| සමස්ත පැමිණීම් 2015 | 316,247 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 139 |
| නිවාඩු කාලය (දින) 2015 | 6 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 143,139,677 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 254,224,638 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## SATTE ඉන්දියාවේ නවදිල්ලි නුවර

දකුණු ආසියාවේ ප්‍රධානතම ගමන් හා සංචාරක සමුළුව වන SATTE 2016 ජනවාරි මස 29 සිට 31 දක්වා නවදිල්ලියේ "ප්‍රගීති මයිඩන්" හි පැවැත්විනි. වසර ගණනාවක් පුරා SATTE නරඹන්නන් හා ප්‍රදර්ශකයන් වැඩි ප්‍රමාණයක් ආකර්ශනය (ජාත්‍යන්තර හා දේශීය ගැනුම්කරුවන් ඇතුළුව) කිරීමට සමත් වී ඇති අතර අද වන විට එය දකුණු ආසියාවේ විශාලතම සංචාරක හා සංචාරක කර්මාන්තය සඳහා ජාලකරණ සංසදය බවට පත් ව ඇත. සාඩම්බර 23 වරටත් පැවති SATTE 2016 පූර්ව ලියාපදිංචි වූ සහසත්කාරක ඉන්දියානු සහ ජාත්‍යන්තර ගැනුම්කරුවන් සහ රාජ්‍ය සංචාරක මණ්ඩල ඇතුලත්ව සංචාරක වෙළඳාමේ සහභාගීත්වය සඳහා වාර්තාගත වර්ධනයක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශය හෝටල් සහ සංචාරක කර්මාන්තයේ මෙහෙයුම්කරුවන් 32 පමණ ශ්‍රී ලංකාව වෙනුවෙන් SATTE 2016 සහභාගි විය.










## OTM - ඉන්දියාවේ බොම්බාය

ඉන්දියාවේ සංචාරකයන්, සංචාරක නියෝජිතයින්, චාරිකා මෙහෙයුම්කරුවන් සහ මාධ්‍යයන් 2016 පෙබරවාරි 18 සිට පෙබරවාරි 20 දක්වා පැවති මෙම වෙළඳපල මගින් ඉලක්ක කෙරිනි.

OTM යනු ඉන්දියාවේ විශාලතම සංචාරක වෙළඳ ප්‍රදර්ශනය වන අතර ඉන්දියාවේ විශාලතම සංචාරක වෙළෙඳපොළ වන්නේ බොම්බාය ය. OTM මුම්බායි ඉන්දියා - මහා ද්විපික මෙන් විශාල වෙළඳපොළකට වඩාත් ඵලදායී ප්‍රවේශයක් ලබා දෙයි. මෙයට රටවල් 70 ක් නියෝජනය කරමින් 2,500 කට අධික පිරිසක් සහභාගි වෙමින් සමස්ත ඉන්දියාව පුරා වූ හොඳම දෑ මෙ වසරේ සිය සංචාරකයින්ට ලබා දීම සිදු කෙරේ. මේ වසරේ ශ්‍රී ලංකාව නියෝජනය කරන සමාගම් 25 ක් සහභාගී විය.



## IITM – ඉන්දියාවේ බැංගලෝර්

ඉන්දියාවේ සංචාරකයින් ,සංචාරක නියෝජිතයින්, සංචාර මෙහෙයුම්කරුවන් සහ මාධ්‍ය ඉලක්ක කර 2016 අගෝස්තු මස 05 සිට අගෝස්තු 07 වන දා දක්වා ප්‍රදර්ශනය පැවැත්වීය.






## OTM - ඉන්දියාවේ හයිද්‍රාබාද්







## බොම්බායි ශ්‍රී ලංකා රාත්‍රිය, ඉන්දියාව

ඉන්දීය සංචාරකයින්, සංචාරක නියෝජිතයින්, චාරිකා මෙහෙයුම්කරුවන් සහ මාධ්‍යය ඉලක්ක කර පූර්ණ සහභාගීත්ව සහිතව බොම්බේ ශ්‍රී ලංකා රාත්‍රිය සාර්ථකව පැවැත්විනි.

## CONDE'NAST TRAVELLER හි ප්‍රකාශන - ඉන්දියාව

ජනප්‍රිය CONDE'NAST සංචාරක සඟරාවේ 2016 අගෝස්තු-සැප්තැම්බර් කලාපය තුල පිටු දෙකක ප්‍රචාරක දැන්වීමක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනකාරින් පල කරවන ලදී. ඉන්දියානු ජාතිකයන් අතර ජනප්‍රිය ගමනාන්තයක් වන කතරගම කෙරේ අවධානය යොමු කරවමින් ලදෙවිවරුන් ජීවත්වූ ස්ථානයල ප්‍රචාරක තේමාව යොදා ගැනීම සිදු විය. මෙම ලිපිය එළඹෙන දිපාවාලි සමය හා ගැලපෙන පරිදි වනජීවීන්, උරුමයන් සහ වැදගත් සිදුවීම් යොදා පල කෙරිණි.



## ඉන්දියාවේ සිට ව්‍යාපාරික හුරු කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එයා ඉන්ඩියා සමඟ එක්ව ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාව වෙත ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීමක් සංවිධානය කෙරිනි. 2016 ජුලි 03 සිට ජුලි 09 දක්වා නියෝජිතයන් 20 දෙනෙකු සම්බන්ධ විය.



සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සමඟ එකිනෙකා මුසු කරවන රැස්වීමක් 2014 ජුලි 08 වන දින පෙ.ව. 2 සිට පස්වරු 5 දක්වා කොළඹ රමඩා හෝටලයේ "බැන්කට්" ශාලාවේ දී පැවැත්විය. SLAITO, THASL සහ ASMET නියෝජනය කරමින් සාමාජිකයින් 80 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් හමුව සංවිධානය කරන ලදී. හමුව ගරු අමාත්‍යතුමා සමඟ 2016 ජුලි 08 දින පැවැත්විය.





**TV 9 (රාමායනා TRAILS-**

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 ජූනි මස 13 සිට 25 වන දින දක්වා TV 9 (රාමායනා Trails) මාධ්‍ය ආයතනය දැනුවත් කිරීමේ චාරිකාව සිදු කෙරිනි. එහි මාධ්‍යකරුවන් 02 දෙනෙකු කොළඹ, මාරවිල, හලාවත, අනුරාධපුරය, මන්නාරම, යාපනය, වවුනියාව, ත්‍රිකුණාමලය, පාසිකුඩා, මහනුවර, රන්බොඩ, නුවරඑළිය, ඇල්ල, බුත්තල, තිස්සමහාරාම, ගාල්ල සහ කතරගම යනාදී දැකුම්කළු ප්‍රදේශ සංචාරය කෙරිනි. "රාමායනා Trails" පැය භාගයක සිට පැයක කාලයක් වූ වාර්තා චිත්‍රපට ඉන්දියානු ජාතිකයන් ඉලක්ක කර සකසා ඒවා 2016 ඔක්තෝබර් වලදී TV 9 හරහා විකාශනය කරන ලදී.






**VOGUE සඟරාව**

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

VOGUE සඟරාව සම්බන්ධ මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාවක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 අගෝස්තු 6 සිට 11 තෙක් පවත්වන ලදී. එහි මාධ්‍යකරුවන් 06 දෙනෙකු කොළඹ නගරය, ගාල්ල ලන්දේසි කොටුව, නුවරඑළිය නගරය, තේ වගාව, නුවර නගරය, රාජකීය උද්භිද උද්‍යානය, මහනුවර සංස්කෘතික ප්‍රදර්ශනය, දන්ත ධාතූන් වහන්සේ, සීගිරිය, මින්නේරිය සෆාරි, පොලොන්නරුව පුරාණ ස්ථාන, ත්‍රිකුණාමලය නගර ප්‍රදේශය, නිලාවැලි වෙරළ, මඩකළපුව, ලන්දේසි කොටුව මඩකලපුව, කල්ලඩි පාලම, යනාදී ප්‍රසිද්ධ සංචාරක ප්‍රදේශ ආවරණය කෙරිනි. පිටු 5-6 කින් යුත් "ශ්‍රී ලංකාවේ මාර්ග චාරිකා" නමින් ඉන්දියානු ජාතිකයන් ඉලක්ක කර වාර්තා ලිපි සකසා ඒවා 2016 ඔක්තෝබර් මාසයේදී VOGUE සඟරාව තුල පල කෙරිනි. ඉන්දියාවේ ප්‍රධාන පෙළේ සඟරාවක් වන VOGUE ආසන්න වශයෙන් 275,000 ක් පාඨක පිරිසක් සහිත ප්‍රකාශනයකි (මසකට).

## නැගෙනහිර ආසියා

| පදිංචි රට | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| චීනය (පී.ආර්.) ** | 1 |
| ජපානය | 11 |
| මැලේසියාව | 25 |
| සිංගප්පූරුව | 27 |
| කොරියාව (දකුණ) | 29 |
| ඉන්දුනීසියාව | 35 |
| තායිලන්තය | 37 |
| වෙනත් (නැගෙනහිර ආසියා) | 42 |
| පිලිපීනය | 44 |

| පදිංචි රට | නැගෙනහිර ආසියාව |
|---|---|
| භාෂාව | |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 130% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 1 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| විවේක සංචාරකයන් 2015 | 297,215 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 3 |
| සමස්ත පැමිණීම් 2015 | 362,857 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 160 |
| නිවාඩු කාලය (දින) 2015 | 7 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 352,517,901 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 430,373,931 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

| පදිංචි රට | චීනය (පී.ආර්.) ** |
|---|---|
| භාෂාව | මැන්ඩරින්, කැන්ටනීසී |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 394% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 2 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 1 |
| විවේක සංචාරකයන් 2015 | 203,104 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 2 |
| සමස්ත පැමිණීම් 2015 | 214,783 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 167 |
| නිවාඩු කාලය (දින) 2015 | 10 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 321,587,765 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 340,079,885 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## චීනය




## GITF 2016, චීනය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් ගුවැං වු හි දී සමඟ Guangzhou ජාත්‍යන්තර සංචාරක පොළ (GITF) -2016 සහභාගි වූහ. මෙම ප්‍රදර්ශනය ගුවන්සව් වල 1992 සිට පවත්වාගෙන එන අතර කලාපයේ කීර්තිමත් ජාත්‍යන්තර සංචාරක ප්‍රවර්ධන පොළවල් වලින් එකක් ලෙස එය සැලකේ.

මේ වසරේ සංචාරක පොළ චීනයේ චීන ආනයන හා අපනයන ජාත්‍යන්තර ප්‍රදර්ශන ශාලාවේදී පෙබරවාරි 25 සිට 27 දක්වා පැවැත්විණි. ඊට රටවල් 45 කින් ප්‍රදර්ශකයින් 956 ක් සහභාගීවූ අතර ශ්‍රී ලංකාව නිල වශයෙන් GITF 2016 සඳහා සම්බන්ධ වූයේ "එක් රටක දහසක් වටිනා වස්තු" යන තේමාව යටතේය.










## CXSRITE 2016, චීනය

CXSRITE 2016 අගෝස්තු මස 26 වන දින සිට 28 වන දින දක්වා සියෑන් හි "Xian Qujiang" ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ අංක සී 12 හි ශාලා 5.2a ශාලාවේ දී පවත්වන ලදී.

## BITE 2016, චීනය

බීජිං අන්තර්ජාතික සංචාරක ප්‍රදර්ශනය (BITE - 2016) යනු 2016 මැයි 20 සිට 22 වන දින දක්වා චීනයේ බීජිං නුවර ජාතික කෘෂිකර්ම ප්‍රදර්ශන මධ්‍ය ස්ථානය තුල පැවැත්වෙන වාර්ෂික ජාතික උත්සවයකි.



BITE 2016 ට සමගාමීව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මැයි 18 සහ මැයි මස 24 වැනි දින Tianjin & Shenyang හි සංචාරක ප්‍රවර්ධන මාර්ග ප්‍රදර්ශන දෙකක් දෙරට අතර සංචාරක වෙළෙඳාම ජාලකරණය කාර්යක්ෂම කිරීම සඳහා සංවිධානය කළේය.



## සංචාරක පොළට සමාන්තරව මාර්ග ප්‍රදර්ශන දෙකක් සංවිධානය කිරීම – ටියැන්ජින් සහ චීනයේ ෂෙයින්ග්

BITE සංචාරක ප්‍රදර්ශනය වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මැයි 18 හා මැයි මස 24

සහ දිනවල පිළිවෙලින් තියන්ජින් සහ ෂෙන්යන්ග් හි සංචාරක මාර්ග ප්‍රදර්ශන දෙකක් පැවැත්විය.

දෙරටේ සංචාරක වෙළඳ ප්‍රදර්ශන ජාලකරණය සඳහා ඵලදායී හා කාර්යක්ෂම වේදිකාවක් මෙමගින් නිර්මාණය වීමට මඟ පෑදී ඇත. තවද, මාර්ග ප්‍රදර්ශන දෙක තුළ තවත් ව්‍යාපාරික ගනුදෙනු වලට ද ඉඩ සැලසුනි. මෙය රටවල් දෙකට සාකච්ඡා මාර්ගයෙන් වෙළඳාම සහ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අවස්ථාවක් විය.

මාර්ග ප්‍රදර්ශන දෙක අතරතුරේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නියෝජිතයන් හා බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජිතයින් සමග මාධ්‍ය හා සංචාරක පිලිබඳ සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර ශ්‍රී ලංකාව හොඳම සංචාරක ගමනාන්තයන් ගෙන් එකක් ලෙස ඉස්මතු වීමට හැකි විය.



**CHINA INTERNATIONAL TRAVEL MART (CITM 2016- & ROADSHOWS IN NANJING & HEFE**

China International Travel Mart (CITM- චීනයේ ෂැංහයි නව අන්තර්ජාතික ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී 2016 නොවැම්බර් 11 සිට 13 දක්වා සාර්ථකව පැවැත්විණි. පළමුවෙනි දින දෙකේ වෙළඳාම සඳහා විවෘතවූ අතර පසුව මහජන ප්‍රදර්ශනයට විවෘත විය.




තවද, CITM සංචාරක ප්‍රවර්ධන පොලට අදාළව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංචාරක ප්‍රවර්ධන මාර්ග වැඩසටහන් දෙකක් පිළිවෙලින් 2016 නොවැම්බර් 09 සහ 15 යන දින වල නන්ජින් සහ හෙෆෙහි සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයන් 33 සමග ශ්‍රී ලංකන් ගුවන් සේවය මෙම සංචාරක පොළට එක් වූ අතර, පාරිභෝගිකයන් 1000 - 2000 ක් පමණ ශ්‍රී ලංකා මණ්ඩපය නැරඹූහ. චීනයේ ප්‍රධාන මාධ්‍ය ආයතන 15-20 ප්‍රමාණයක් සංචාරක පොල ආවරණය කෙරිනි.

චීනයේ සංචාරක නියෝජිත ආයතන 115 ක් නන්ජින් සහ හෙෆෙහි පැවති මාර්ග ප්‍රදර්ශනයට සඳහා සහභාගීවූ අතර චීනයෙ ප්‍රමුඛ පෙළේ මාධ්‍ය 41 ක් මෙම ප්‍රදර්ශනය ආවරනය කර තිබුනි. මේ පිළිබඳ පුවත මිලියන 300 කට වඩා වැඩි බටහිර චීන ජනතාව අතරට සම්ප්‍රේශනය විය.



**CHENGDU INTERNATIONAL TOURISM EXPO (CITE 2016- සහ චෑන්ග්ඩු සහ චොංකින්ග්හි පැවති මාර්ග ප්‍රදර්ශන දෙක.**

Chengdu ජාත්‍යන්තර සංචාරක එක්ස්පෝ ප්‍රදර්ශනය (CITE) අතිසාර්ථකව 2016 දෙසැම්බර් 02 දින සිට 04 වනදා දක්වා චීනයේ සෙන්චරි සිටි නව අන්තර්ජාතික සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී පැවැත්විය. CITE සංචාරක ප්‍රදර්ශනයට සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් දෙසැම්බර් 06 සහ 08 යන දිනවල චෙන්ග්ඩු හා චොංකින් යන නගරවල සංචාරක ප්‍රවර්ධන මාර්ග ප්‍රදර්ශන දෙකක් සංවිධානය කෙරිනි. චෙන්ග්ඩු ජාත්‍යන්තර සංචාරක එක්ස්පෝ 2016 (CITE) මගින් සියළු සංචාරක ආයතන, සංචාර සංවිධායකයින්, ගුවන්සේවාවන්, සංචාරක ගමනාන්ත සඳහා නවතම සංචාරක පැකේජ්, ගමනාන්තයන්, නිෂ්පාදන සහ සේවාවන්, උපායමාර්ගික හා අන්යෝන්‍ය සබඳතා ගොඩ නගමින් නව ව්‍යාපාරික අවස්ථා උදා කරදීමටත් තම ව්‍යාපාර ක්ෂණිකව පුළුල් කිරීමටත් අවස්ථාව සැලසුනි.

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමඟ ශ්‍රී ලංකා සංචාරක නියෝජිත ආයතන 16 ක් මෙම චාරිකාවට සහභාගී වූ අතර, ශ්‍රී ලාංකික මණ්ඩපය වෙත 1500 - 2500 ක්වූ පිරිසක් නැරඹූහ. චීනයේ ප්‍රධාන ජනමාධ්‍ය ආයතන 20-30 ක් සංචාරක ප්‍රදර්ශනය ආවරණය කරන ලදී. චීනයේ සංචාරක නියෝජිතයින් 120 ක් සහ චීනයේ ප්‍රධාන පෙළේ මාධ්‍යයන් 45 ක් මෙම නන්ජින් සහ හෆීහි මාර්ග ප්‍රදර්ශන දෙක සඳහා සහභාගී විය. ගිනිකොනදිග චීනයේ වෙසෙන මිලියන 100 කට වඩා වැඩි ජන සංඛ්‍යාවක් අතර මෙම පුවත ප්‍රචලිත විය.






### YUNNAN COLLAGE OF TOURISM VACATION හි පුහුණු වැඩසටහන - කුන් මිං, චීනය

සංචාරක කර්මාන්තය පිළිබඳ යුනාන් විද්‍යාලයේ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර චීනයේ කුං මිං හි සංචාරක කර්මාන්තය පිළිබඳ යුනාන් විද්‍යාලයේ දින 10 ක සන්නිවේදන වැඩසටහනක් සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා සංචාරක ආයතනයට ආරාධනා කළේය.

මෙම දූත පිරිස සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා වෙත ලැබුණු නිල ආරාධනය අනුව වැඩසටහන සඳහා පළාත් සංචාරක අධිකාරීන්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, පෞද්ගලික සංචාරක හා සංචාරක ක්ෂේත්‍රයේ නිලධාරීන් ඇතුළු සාමාජිකයින් 33 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් 2016 නොවැම්බර් 1 සිට 14 දක්වා පුහුණු වැඩමුළුවට සහභාගී විය.

### MUM 2 සමඟ කේබල් රූපවාහිනී සංචාරය

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 අප්‍රේල් මස 28 සිට මැයි මස 05 වන දක්වා I CABLE TV TRIP WITH MUM 2 නාලිකා මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාව බාහිර මාධ්‍යවේ දී වැඩසටහන යටතේ පවත්වන ලදී. එහි මාධ්‍යකරුවන් 09 දෙනෙකු කොළඹ, ගංගාරාමය, පින්නවල, හබරණ, සීගිරිය, මින්නේරිය, මහනුවර, නුවරඑළිය, ගල්කිස්ස යනාදී සංචාරක ප්‍රදේශ නරඹන ලදී. "TV TRIP WITH MUM 2" විසින් පැය 02 ක වාර්තාමය චිත්‍රපටයක් චීන ජාතිකයන් ඉලක්ක කර සකසා 2016 මැයි 22 වන දින I CABLE TV හරහා විකාශනය කරන ලදී. චීනයේ ප්‍රධානපෙළේ නාලිකාව වන I CABLE TV නාලිකාව ආසන්න වශයෙන් මිලියන100ක් පමණ (මසකට) ප්‍රේක්ෂක පිරිසක් සිටින නාලිකාවකි.

### ජපානය

| පදිංචි රට | ජපානය |
|---|---|
| භාෂාව | ජපන් |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 36% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 27 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 11 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 9 |
| විවේක සංචාරකයන් 2015 | 34,062 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 14 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 10 |
| සමස්ත පැමිණීම් 2015 | 39,358 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 152 |
| නිවාඩු කාලය (දින) 2015 | 9 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 44,455,542 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 51,367,543 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය










## JATA TOURISM EXPO

ජපානයේ විශාලතම සංචාරක ප්‍රදර්ශනය වන JATA Tourism Expo සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ගතවූ අවුරුදු 20 තුළ සහභාගී විය. ටෝකියෝහි 2016 සැප්තැම්බර් 22 සිට 25 දක්වා පැවැත්වෙන 2016 JATA සංචාරක ප්‍රදර්ශනය ජපන් ප්‍රවාහන හා සංචාරක සංගමයේ (JTTA) හා ජපන් සංචාරක නියෝජිතයන්ගේ සංගමය විසින් ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සංවිධානය කෙරිනි. විවිධාකාර සංචාරක හා සම්බන්ධ තොරතුරු සහ කර්මාන්තයේ නව ප්‍රවණතා එහිදී දැක බලා ගැනීමට හැකි විය.

ජපානයේ ප්‍රාන්ත රාජ්‍යයන් 47 ක් සහ ලොව පුරා රටවල් 147 ක් ප්‍රදර්ශන භූමියේ නැගෙනහිර ප්‍රදර්ශන ශාලා 01 - 07 වල ප්‍රදර්ශනයට එක් විය. මෙම ප්‍රදර්ශනයේ පළමු දිනය සංචාරක කර්මාන්ත සඳහා හමුවීම් සහ B2B රැස්වීම් සඳහා පමණක් පැවති අතර දෙවෙනි දිනය එක් එක් ප්‍රදර්ශන කුටිවල ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීම සඳහා විවෘත විය. එහි අවසාන දෙදින මහජනතාවට විවෘත කෙරිනි. JATA සංවිධායකවරු පවසන අන්දමට දින 3 ක් තුල මෙම උත්සවය සඳහා 175,000 කට අධික පිරිසක් නරඹා තිබුනි.



## BAYSIDE AZUR හෝටලයේ පැවති ටෝකියෝ මාර්ග ප්‍රදර්ශනය - 2016 සැප්තැම්බර් 26

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ටෝකියෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව සංවිධානය කළ ටෝකියෝවේ මාර්ග ප්‍රදර්ශනය 2016 සැප්තැම්බර් 26 වන දින Bayside azur Hotel හිදී පැවැත්විනි.

ජපන් සංචාර සංවිධායකයින් ලියාපදිංචි කිරීමෙන් අනතුරුව පැය 3.15 පමණ ඇරඹූ මෙම උත්සවයට සංචාරක මෙහෙයුම්කරුවන් 60 ක් සහ මාධ්‍ය ආයතන 14 ක් සහභාගී වෙමින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ නියෝජිතයින් හමුවීම සිදු විය.

## මයිටෙට්සු නිව් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවති නාගෝයාවේ මාර්ග ප්‍රදර්ශනය - 2016 සැප්තැම්බර් 26

මේ සඳහා ලියාපදිංචි වීසා ප.ව. 3 ට ආරම්භ වූ අතර නාගෝයා ආරාධිතයින් හා එක්ව ප.ව. 3.20 ට පමණ මෙම උත්සවය ආරම්භ විය. සාම්ප්‍රදායික පොල්තෙල් පහන සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ජනක සුගතදාස මහතා, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම් හසින්තා මෙනෙවිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහේන් කාරියවසම් මහතා සහ ශ්‍රී ලංකා ගුවන් සේවය මෙරට කළමනාකර ෆවුසන් ෆෙරීඩ් මහතාගේ සුරතින් දැල්වීමෙන් මෙම උත්සවය ඇරඹිනි.





## සම්මු නගර පාරිභෝගික ප්‍රවර්ධනය, ජපානය

2016 මාර්තු 12 සිට මාර්තු 13 වන දින තෙක් ජපාන සංචාරකයින් ඉලක්ක කරගත් ප්‍රවර්ධන වැඩසටහනකි. අයහපත් කාලගුණික තත්වය මධ්‍යයේ 2,500 කට වැඩි පිරිසකගේ සක්‍රිය සහභාගිත්වයෙන් මාර්තු 12 දින සම්මු නගරික 1 සුපිරි ධාවන තරඟය සාර්ථකව පැවැත්වූ අතර, එදින වැඩසටහන් කාගේත් සිත් පැහැර ගැනීමට සමත් විය.



ශ්‍රී ලංකාව පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක අත්පත්‍රිකා නරඹන්නන් අතර බෙදා දෙන ලදී. ශීත කාලගුණය ජයගැනීම සඳහා ක්ෂණිකව සංවිධානය කළ උණුසුම් ශ්‍රී ලංකා තේ පැන් සංග්‍රහ කිරීමේ ස්ථානයක් ඉදි කෙරිනි.



## ජපානයේ ආගමික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

ජපානයේ බෞද්ධ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ඉන්දියානු සිනමා තරුවක් වන ගගන් මලික් සිද්ධාර්ථ ලෙස රඟන ජනප්‍රිය බෞද්ධ චිත්‍රපටයක් වන "ශ්‍රී සිද්ධාර්ථ ගෞතම" හි කොටස් ප්‍රදර්ශනය කරන ප්‍රදර්ශනයක් පැවැත්වීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.





## ක්යෝතෝ ප්‍රදර්ශනයේ වීඩියෝ ප්‍රදර්ශන

බෞද්ධ හා සංස්කෘතික පරිශ්‍රයන් නිරූපණය කරන කියෝතෝ ප්‍රදර්ශනය මැයි 1 දා සිට ඔක්තෝබර් මස 30 දක්වා ජපානයේ ක්යෝතෝ ආගමික සංස්කෘතික ප්‍රදර්ශන ශාලාවේදී පැවැත්විණි.

**මැලේසියාව**

| | |
|---|---|
| පදිංචි රට | මැලේසියාව |
| භාෂාව | මැලේසියානු |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 29% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 30 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 25 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 18 |
| විවේක සංචාරකයන් 2015 | 14,392 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 23 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 20 |
| සමස්ත පැමිණීම් 2015 | 22,772 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 160 |
| නිවාඩු කාලය (දින) 2015 | 8 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 18,226,734 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 28,839,577 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## MAATA සංචාරක ප්‍රදර්ශනය

MAATA සංචාරක ප්‍රදර්ශනය මැලේසියානු සංචාර හා සංචාරක නියෝජිතයින් සහ සංචාරක හා සංස්කෘතික අමාත්‍යාංශය (Mo TaC) විසින් සංවිධානය කර තිබුනි. එය සංචාරක වෙළෙඳාම සඳහා විශේෂිත B2C ව්‍යාපාරයකි. මැලේසියාවේ පුත්‍රාලෝක මධ්‍යස්ථානයේ 2016 සැප්තැම්බර් 2 සහ 04 යන දිනවල ප්‍රදර්ශනය පැවැත්විනි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය MATTA 2016 ප්‍රදර්ශනය සඳහා වාර්ෂික සංචාරක ප්‍රවර්ධන ප්‍රයත්නයක් ලෙස සහභාගී විය.




ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශය පෞද්ගලික අංශයේ සංචාරක කර්මාන්තයේ අනාගතය උදෙසා MATTA Fair හි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට සහභාගී වන ලෙස සංචාරක හා වෙළඳ කර්මාන්ත සංවිධාන වලට ආරාධනා කෙරේ. MATTA මැලේසියාවේ ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයක් මෙන්ම ලෝක සංචාරක සංසදයේ වඩා ප්‍රසිද්ධම ප්‍රදර්ශනයක් ලෙස ඉදිරි ගමනක් සටහන් කර ඇත. මෙම ප්‍රදර්ශනය තුල ඇසුරුම් ද්‍රව්‍ය, සංචාර හා සංචාරක සංගම්, ක්ෂේත්‍රයේ නිෂ්පාදන ව්‍යාපාරික සේවා සහ ප්‍රදර්ශන කර්මාන්ත දැකගත හැක. පසුගිය වසරට සාපේක්ෂව මේ වසරේ සහභාගිත්වය වැඩි වී තිබුනද MATTA ප්‍රදර්ශනය පැවති දින තුන තුළ නරඹන්නන් 91,664 ක් පැමිණ ඇත.



ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පසුගිය වසර කිහිපය තුළ මේ සඳහා සහභාගි වී ඇති අතර මෙවර 12 කට අධික සංචාර ආයතන සංඛ්‍යාවක් මේ සඳහා සහභාගීවී කර ගෙන ඇත. ඒවා නම් සීමා. Deluxe vacations (පුද්.) සමාගම, සීමා. Holiday Park (පුද්.) සමාගම, Jetwing Travelsa, සීමා. ග්‍රීන් හොලිඩේ සෙන්ටර් (පුද්.) සමාගම, ද කිංග්ස්බරි සමාගම,

ලංකා ස්පෝර්ට්රයිසන්, M ට්‍රැවල්ස්, අමායා රිසෝට්ස් ) ස්පාස් (Amaya Leisure Plc-, ක්ලැසික් ලංකා ට්‍රැවල්ස්, සීමා. B.O.C ට්‍රැවල්ස් (පුද්.) සමාගම, එයිට්කන් ට්‍රැවල් හා කැම්ලෝ ලංකා ටුවර්ස් සහභාගි විය. ශ්‍රී ලංකා මණ්ඩපය මැලේසියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් ඉබ්රාහිම් සයිබ් අන්සාර් ගරු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ විසින් උත්කර්ශවත් ආකාරයෙන් විවෘත කරන ලදී.



## මැලේසියානු සංචාර නියෝජිත හුරුකරවීමේ සංචාරය

දෙසැම්බර් 20 සිට 27 තෙක් පැවති ශ්‍රී ලංකන් ගුවන් සේවා නියෝජිතයින් 11+ 1 දැනුවත් කිරීමේ සංචාරය සඳහා සහභාගී විය. එහි නියෝජිතයින් මීගමුව නගරය, මාළු වෙළෙඳපොළ, පින්නවල අලි අනාථාගාරය, දඹුල්ල ලෙන් විහාරය, සීගිරිය පර්වතය, මහනුවර නගරය, දළදා මාලිගාව, මහනුවර සංස්කෘතික සංදර්ශනය, පේරාදෙණිය උද්භිද උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය, හක්ගල උද්භිද උද්‍යානය, සීතා අම්මාන් කෝවිල, කතරගම හින්දු කෝවිල, කිරිවෙහෙර, හික්කඩුව වෙරළ, ගංගාරාම විහාරය, කොළඹ නගර සංචාරය යනාදී සංචාරක ප්‍රදේශ ආවරණය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක වෘත්තිකයන් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර B2B හමුවක් පැවතුනි. ශ්‍රී ලංකා ලංකන් එයාර් ලයින්ස් මගින් FOC පදනම් කරගත් ප්‍රවේශපත් මේ සඳහා ලබාදුනි.







## BERJAYA TIMES SQUARE පාරිභෝගික ප්‍රවර්ධනය - ක්වාලාලම්පූර්

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරන ලද පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන දෙසැම්බර් 16 වැනිදා පෙ.ව. 10 සිට ප. ව. 10 දක්වා BERJAYA TIMES චතුරස්‍රයේදී පැවැත්වුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති හා ශ්‍රී ලංකීය සංචාරක සමාගම් 10 ක් මෙම අවස්ථාවට සහභාගී විය. ක්‍රීඩා සහ කූපපත් ඇදීම සංවිධානය කර තිබුණි.





## ආහාර උත්සවය

ආහාර ප්‍රසංගය මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර Intercontinental හෝටලයේ දී 2016 දෙසැම්බර් මස 15 සිට 18 වන දා දක්වා පැවැත්විනි. සූපවේදීන් දෙදෙනෙකු සහභාගී වූ අතර අනෙකුත් වියදම් දරනු ලැබුවේ ගල්කිස්ස හෝටලය විසිනි. (ගුවන් ටිකට්පත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගිනි)







## ව්‍යාපාරික සංසදය

ශ්‍රී ලංකා හා මැලේසියානු ව්‍යාපාරිකයින් හා ආයෝජකයින් සහභාගී වූ ව්‍යාපාරික හමුවක් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම රැස්වීම දෙසැම්බර් මස 15 වන දින දෙරටේ වෙළඳාම සහ ආයෝජන අවස්ථාවන් වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ක්වාලාලම්පූර් Intercontinental හෝටලය දී පැවැත්විණි.




ශ්‍රී ලංකාව හා මැලේසියානු ආයෝජකයින් විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිවරයා ව්‍යාපාරික සංසදය වෙත් ඉදිරිපත් කිරීමක් සිදු කළේය.




## ක්වාලාලම්පූර් SURAYA KLCC හි පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන

මැලේසියාවේ ශ්‍රී ලංකා කොමසාරිස්වරයා විසින් විවෘත වූ ක්වාලාලම්පූර් SURAYA KLCC හි ශ්‍රී ලංකා කුටිය දෙසැම්බර් මස 13 දින පෙ. ව. 10 සිට ප.ව. 10 දක්වා පැවැත්විනි. අතිගරු ජනාධිපතිතුමා 17 වැනි දින කුටි නැරඹූ අතර ශ්‍රී ලාංකික සංචාරක සමාගම් 10 ක් සහභාගී වෙමින් පාරිභෝගිකයින් 400 කට වැඩි පිරිසක් දිනපතා කුටි නැරඹීමට පැමිණ තිබුනි.







මාධ්‍ය සම්මුඛ සාකච්ඡාව හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති සහ අලෙවි අධ්‍යක්ෂක හමුව.

බර්නාමා නාලිකාව MATTA සභාපතිවරයා හමුව





මාධ්‍ය සම්මුඛ සාකච්ඡාව - - - Utusan

TRaxx FM හි සජීවී ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡාව



මැලේසියානු සංචාරක හා සංස්කෘතික අමාත්‍යාංශයේ මහ ලේකම් හමුවීම



## ජාතික දින ප්‍රකාශනය, මැලේසියාව

2016 පෙබරවාරි මස 04 වන දින මැලේසියානු ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කළ ජාතික දින ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය දායක විය.




## පොත් පිංච පරිවර්තන කිරීම

පොත් පිංච තුනක් මැලේසියානු භාෂාවට පරිවර්තනය කර ඇත. (ආශ්වාදය, උරුමයන් සහ දර්ශන තලයන

## සිංගප්පූරුව

| | |
|---|---|
| පදිංචි රට | සිංගප්පූරුව |
| භාෂාව | ඉංග්‍රීසි, මැලේ, දෙමළ |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 18% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 34 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 27 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 30 |
| විවේක සංචාරකයන් 2015 | 9,206 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 27 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 24 |
| සමස්ත පැමිණීම් 2015 | 15,846 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 194 |
| නිවාඩු කාලය (දින) 2015 | 8 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 14,319,381 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 24,647,502 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## සිංගප්පූරුවේ මාර්ග ප්‍රදර්ශනය

ව්‍යාපාරික කටයුතු වල නිරත විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් ඵලදායී රැස්වීමක් 2016 ජූලි 08 වන දින පැවැත්විනි.



## ජාතික දින ප්‍රකාශය, සිංගප්පූරුව

2016 පෙබරවාරි මස 04 වන දින සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කළ ජාතික දින ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය දායක වී ඇත.



## දකුණු කොරියාව

| පදිංචි රට | දකුණු කොරියාව |
|---|---|
| භාෂාව | කොරියානු |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 20% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 31 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 29 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 29 |
| විවේක සංචාරකයන් 2015 | 10,737 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 36 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 28 |
| සමස්ත පැමිණීම් 2015 | 14,373 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 7 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 11,618,186 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 15,552,592 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### කොරියා ලෝක සංචාරක පොළ (KOTFA)

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 වසරේ ජූනි 09 සිට එම මස 12 න දින දක්වා කාලය තුළ 4 වන වසරටත් කොරියානු ලෝක සංචාරක වෙළඳපලට සංචාරක කර්මාන්තයේ දේශීය හවුල්කරුවන් 10 ක් සමඟ සහභාගීවීමට කටයුතු යොදා ඇත. මෙම වැඩසටහනට සමගාමීව, දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව සෝල් හා බුසාන්හි මාර්ග ප්‍රදර්ශන කිහිපයක්ද සංවිධානය කෙරුණි.






2016 **KOFTA** සමගාමීව **SEOUL** සහ **BUSAN** මාර්ග ප්‍රදර්ශනය, කොරියාව.

2016 ජූනි 06 සිට ජූනි 15 දක්වා දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව සෝල් සහ බුසාන් යන නගරවල මාර්ග ප්‍රදර්ශන දෙකක් පවත්වනලදී.





### ශ්‍රී ලංකාවෙන් දකුණු කොරියාවේ SEOUL සත්තුවත්ත වෙත ලබා දුන් ශ්‍රී ලාංකික අලි දෙදෙනෙකුගේ උපන් දින සැමරුම







ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව සෝල් සත්තුවත්තට පරිත්‍යාග කළ අලි පැටවුන් දෙදෙනා වන ගජබා සහ සුගලාගේ උපන් දින සැමරීම ශ්‍රී ලාංකික සංස්කෘතික සන්ධ්‍යාව සංවිධානය කිරීමේ අරමුණ සත්වෝද්‍යානයට පැමිණෙන අමුත්තන් අතර ශ්‍රී ලංකා නාමය ප්‍රවර්ධනය කිරීම සඳහාය.

### කොරියානු ගුවන් විදුලි විකාශන පද්ධතිය

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ බාහිර මාධ්‍යවේදී වැඩසටහන යටතේ ජනවාරි 7 වන දින සිට 16 වන දින දක්වා කොරියානු ගුවන්විදුලි පද්ධති (KBS) රූපවාහිනී නාලිකාවේ මාධ්‍ය දැනුවත් කිරීමේ සංචාරයක් පැවැත්වීය. පින්නවල, අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, මහනුවර විහාරස්ථානය, නගර හා උද්භිද උද්‍යානය, නුවරඑළිය, හෝර්ටන්තැන්න, මිරිස්ස, ගාලුකොටුව සහ ගාලු නගරය, හික්කඩුව, බෙන්තොට යනාදී සංචාරක වැදගත් කමක් ඇති ප්‍රදේශ සංචාරය කෙරිනි. මිනිත්තු 50 පමණ දිගු "Walkingin the world" වාර්තා චිත්‍රපටය සකස් කර කොරියන් ජාතිකයන් ඉලක්ක කර ගත් මෙම වැඩසටහන 2016 සැප්තැම්බර් 04 වන සෙනසුරාදා උදේ 9.40 ට Hong Kong Picture (Everywhere K) හරහා විකාශනය කෙරිනි.



### LONELY PLANET සඟරාව

බාහිර මාධ්‍යවේදී වැඩසටහන - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පසුගිය 28 වන දින සිට 04 දින දක්වා කොරියාවේ LONELY PLANET සඟරාව සඳහා මාධ්‍ය සංචාරකයක් බාහිර මාධ්‍යවේදී වැඩසටහන යටතේ පැවැත්විනි. එහි මාධ්‍යකරුවන් 04 දෙනෙකු කොළඹ, පින්නවල, හබරණ, මින්නේරිය ජාතික වනෝද්‍යානය, සීගිරිය, දඹුල්ල, මහනුවර, නුවරඑළිය, ඇල්ල, කොග්ගල, ගාල්ල, මිරිස්ස, බෙන්තොට යනාදී සංචාරක ප්‍රදේශ වල සංචාරකය කරවන ලදී. පිටු 11, 01, 12 කින් සමන්විත "4 days 3 nights Sri Lanka" Sri Lanka" paradisefor the restless" To the Island of Ceylon" ලිපි 3 ක වාර්තාවක් කොරියානු ජාතිකයන් ඉලක්කකර සකස් කළ වැඩසටහන 2016 අප්‍රේල් මාසයේදී VOGUE සඟරාව හරහා පල කෙරිනි.

ඉන්දියාවේ ප්‍රධාන පෙළේ සඟරා වන Lonely Planet සහ කොරියා හෙරල්ඩ් සඟරාව හරහා ආසන්න වශයෙන් 35,000 ක් පමණ පාඨක පිරිසක් අතරට පත් වුනි (මසකට).

### BUDDHIST TRUE ජාලය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 අගෝස්තු 14 සිට එම මස 18 දක්වා ඊ෉෈ෂීඔ ඔසෟඹෑ ජාලයේ මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාවක් සංවිධානය කෙරිනි. එහි මාධ්‍යකරුවන් 03 දෙනෙකු මහනුවර, සීගිරිය, අනුරාධපුර, කැලණි විහාරය, ගංගාරාම

විහාරය, යනාදී සංචාරක ප්‍රදේශ ආවරණය කරමින් නරඹනු ලැබිනි. "Sri Lanka & Sri Lanka Buddhism" නමින් එක් කථාංගයක් විනාඩි 45 ක් දිගු වාර්තා චිත්‍රපට සහ වාර්තා චිත්‍රපට 2 ක් කොරියානු ජාතිකයන් ඉලක්ක කර සකස් කළ අතර ඒවා 2016 ඔක්තෝබර් මාසයේදී ඊඹෲෂීඹ ඔසෲඹෑ ජාලය නරඹන මිලියන 14 ක් පමණ නරඹන්නන් වෙත සමීප කරවීමට හැකි විය.

## තායිලන්තය

| පදිංචි රට | තායිලන්තය |
|---|---|
| භාෂාව | තායි |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | -1% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 39 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 37 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 33 |
| විවේක සංචාරකයන් 2015 | 7,527 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 38 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 38 |
| සමස්ත පැමිණීම් 2015 | 10,112 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 8 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 9,872,413 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 13,262,899 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## THAI අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශනය, තායිලන්තය

තායිලන්ත ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තායි ජාත්‍යන්තර සංචාරක වෙළඳපල (TITF) වෙත ප්‍රථම වරට 2016 පෙබරවාරි 17 සිට පෙබරවාරි 21 වන දින දක්වා සහභාගී විය. TITF යනු නරඹන්නන් 800,000 අධිකව සහභාගි වන දේශීය හා විදේශීය කුටි 400 කට වඩා අධික සංඛ්‍යාවකින් යුත් තායිලන්තයේ විශාලතම බාහිර වෙළඳ ප්‍රදර්ශන ස්ථානයයි.









## තායිලන්තයෙන් ව්‍යාපාර පුහුණු කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් තායි සංචාරක නියෝජිත ආයතන 10 ක් සඳහා 2016 අගෝස්තු මස මුල් කාලයේදී දැනුවත් කිරීමේ චාරිකාවක් සංවිධානය කෙරිනි.





### තායි පොත් පිංච මුද්‍රණය කිරීම

සොලෝස්මස්ථාන පොත් පිංච තායි භාෂාවෙන් මුද්‍රණය කෙරිනි. පොත් පිංච පත්‍රිකා තුනක් (උත්සව, උරුමයන් හා දර්ශනීය) මෙලෙස පරිවර්තනය කිරීම් කර ඇත.

### TRAVEL AROUND THE WORLD සඟරාව

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 මැයි මස 24 සිට මැයි 30 වන දින දක්වා TRAVEL AROUND THE WORLD සඟරාවේ මාධ්‍ය හුරුකරවීමේ සංචාරයකට දායක විය. එහි මාධ්‍ය කරුවන් 02 දෙනෙකු කොළඹ, අනුරාධපුරය, මහනුවර සහ ගාල්ල යන සංචාරක ප්‍රදේශ ආවරණය කරවල ලදී. පිටු 5-6 කින් යුත් "Sri Lanka Beyond expectation" වාර්තා ලිපි තායි ජාතිකයන් ඉලක්ක කර සකසා 2016 ජූලි මාසයේදී TRAVEL AROUND THE WORLD සඟරාවේ පළ කෙරිනි. තායිලන්තයේ ප්‍රධාන පෙළේ සඟරාව වන TRAVEL AROUND THE WORLD සඟරාව හරහා ආසන්න වශයෙන් 50,000 ක් පමණ වන ප්‍රේක්ෂක ජනතාවකට පණිවුඩය ගෙන යාමට හැකි විය.

## මැද පෙරදිග

| පදිංචි රට | මැද පෙරදිග |
|---|---|
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 94% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 2 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| විවේක සංචාරකයන් 2015 | 63,470 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 6 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| සමස්ත පැමිණීම් 2015 | 101,066 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 174 |
| නිවාඩු කාලය (දින) 2015 | 11 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 116,126,299 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 184,912,880 |

| **පදිංචි රට** | **විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම** |
|---|---|
| සවුදි අරාබිය | 13 |
| ඕමාන් | 28 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 30 |
| ඊශ්‍රායෙල් | 38 |
| කුවේටය | 39 |
| වෙනත් (මැද පෙරදිග) | 19 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



## JTTX 6 ජෙඩා සංචාරක වෙළඳපල, මැද පෙරදිග

ජෙඩා ගමන් හා සංචාරක වෙළඳපල (JTTX) ගල්ෆ් කලාපයේ විශාලතම ගමන් හා සංචාරක අලෙවිකරණ මැදිහත්වීම ලෙස සැලකෙන අතර සෞදි අරාබියේ දී නැරඹිය යුතුමල ස්ථාන අතරින් එකක් ලෙස සැලකේ. ලෝකයේ විවිධ කලාප වලින් සංචාරක කර්මාන්තයේ විවිධාකාර වූ පැතිකඩයන් ප්‍රදර්ශනය ඇති කරමින් ජාත්‍යන්තර සංචාරකයන් සහ ලොව පුරා මාධ්‍ය අවධානය දිනා ගැනීමට සමත් විය.




ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සමාගම් 11 ක් මෙම වසරේදී සහභාගි විය. මෙම වෙළඳපල 2016 පෙබරවාරි මස 03 වන දින සිට 05 වැනිදා දක්වා පැවැත්විය.





## IMTM, අන්තර්ජාතික මධ්‍යධරණී සංචාරක වෙළෙඳපොළ - මැද පෙරදිග ඊශ්‍රායලයේ ටෙල්අවිව් නුවර

IMTM 2016 පෙබරවාරි මස 09 සිට 2016 පෙබරවාරි මස 10 දක්වා මැද පෙරදිග සංචාරකයන්, සංචාරක නියෝජිතයින්, සංචාර මෙහෙයුම්කරුවන් සහ මාධ්‍ය ඉලක්ක කරගෙන පැවැත්විය.

## අරාබි සංචාරක වෙළෙඳපොළ

අරාබි සංචාරක වෙලඳපොල අප්‍රේල් 25 වන සඳුදා සිට දින හතරක් පුරා අරඹමින් ව්‍යාපාරික ජාල අවස්ථා, එලදායී සම්මන්ත්‍රණ සැසි, නායකත්ව සංසද සහ මාස 12 ක ක්ෂේත්‍රයේ සාර්ථකත්වය හුවා දක්වනු ලැබිනි. ඩුබායි හි ඔටුන්න හිමි කුමරු වන ෂෙයික් හම්දාන් බින් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්තූම් සහ ඩුබායි විධායක සභාවේ සභාපති ලොව පුරා ප්‍රදර්ශකයින් 2500කට අධික පිරිසක් සහභාගී වූ මෙම විශිෂ්ට උත්සවය විවෘත කිරීමට එක්විය.





### ඕමාන්හි මාර්ග ප්‍රදර්ශනය

ඕමාන්හි සංචාරක මාර්ග ප්‍රදර්ශනය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් 2016 මැයි 01 වන දින සාර්ථක ලෙස පවත්වන ලදී. මිලියන 4.2 ක ජනගහනයක් සහිත ඕමාන්හි මැදපෙරදිග ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සංචාරක වෙළඳපොළ වේ.





### RTF වෙළෙඳ ප්‍රදර්ශනය (රියාද් සංචාරක වෙළඳපල)

2016 අප්‍රේල් 12 සිට 15 දක්වා රියාද් සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගි විය. RTF 2016 සමාලෝචන වාර්තා අනුව නරඹන්නන් 25,000 ක් සහ සංචාර නියෝජිතයින් 2,982 ක් වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ අතර කුටි 202 ක් පමණ ඉදි කර තිබුනි. රියාද් ගමන් හා සංචාරක කටයුතු ප්‍රදර්ශනය (RTF) ගල්ෆ් කලාපයේ විශාලම ගමන් හා සංචාරක අලෙවිකරණ ප්‍රදර්ශනය හා සවුදි අරාබියේ අනිවාර්යයෙන්ම බැලිය යුතු ("must visiting") ස්ථාන වලින් එකක් ලෙස සැලකේ. ලෝකයේ විවිධ කලාප වලින් සංචාරක කර්මාන්තයේ විවිධාකාර වූ දර්ශන ඇති කරමින් ජාත්‍යන්තර සංචාරකයන් සහ ලොව පුරා මාධ්‍ය අවධානය දිනා ගැනීමට සමත් විය.එ

### WINTER FESTIVAL පාරිභෝගික ප්‍රවර්ධන DUBAI MEDIA CITY AMPHITHEATRE – 2016 දෙසැම්බර් 08 සිට 10 දක්වා

ඩුබායි මීඩියා City Amphitheater පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහනෙහි ශීත ඍතු උත්සවය 2016 දෙසැම්බර් 08 සිට දෙසැම්බර් 10 දක්වා පැවැත්වීමට නියමිතය. මෙම උත්සවය ඩුබායිහි දී වාර්ෂිකව පවත්වනු ලබන ජනප්‍රිය වැඩසටහනක් වන අතර 2015 දී නරඹන්නන් 30,000 කට අධික ප්‍රමාණයක් මෙම අවස්ථාවට සහභාගි වූහ. පසුගිය වසරේ වාර්තාගත පැමිණීම් මිලියන 34 ඉක්මවා ගියත් ඉන් මිලියනයක් පමණ අරාබි ජාතිකයන් විය. මෙම උළෙල ඩිජිටල්, රූපවාහිනී, එළිමහන්, ගුවන්විදුලි, සමාජ මාධ්‍ය, කෙටි පණිවුඩ, ප්‍රචාරණ වැඩසටහන්, ප්‍රචාරණ ක්‍රම, මුද්‍රිත වෙළඳ දැන්වීම් සහ කතු වැකි මගින් ප්‍රචරණය කෙරේ.








## ඕමන් ෆෑම් සංචාරය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB- විසින් 2016 ඔක්තෝබර් මස 13 සිට ඔක්තෝබර් 17 තෙක් ඕමාන් සංචාරක නියෝජිතයන් 11 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කරන ලදී. මෙම සංචාරක ව්‍යාපාරය මගින් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ඕමාන් සංචාරක නියෝජිතයන් අතර ශ්‍රී ලංකාව ජනප්‍රිය කිරීමට අපේක්ෂා කෙරේ.

## ඊශ්‍රායෙලයේ THE TIMES" JEWLICIOUS මාධ්‍ය

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 ඔක්තෝබර් 23 දින සිට ඔක්තෝබර් 29 දක්වා ඊශ්‍රායෙලයේ Jewlicious Media නාලිකාව සඳහා දැනුවත් කිරීමේ චාරිකාවක් සංවිධානය කෙරිනි. එහි මාධ්‍යකරුවන් 02 දෙනෙකු කොළඹ, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය, බෙන්තොට යනාදී සංචාරක ප්‍රදේශ ආවරණය කරන ලදී. "The times of Israel" Jewlicious Media" නමින් විනාඩි 3-5 වාර්තාමය චිත්‍රපටයක් ඊශ්‍රායල් ජාතිකයන් ඉලක්ක කර සකසා එය 2016 දෙසැම්බර් ඊශ්‍රායල් ටයිම්ස් Jewlicious Media හරහා පල කෙරිනි.

## නැගෙනහිර යුරෝපය

| පදිංචි රට | නැගෙනහිර යුරෝපය |
|---|---|
| භාෂාව | |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 26% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 9 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 5 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| විවේක සංචාරකයන් 2015 | 83,780 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 4 |
| සමස්ත පැමිණීම් 2015 | 148,458 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 167 |
| නිවාඩු කාලය (දින) 2015 | 8 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 117,183,857 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 207,649,570 |

| පදිංචි රට | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| රුසියාව | 7 |
| චෙක් ජනරජය | 22 |
| යුක්රේනය | 24 |
| පෝලන්තය | 26 |
| වෙනත් (නැගෙනහිර යුරෝපය (දකුණු ආසියාව)) | 40 |

## රුසියාව

| පදිංචි රට | රුසියාව |
|---|---|
| භාෂාව | රුසියානු |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 10% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 36 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 8 |
| විවේක සංචාරකයන් 2015 | 36,833 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 8 |
| සමස්ත පැමිණීම් 2015 | 61,846 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 181 |
| නිවාඩු කාලය (දින) 2015 | 11 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 70,179,020 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 117,837,039 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### මොස්කව් ජාත්‍යන්තර ගමන් සහ සංචාරය - රුසියාවේ මොස්කව්

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB- රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව 2016 මාර්තු 23 සිට මාර්තු 26 දක්වා මොස්කව් ජාත්‍යන්තර ගමන් හා සංචාරක ප්‍රදර්ශනය රුසියාවේ මොස්කව් නුවර එක්ස්පෝ සෙන්ටර් හි Fairgrounds පැවැත්විය.





### රුසියානු ජාතික දින සැමරුම සමග ශ්‍රී ලංකා ජාතික දිනය

මෙම උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු අමාත්‍යතුමා සහභාගී වූ අතර ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන මාධ්‍යකරුවන් සමග හමුවීම් පැවැත්වීය. සංචාර සංවිධායකවරුන් සමග වටමේස රැස්වීම් 5 ක් "මොස්කව් ප්‍රදේශයේ දී පැවැත්වුණි.






## OTDYKH 2016 ක්ෂේත්‍ර අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශනය – මොස්කව්, රුසියාව

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB- රුසියාවේ ප්‍රධාන ගමන් හා සංචාරක ප්‍රදර්ශනය වන OTDYKH සංචාරක ප්‍රදර්ශනය සඳහා සහභාගී විය. 2016 දී OTDYKH ජාත්‍යන්තර සංචාරක වෙළෙඳපොළ තම 22 වන සැමරුම නිමිත්තෙන් සැප්තැම්බර් 21 වෙනිදා සිට සැප්තැම්බර් 24 දක්වා එය රුසියාවෙහි මොස්කව් එක්ස්පෝ කේන්ද්‍ර ප්‍රදර්ශන භූමියේ පැවැත්විනි.






පළමු දින දෙක ව්‍යාපාරිකයන් සඳහා පමණක් වෙන් වුන අතර තෙවන දිනය මහජනතාවට විවෘත විය. එහිදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය නියෝජනය කරනු ලැබුවේ සහකාර අධ්‍යක්ෂිකා -අලෙවි මධුශා පෙරේරා මිය විසිනි.



ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය අමුත්තන්ගේ අවධානයට ලක්වූ ඉතා ආකර්ෂණීය හා වර්ණවත් එකක් විය. රුසියානු සංචාරකයන් අතර රට පිළිබඳව ධනාත්මක චිත්‍රයක් මැවෙන හා දැනුවත් බවක් ඇති වන ලෙස ප්‍රචලිතබව, සාරය, උරුමය, උත්සව සහ ආශිර්වාදය යන තේමාවන් අටකින් යුත් වර්ණවත් ඡායාරූප වලින් ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රදර්ශන කුටිය අලංකාර ව තිබිනි. ශ්‍රී ලංකා කුටිය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරන ලද අතර කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් 10 දෙනෙකු සමඟ ඊට සහභාගී විය. ශ්‍රී ලංකා කුටිය විවෘත කරනු ලැබුවේ රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති සමන්ත පතිරණ මැතිතුමා විසිනි.

### චෙක් ජනරජය

| පදිංචි රට | චෙක් ජනරජය |
|---|---|
| භාෂාව | චෙක්, ස්ලෝවැකියානු, ජර්මානු, පෝලන්ත, රෝමනි, |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 102% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 5 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 22 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 17 |
| විවේක සංචාරකයන් 2015 | 14,669 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 26 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 26 |
| සමස්ත පැමිණීම් 2015 | 15,278 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 10 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 24,290,324 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 25,298,764 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය






## ප්‍රග් නිවාඩු ලෝකය - චෙක් ජනරජය

චෙක් ජනරජයේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් මෙම උත්සවය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ සමාගම් 4 ක් මෙම උත්සවය නියෝජනය කෙරිනි.






නැගෙනහිර යුරෝපයේ අළුත්ම මතු වී එන සංචාරක මධ්‍යස්ථානවල වැදගත්කම සැලකිල්ලට ගනිමින් Ceylon Roots, Asian Adventures,Aitken Spence Travels (Pvt- Ltd., Journey Escapes, Lanka Sportreizen, Tropical Asia Tours, Deluxe Vacations, Pledge Holidays, Camlo Lanka Tours, Clover LankaTravels, Coral Sands Hotel, Green Holiday Centre, NKAR Travels and Tours, Andrew The Travel Comany, Jetwing Travels (Pvt-Ltd., Ayubowan Tours and Travels, E-Turismo Lanka, Golden Isle Travels, Sunway Holidays and Qatar Airwas කර්මාන්තයේ නිරත සාමාජිකයන් ලෙස සහභාගී වූහ.



ව්‍යාපාරික නිපුනයන් 35 දෙනෙකු සහ මාධ්‍ය වේදීන් 20 දෙනෙකු පෝලන්තයෙන්ද, වෙළෙඳ වෘත්තිකයින් 39 සහ මාධ්‍ය වෘත්තිකයින් 17 චෙක් ජනරජය නියෝජනය කරමින්ද වෘත්තියවේදීන් 56 සහ මාධ්‍ය වෘත්තිකයෝ 23 හංගේරියාවේ සිට සහභාගී වූහ.



## චෙක් ජනරජයේ හා හංගේරියාවේ පෝලන්ත මාර්ග සංදර්ශන - 2016 සැප්. 14, 16 සහ 19 යන දිනවල

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පෝලන්ත ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව නැගෙනහිර යුරෝපයේ පෝලන්තය, චෙක් ජනරජය සහ හංගේරියාව යන රටවල 2016 ඔක්තෝබර් 14, 16 සහ 19 යන දිනවල මාර්ග සංදර්ශන සංවිධානය කෙරිනි.

## පෝලන්තය

| | |
|---|---|
| පදිංචි රට | පෝලන්තය |
| භාෂාව | පෝලන්ත |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 47% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 22 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 26 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 31 |
| විවේක සංචාරකයන් 2015 | 8,649 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 30 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 32 |
| සමස්ත පැමිණීම් 2015 | 13,245 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 10 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 14,321,836 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 21,932,329 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




## TT WARSAW – ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය 2016 නොවැම්බර් 24 - 26 පෝලන්තයේ වෝර්සෝ

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පෝලන්තයේ වෝර්සෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව 2016 නොවැම්බර් 24 සිට 26 දක්වා පෝලන්තයේ වෝර්සෝහි ටැට් වෝර්සෝ සංචාරක චාරිකාව පැවැත්විය. NKAR Travels & Tours, Tropical Asia Tours and E-Turismo Lanka සම-ප්‍රදර්ශකයින් ලෙස මෙයට සහභාගී විය. මේ වසරේදී ශ්‍රී ලංකාව රටවල 60 ක් හා ප්‍රදර්ශකයන් 500 ක් පරයා හොඳම වෘත්තීය සහ ප්‍රධාන කුටිය සඳහා වූ විශිෂ්ඨතම සම්මානයෙන්ම පිදුම් ලැබුවේ එම්ටි ටාගි පොල්ස්කා අලෙවිපල සංවිධානය විසින් සංවිධානය කළ "homo Turisticus" නම් තරගයේදීය.

එම්ටි ටාගි පොල්ස්කා අලෙවිපල සංවිධානයේ නියෝජිතයන් හා මාධ්‍ය අංශයේ නියෝජිතයිගෙන් සමන්විත ජූරි සභාව විසින් කුටි ඇගයීමට ලක් කිරීම සිදු කෙරිනි. ජූරිය විසින් ශ්‍රී ලංකාව තෝරා ගැනීමේ නිර්නායකයන් අතර තථ්‍යබව සහ ක්‍රියාකාරිත්වය, සෞන්දර්යාත්මක නිර්මානය, නිරතුරු දෘෂ්‍යභාවය සහිතව වෘත්තීමය සේවාදායක සේවාව (අමුත්තන් සඳහා), ප්‍රවර්ධන ද්‍රව්‍ය, සබැඳි වැඩසටහන් ප්‍රදර්ශනය කිරීමේ වැඩසටහන් ආදිය ඇතුළත් වේ.



TT Warsaw යනු ජාත්‍යන්තර හා පෝලන්ත සංචාරක කර්මාන්තය නගාසිටුවීම සඳහා ව්‍යාපාර සබඳතා වර්ධනය කරන පෝලන්තයේ ඇති ප්‍රධානතම හමුවීමේ ස්ථානයකි. TT Warsaw වල සුවිශේෂී ලක්ෂණය වන්නේ කේවල හා ව්‍යාපාරික ගනුදෙනුකරුවන් හමුවීමට හැකි වීමත් පෝලන්තය ජාත්‍යන්තර ප්‍රවාහය තුල ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාවත්ය. ව්‍යාපාරික ගනුදෙනුකරුවන්ට ජාත්‍යන්තර ව්‍යාපාරික සංචාරකයින්ගේ රැස්වීම් වලට සහභාගී වී ව්‍යාපාරික සබඳතා ස්ථාපිත කිරීමේ සුවිශේෂී අවස්ථාවක් උදා වී තිබේ. එය ඵලදායී සාකච්ඡා, අත්දැකීම් හා දැනුම

සහ ඒ සියල්ල පරයා ගොස් පිරිනැමුම් සැසඳීම, නව සම්බන්ධතා අවසන් කිරීමට තුඩු දුන් පිරිනැමීම් සහ ලොව සියලුම ව්‍යාපාරික ස්ථාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා කදිම ස්ථානයකි. පළමුවෙනි දිනය කර්මාන්ත හා ව්‍යාපාර රැස්වීම් සඳහා වූ දිනයක් විය.



විනෝදජනක නිවාඩුවක් සඳහා තනි පුද්ගලයෙකුට ආශ්වාදයක් සොයාගත හැකි වුවද ටී ටී වෝර්සෝ විවිධ ස්ථාන, පහසුකම් සහ සංචාරක ආකර්ෂණ ස්ථාන ප්‍රවර්ධනය කරයි. රටවල් 60 කට වඩා වැඩි ප්‍රමාණයක සාම්ප්‍රදායික සංගීතය, දේශීය නැටුම් සහ සාම්ප්‍රදායික ජාතික ආහාර වේල් වැනි සම්ප්‍රදායයන් හා සංස්කෘතීන් දැන ගැනීම සඳහා මෙම ප්‍රදර්ශනය කදිම තෝතැන්නක් විය.





ALL - INCLUSIVE සඟරා ප්‍රකාශය, පෝලන්තය

පෝලන්තයේ ALL--INCLUSIVE සඟරාවෙහි පිටු දෙකක් පුරා වූ ලිපි ප්‍රකාශයට පත් කෙරිණි. මුල් පිටුව සැකසීම සහ සීගිරි චිත්‍රය සහිතව අභ්‍යන්තර පිටු පාඨකයන්ට ශ්‍රී ලංකාව පිළිබඳ මතක සටහන් තැබීමට සමත්වේ.






## ඕස්ට්‍රේලේසියාව

| පදිංචි රට | ඕස්ට්‍රේලේසියාව |
|---|---|
| භාෂාව | |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 35% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 8 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 6 |
| විවේක සංචාරකයන් 2015 | 43,791 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| සමස්ත පැමිණීම් 2015 | 71,672 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 161 |
| නිවාඩු කාලය (දින) 2015 | 11 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 76,058,661 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 124,483,943 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

| පදිංචි රට | විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම |
|---|---|
| ඕස්ට්‍රේලේසියාව | 8 |
| නිව්සීලන්තය | 34 |
| වෙනත් (ඕස්ට්‍රේලියාව) | 45 |

## ඕස්ට්‍රේලියාව

| පදිංචි රට | ඕස්ට්‍රේලියාව |
|---|---|
| භාෂාව | |
| පසුගිය වසර 03 තුළ වර්ධන අනුපාතය (2013 - 2016) | 34% |
| පසුගිය වසර 03 පුරා වර්ධන අනුපාතය විසින් ශ්‍රේණිගත කිරීම (2013 - 2016) | 29 |
| විනෝද ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 8 |
| නිවාඩු කාලය සඳහා පැමිණි සංචාරකයින් ශ්‍රේණිගත කිරීම 2015 | 6 |
| විවේක සංචාරකයන් 2015 | 38,730 |
| සමස්ත ආදායම ශ්‍රේණිගත කිරීම 2015 | 9 |
| සමස්ත පැමිණීම ශ්‍රේණිගත කිරීම 2015 | 7 |
| සමස්ත පැමිණීම් 2015 | 63,554 |
| දිනකට වැය වූ මුදල (ඇ. ඩො.) 2015 | 164 |
| නිවාඩු කාලය (දින) 2015 | 11 |
| විවේක සංචාරකයන්ගෙන් ලද ආදායම 2015 | 67,942,683 |
| මුළු සංචාරකයින්ගේ ආදායම (ඇ. ඩො.) 2015 | 111,490,558 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




### ඕස්ට්‍රේලියාව නගර 3 ක මාර්ග සංදර්ශන

මෙල්බන් නුවර සිට මාර්ග සංදර්ශන මාලාවක් 2016 මැයි මස 17 වන දින ඇරඹුන අතර 2016 මැයි 19 දින බ්‍රිස්බේන් හිදීත් 2016 මැයි 23 අවසන් විය. ඊට සංචාරක ව්‍යාපාර සම්බන්ධිත ශ්‍රී ලංකා නියෝජිතයින් 30 කුත් සිඩ්නි ඕස්ට්‍රේලියානු ව්‍යාපාරික නියෝජිතන් 250 ක් පමණ සහභාගී වූහ.







## PERL FISHER ඔපෙරාව - සිඩ්නි නුවර

ඕස්ට්‍රේලියාවේ පර්ල් ෆිල්ස් ඔපෙරා ලොව වටා සංචාරකයින් බොහෝ දෙනෙකු අතර ප්‍රසිද්ධය. පර්ල් ෆිෂර්ස් ප්ලැසිඩෝ ඩොමින්ගෝ සහ ඇන්ඩ්‍රියා බොචෙල්ලි වැනි ලෝක ප්‍රසිද්ධ කීර්තිමත් ඔපෙරා ගායකයින්ගේ යුග ගී සඳහා ප්‍රසිද්ධය.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සිඩ්නි හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල්වරයා සමඟ එක්ව ප්‍රවර්ධන වැඩසටහනක් සිඩ්නිහි සිඩ්නි ඔපෙරා හි ජෝඈන් සටර්ලන්ඩ් රඟහල තුල 2016 මාර්තු 12 වන දින සාර්ථකව සිදු කෙරිනි. පර්ල් ෆිෂර්ස් ඔපෙරා හි අවසන් කාලය තුල 1500 ක් වූ උතුරා ගිය ප්‍රේක්ෂක පිරිසකට රසාස්වාදය ලබා දෙන ලදී.








## පර්ලි ෆිෂර් ඔපෙරාව - මෙල්බෝන් නුවර

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2016 මැයි මස 28 වන දින මෙල්බර්න් හි කලා මධ්‍යස්ථානයේ සාර්ථකව අවසන් විය. පැල් ෆිශේස් ඔපෙරා හි අවසන් සංදර්ශනය පිරී ඉතිරී ගිය ශාලාවක පැවැත්වූ අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන පොත් පිංච සහ ලංකා තේ තෑගි ඇසුරුම් 1500 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එවා තිබූ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන පොත් පිංච අනුග්‍රාහක භවතුන් හට ලබා දෙන ලදී.



පර්ල් ෆිෂර් සංදර්ශනය කලා මධ්‍යස්ථානයේ ලොබියේ ඇති පුළුල් රූපවාහිනී තිරයේ ප්‍රදර්ශනය කෙරිණි. එය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව විශිෂ්ට ලෙස ප්‍රවර්ධන කිරීමේ වැඩසටහනක්ද වූයේ මෙම ඔපෙරාවෙහි පසුතල ලංකාවට ආවේනික නර්තන වලින් පිරි එම නළුවන් අතීතයේ වර්ණවත් සාරි සහ අලංකාරනයන්ගෙන් සැරසී සිටිමත් නිසාය.






## සංචාරක සංවිධානවල සාමාජිකත්වය - ඕස්ට්‍රේලියාව

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය ඕස්ට්‍රේලියානු සංචාරක නියෝජිත ආයතනවල සාමාජිකයෙකු බවට 2016 දී පත්විය.

## සංචාරක නියෝජිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන





2016 ඔක්තෝබර් මස 23 සිට 31 දක්වා වූ ඕස්ට්‍රේලියානු සංචාරක නියෝජිතයින් හුරුකරවීමේ සංචාරයක් පවත්වල ලදී.

## 2016 කැන්බරාහි ශ්‍රී ලංකා උත්සවය - ඕස්ට්‍රේලියාව

කැන්බරාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහාය ඇතිව ශ්‍රී ලංකා උත්සවය ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි 2016 නොවැම්බර් 12 වන දින සංවිධානය කර තිබේ. එහි අරමුණ වූයේ ඕස්ට්‍රේලියාවේ තුල ශ්‍රී ලංකාව ප්‍රචලිත කිරීම සහ ශ්‍රී ලාංකේය නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීම හරහා මෙම දිවයින සංචාරක ව්‍යාපාරය, ව්‍යාපාර සහ ආයෝජනය සඳහා ආකර්ශනීය ගමනාන්තයක් ලෙස හඳුන්වා දීමටය.





ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාල ශිෂ්‍ය කණ්ඩායමක් දැනුවත් වීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට පැමිණෙන ලදී.

## MR E TRAVELLER

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 ජනවාරි 26 සිට 2016 පෙබරවාරි 03 වන දින දක්වා MR E TRAVELLER මගින් මාධ්‍ය හුරු චාරිකාවක් බාහිර මාධ්‍යවේදී වැඩසටහන යටතේ සංවිධානය කෙරිනි. එහි මාධ්‍යකරුවන් දෙදෙනෙකු සංචාරක ප්‍රදේශ තුල සංචාරය කර ඕස්ට්‍රේලියානු ජාතිකයන් ඉලක්ක කර වෙබ් පිටු සකසා ඒවා 2016 ඔක්තෝබර් මාසයේදී MR E TRAVELLER හරහා විකාශනය කරන ලදී. ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන වෙබ් අඩවියක් වන MR E TRAVELLER දිනපතා 37,000 ක් පමණ සම්බන්ධ වේ.

## ජාත්‍යන්තර මාධ්‍ය කාර්ය මණ්ඩලය

ආරාධිත මාධ්‍යවේදීන්ගේ වැඩසටහන හමුව - 2016

2016 ජුලි 05 සිට ජුලි 15 දින දක්වා "MR E TRAVELLER" සඳහා මාධ්‍ය දැනුවත් කිරීමේ චාරිකාව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිදු කෙරිනි. එහි මාධ්‍යකරුවන් 03 දෙනෙකු කොළඹ නගරය, ගාල්ල ලන්දේසි කොටුව, නුවරඑළිය නගරය, තේ වගා, රාජකීය උද්භිද උද්‍යානය, මහනුවර සංස්කෘතික සංදර්ශනය, දළදා මාලිගය, සීගිරිය, මින්නේරිය සෆාරි, පොලොන්නරුව පෞරාණික ස්ථාන, ත්‍රිකුණාමලය නගර ප්‍රදේශය, නිලාවැලි මුහුදු වෙරළ, මඩකළපුව, ලන්දේසි කොටුව, මඩකලපුව කල්ලඩි පාලම, යනාදී සංචාරක ප්‍රදේශ මෙහිදී ආවරණය කෙරිනි.

"ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයට අදාළවන මාතෘකා" පිළිබඳ ලිපි සකස් කර ඕස්ට්‍රේලියානු ජාතිකයන්, බොස්නියානු ජාතිකයන්, හර්සෙව් ජාතිකයන් සහ වෙනත් රටවල් ඉලක්ක කර එම ලිපි 2016 ඔක්තෝබර් මස Mature Traveller තුල පල කරන ලදී.

## BLOGGING, වෙබ් අඩවි සහ ඩිජිටල් ව්‍යාපාර

අනුග්‍රහ දැක්වීම්

සිනමන් හෝටල් කළමනාකාරිත්වය සංවිධානය කළ "TBC ASIA 2016" සිනමන් ග්‍රෑන්ඩ්හි 2016 ජූනි 02 සිට 7 දක්වා පැවැත්විණි. මේ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය රු. මිලියන 3 ක අනුග්‍රාහකත්වය ලබා දුනි. හොඳම **Bloggers** ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට දිරිගැන්වීම හා එමගින් මෙරටට වැඩි වාසියක් ලබා ගැනීම මෙහි අරමුණ විය.




**Bloggers** 60 දෙනෙකු සඳහා පූර්ව සම්මන්ත්‍රණ චාරිකාවක් ලබා දීමට නියමිතව ඇති අතර ඉන් අනතුරුව සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී දිනක සම්මන්ත්‍රණයක් සහ සංචාරක Blogger සම්මාන පිරිනැමීම පැවැත්විනි. බ්ලොග්කරුවන් 60 ශ්‍රී ලංකාවේ මෙසේ සංචාරය කරන ලද අතර මෙම පිරිස හරහා ලොව පුරා සිටින දල වශයෙන් 3,000,000 ක් දෙනෙකුහට මෙය සංනිවේදනය වනු ඇත.









## එක්සත් රාජධානිය, ඇ.එ.ජ. සහ ඉතාලි බ්ලොග්කරුවන්

එක්සත් රාජධානියේ බ්ලොග්කරුවන් 05 දෙනෙකුත් ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය නියෝජනයන කරමින් බාහිර සංචාරක බ්ලොග්කරුවන් 12 දෙනෙකුත් 2016 මාර්තු 31 සිට 2016 අප්‍රියෙල් 9 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කෙරිනි. උසස්තම සංචාරක ව්‍යාපාර නිපැයුම්, නව සංචාරක නිපැයුම්, අප්‍රකට සංචාරක ස්ථාන හා ප්‍රධාන ඓතිහාසික ස්ථාන, ශ්‍රී ලාංකේය සංස්කෘතික අංග හා ආහාර පාන මෙහිදී ආවරණය කරගත් අතර බ්ලොග්, ෆෙස්බුක්, ෆෙස් බුක් සජීවී විකාශ, ඉන්ස්ටග්‍රෑම්, යූ ටියුබ් සහ පුවත් ලිපි වැනි මාධ්‍ය හාරහා ප්‍රසිද්ධියට පත් කෙරිනි.

සමාජ මාධ්‍ය හරහා යාවත්කාලීනයන් 350 ක් පමණ වූ සිදු වූ අතර, සති දෙකක් වූ ක්‍රියාකාරී ව්‍යාපෘතිය තුළ 300,000 ක් පමණ පිරිසක් ප්‍රතිචාර දක්වා තිබුනි.







## සංචාර මාර්ගෝපදේශක උපදේශන සැසිය – 2016 පෙබරවාරි 03

සංචාරක චාරිකා පිළිබඳ ගෝලීය අවබෝධතා සැකසීම පෙබරවාරි 2 වන දින මෙරට මොනාරා හෝටලයේදී ට්‍රිප් ඇඩ්වයිසර් විසින් පැවැත්විනි. මෙම සමුළුව සංචාරක පරිණාමය, සමාජ මාධ්‍ය ආකර්ශනය සහ ශ්‍රී ලංකාවේ ගෝලීය අවබෝධය යන තේමා යටතේ ට්‍රිප් ඇඩ්වයිසර් හටද අත්හදාබැලීමේ සැසියක් බවට පත් විය. ප්‍රධාන විධායක නිලධාරියා සහ e-සංචාරක දේශසීමා හි සමාරම්භකයා වන ඩේමියන් කුක් "online

context" තුළ ගමනාන්ත වෙළඳ නාම සහ තමා ලත් අත්දැකීම් පැමිණි සිටි පිරිස සමඟ හුවමාරු කරගන්නා ලදි. වඩාත් ප්‍රායෝගික හා ඵලදායී මාර්ගගත සැසි පැවැත්වීම මෙහි අරමුණ විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ හෝටල් සහ සංචාරක ව්‍යාපාර මෙම සැසියට සහභාගී විය. මෙම සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට මුලින්ම තීරණය වූයේ සිංගප්පූරුවේ මරීනා බේ සෑන්ඩ්ස්හි පැවැති අවසන් සමුළුවේ දී ට්‍රිප් ඇඩ්වයිසර් සමඟ පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙසය.

## ඇලයිට් ට්‍රැවලර් ඔන්ලයින් ප්ලැට්ෆෝමය සමඟ ඔන්ලයින් දැන්වීම් ප්‍රචාරණ ව්‍යාපාරය

EliteTraveler'Com හි හිමිකරු වන Elite Traveller Media Group යනු සුඛෝපභෝගී ජීවන රටාවේ ලොව ප්‍රමුඛයා වන අතරම සුඛෝපභෝගී ජීවන රටාව සහ සංචාරක වෙබ් අඩවිවල විස්තරාත්මක වෙබ් ලිපි, සම්මුඛ සාකච්ඡා, වීඩියෝ සහ විද්වත් බ්ලොග් ලිපි සපයන සහ කර්මාන්තයේ පාඨකයින්ගෙන් සමන්විත සුඛෝපභෝගී කාණ්ඩයකි. ඔවුන්හට අමුත්තන්ගෙන් 490,736 මාසිකව සාමාන්‍යයක් සහ මාසිකව සාමාන්‍ය ලෙස පිටු දර්ශන මිලියන 2.3 කින් සමන්විතව ඇත. Specialty යනු ඔවුන්ගේ ශක්තිමත් විද්‍යුත් තැපැල් සන්නිවේදන ජාලය වන අතර ඔවුන් හා සම්බන්ධ e-mail ග්‍රාහක සංඛ්‍යාව 18,000 කට වැඩි සංඛ්‍යාවකි. ඒ අතර පෞද්ගලික ජෙට් භාවිතා කරන්නන් ඇතුළු ලෝකයේ අතිවිශේෂිත හා මිල අධික සංචාරකයින් ද වේ. සුවිශේෂී ගෝලීය ජීවන රටා වෙළෙඳනාම නිරන්තරයෙන් Elite Traveller සමඟ දැන්වීම් ප්‍රචාරය කරයි. නිදර්ශන ලෙස Shangri-L හෝටල්, Bvlgari, ඇපල් ආදිය හෝටල් / නිකේතන / කුඩා සංචාරක - ආශ්‍රිත ව්‍යාපාර, ආහාර සහ බීම කර්මාන්ත, සිල්ලර, ප්‍රවාහන / සංචාරය මඟපෙන්වන්නන් / සාප්පු සවාරි/රාත්‍රී ගත කිරීම්, FBO /පෞද්ගලික ජෙට් සංචාරකයින් (ජෙට්යානා ඉන්ධන වලට හැර) එක් සංචාරයකට සාමාන්‍යයෙන් ඩොලර් 69,000 ක් වියදම් කිරීම නිසා පෞද්ගලික ගුවන් යානා පහසුකම් වලට බලපෑම් එල්ල වී ඇත. ET සමඟ දැන්වීම් ප්‍රචාරය කිරීම ශ්‍රී ලාංකික සංචාරකයින් සඳහා ස්ථිරසාරව වාසියක් අත් වනු ඇත. මෙමගින් රැකියා සහ රජයේ බදු ආදායම් වැඩි කිරීම සඳහා උපකාරී වනු ඇත.

## වෙබ් විශේෂාංග පලකිරීම්




ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය නිර්මාණය කරන ලද (රචිත හා පරිසණක සැකසුම්කළ) වෙබ් විශේෂාංගය Elite traveler වෙත යොමු කරන ලද්දේ ඉහළ තරාතිරමේ සංචාරක ප්‍රජාව වෙත පණිවුඩය රැගෙන යාමට මෙන්ම ඔවුන්ගේ අති ජනප්‍රිය වෙඩ්අඩවියේ පල කිරීම සඳහාය. 2016 නොවැම්බර් 08 වන දින ආරම්භ කරන ලද අතර 2016 නොවැම්බර් 30 වැනි දින වන විට සමස්ත පිටු දසුන් ප්‍රමාණය 435 කුත් පුද්ගලයෙකුගේ සාමාන්‍ය කියවීමේ කාලය විනාඩි 3 යි තත්පර 13 ක් විය. මෙම විශේෂාංගය සහ එහි ඇති සාර්ථකත්වය පාඨකයන්ගේ සිත් ඇද ගන්නා සුළුවේ.

ගූගල්හි Elite Traveller ශ්‍රී ලංකාවට ලබා දුන් පෞද්ගලික අභිරුචිය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2016 නොවැම්බර් 28 දින පරීක්ෂා කෙරිනි. පහත දැක්වෙන තිරයේ දැක්වෙන පරිදි ශ්‍රී ලංකා සංචාරක වෙබ් අඩවිය ගූගල් අවකාශයේ දී දෙවන ස්ථානයට පත් විය. එතෙර පාඨකයින් ශ්‍රී ලංකා වෙබ් අඩවිවල සැලකිය යුතු ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති බවට මෙය සාක්ෂි දරයි.



මීට අමතරව Elite Traveler විසින් මෙම විශේෂාංගය ඔවුන්ගේ පෞද්ගලික ගුවන් යානා හිමිකරුවන් 18,000 ක්, වෙබ් අඩවි සංචාරකයින් සහ පුවත්පත් වෙත Elite Traveler වෙබ් අඩවිය www'elitetraveler.com නව අන්තර්ගතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

තවද, Elite Traveler පල කළ විශේෂාංගය වැඩිදුර සොයාබැලීම් සඳහා 2016 නොවැම්බර 28 ගන්නා ලද රූපය පහත දක්වා ඇත.




## සුවිශේෂිත ඊ-තැපැල

විශේෂිත ඊ-තැපැල 18,000 ක් පමණ පෞද්ගලික ජෙට් යාත්‍රාකරුවන් වෙත සමීප විය. Elite Traveler ප්‍රචාරණ හවුල්කරුවන්ට තම හිමිකාර දත්ත ගබඩාව වන ලොව පුරා සිටින සංචාරකයින් 18,000 කට අධික පෞද්ගලික යාත්‍රා කරුවන්ගේ දත්ත වලට සුවිශේෂී ප්‍රවේශයක් ලබා දේ. තම වෙබ් අඩවියට සබැඳියක් ඇතුළත් තොරතුරු සපයන ලද එලිට් ට්‍රැවලර් සහතික කළ ඊ-තැපෑලක් ශ්‍රී ලංකාවට යැවිය හැකි වේ.

පහත දැක්වෙන ඉලෙක්ට්‍රොනික සෘජු තැපැල් අන්තර්ගතය SLTDA විසින් අනුමත කර ET වෙත යවන ලදී. මෙය පෞද්ගලික ජෙට් යානා අතර 2016 නොවැම්බර් 11 වන දින පළ කෙරිනි. සමස්ත තැපැල් පණිවුඩ 18,000 ක් සාර්ථකව යැවුන අතර සාමාන්‍ය විවෘත අනුපාතය 40.41% ක් ලෙස එනම් 5.98% ක් වන Click through අනුපාතය සමග සටහන් විය.







## සමාජ මාධ්‍ය

ශ්‍රී ලංකාවේ වෙබ් විශේෂාංගය තවදුරටත් Elite Travelers සමාජ මාධ්‍ය ජාල තුල ප්‍රවර්ධනය කෙරිනි. Elite Travelers' ෆෙස්බුක් පිටුව (13,000+fans) සහ ට්විටර් (30,000+) හා Elite Traveler වෙබ්අඩවිය මගින් විශේෂාංග ප්‍රවර්ධනය කිරීමට හා පල කිරීමට දෛනික අවස්ථාවන් සපයන ලදී. ට්විටර් සහ ෆෙස්බුක් හි පළ කරන ලද ප්‍රකාශ පහත තිර දර්ශනවල දැක්වේ.





## ශ්‍රී ලංකා වෙබ් බැනර්



ඉහත දැක්වෙන පරිදි සෑම සතියකම එලයිට් සංචාරක Traveler පුවත් ලිපියේ ශ්‍රී ලංකා බැනර් ප්‍රදර්ශනය කෙරේ. 2016 නොවැම්බර් 23 වන දින මෙම බැනරය දියත් කරන ලද්දේ නෝ එලීට් ට්‍රැවලර් හි පළ කළ වෙබ් විශේෂාංගයට මූලික අඩිතාලමක් ලෙසය. මෙම බැනරය 27.49% ක අනුපාතයකින් විවෘත වන අතර එහි 10.13% ක් Click through අනුපාතයක් සටහන් කෙරේ. දැනට ඇති වෙබ් ක්‍රියාකාරකම් වල සාමාන්‍ය CTR වඩා බෙහෙවින් ඉහළ අගයක් ගනී.

ඉහත සඳහන් බැනරයට අමතරව Elite Traveler පහත සඳහන් පරිදි වෙනත් ජනප්‍රිය කියවීමේ ලක්ෂණ වලින් සමන්විත සබැදි පහත පරිදි පළ කිරීම මගින් මෙම විශේෂාංගය වඩාත් ජනප්‍රිය විය.








### වෙබ් අඩවි සැකසීම හා සමාජ මාධ්‍ය ජාල

Web Site: www.srilanka.travel

### වෙබ් අන්තර්ගත සැකසීම

- නව සැලැස්මක් සහිතව වෙබ් අඩවිය ඇරඹීම
- සංචාරක ස්ථාන 80 ක් සහිත වෙබ් අඩවි සඳහා

  නව සැකැස්ම නිර්මාණය හා වැඩිදියුණු කිරීම
- ඉහත සඳහන් සංචාරක ස්ථාන 80 සමග සම්බන්ධ කිරීමට මුල් පිටුව සඳහා සිතියමක් ඇතුළත් කිරීම.

srilankainmyeye සඳහා මුළු පිටු ලයික් 4,175 ක් වූ අතර 2016 වර්ෂය තුළ Tourismsrilanka 7,342 ක් විය. පහත පරිදි සාර්ථකව ඉහළ නැංවූ වෙනම සිදුවීම් දෙකක් විය. “Srilankainmyeyes” පිටුව සඳහා නිර්මාණය කර ඇති නව අන්තර්ගත සැලැස්ම දියත් කරන ලද අතර ඡායාරූප ඇල්බම 150 කට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරන ලදී. පහත පරිදි සාර්ථකව ඉහළ නැංවූ වෙනම සිදුවීම් දෙකක් විය.

### 2017 දුරුතු මහා පෙරහැර (කැළණි පෙරහැර)

| | |
|---|---:|
| ළඟාකරගත් සම්පූර්ණ උත්සව | 49,347 |
| සම්පූර්ණ ප්‍රතිචාර | 3,704 |
| උනන්දු වීම් | 856 |
| යෑම් | 152 |
| ආරාධිත | 2696 |

## සංචාරක උළෙල 2016

| | |
|---|---|
| ළඟාකරගත් සම්පූර්ණ උත්සව | 18,382 |
| සම්පූර්ණ ප්‍රතිචාර | 943 |
| උනන්දු වීම් | 271 |
| යෑම් | 90 |
| ආරාධිත | 582 |

ට්විටර් (Tourismlk) අනුගාමිකයන් 1,431 ක් සහ ඉන්ස්ටග්‍රෑම් හි අනුගාමිකයන් 690 ක් සිටි.

destination_srilanka 2016 වර්ෂය සඳහා යූ Youtub හි ග්‍රාහකයින් 592 ක් සිටින අතර දර්ශන 338,331 ක් වාර්තා වී ඇත.

## 2016 සංචාරක ශ්‍රී ලංකා ෆේස්බුක් පිටුවේ ප්‍රගති වාර්තාව




ශ්‍රී ලංකාව සංචාරක ආයතනය සජීවී වීඩියෝ දර්ශන සමගින් 30 කට වඩා වැඩි විඩියෝ ප්‍රමාණයක් උඩුගත කර ඇත.



## සංචාරක ශ්‍රී ලංකා වීඩියෝ වාර්තා

| දර්ශක අංකය | වීඩියෝ නම | ජනතාව ළඟා විය | දැක්ම |
|---|---|---|---|
| 1 | ලස්සන ශ්‍රී ලංකාව | 12,592 | 17000 |
| 2 | දුරුතුපෙරහැර | 1860 | 369 |
| 3 | දුරුතු මහා පෙරහැර - කැළණි විහාරය | 1221 | 213 |
| 4 | GITF හි ලවඩාත් ජනප්‍රියම ගමනාන්තයල සඳහා ශ්‍රී ලංකාව සම්මානයෙන් පිදුම් ලබයි | 1990 | 259 |
| 5 | ITB බර්ලිනයේ 2016 දී ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය | 2158 | 597 |
| 6 | ශ්‍රී ලංකා (කලින් ලංකා) | 7276 | 16000 |
| 7 | කොළඹ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය (TIC) සාම්ප්‍රදායික නව අවුරුදු අත්දැකීම | 17,430 | 10000 |
| 8 | ශ්‍රී ලංකාව | 3418 | 912 |
| 9 | උරුමය, ජනතාව සහ සංස්කෘතිය වීඩියෝ - ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය | 1794 | 231 |
| 10 | පාකිස්තානයේ UNWTO සමුළුව | 2700 | 118 |
| 11 | UNWTO හි මහ ලේකම් ටලෙබ් රිෆායි වීඩියෝව සාදරයෙන් පිළිගනිමු | 3666 | 128 |
| 12 | පාසිකුඩා සංදර්ශනය තුළ UNWTO සම්මන්ත්‍රණය | 2401 | 262 |
| 13 | සීගිරිය | 7623 | 18000 |
| 14 | බෙනිවිං ඇව ශ්‍රී ලංකා JEV ප්‍රංශ චාරිකා නියෝජිතයන් කොන්ග්‍රස් සජීවී වීඩියෝ 01 | 1768 | 71 |
| 15 | බෙනිවිං ඇව ශ්‍රී ලංකා JEV ප්‍රංශ චාරිකා නියෝජිතයන් කොන්ග්‍රස් සජීවී වීඩියෝ 02 | 2761 | 168 |
| 16 | බෙනිවිං ඇව ශ්‍රී ලංකා JEV ප්‍රංශ චාරිකා නියෝජිතයන් කොන්ග්‍රස් සජීවී වීඩියෝ 03 | 1977 | 418 |
| 17 | බෙනිවිං ඇව ශ්‍රී ලංකා JEV ප්‍රංශ චාරිකා නියෝජිතයන් කොන්ග්‍රස් සජීවී වීඩියෝ 04 | 1977 | 40 |
| 18 | ටැන්ඩ් ස්කයිඩයිවින් උත්සවය | 6721 | 16000 |
| 19 | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග උඹළු සමයේ ඇල්ජසීරා සම්මුඛ සාකච්ඡාව | 3159 | 529 |
| 20 | සංචාරක ෆෙස්ට් (ඉංසි) | 2014 | 66 |
| 21 | සංචාරක ෆෙස්ට් (සිංහල) | 3607 | 257 |
| 22 | සංචාරක උත්සවය විවෘත කිරීමේ උත්සවය වීඩියෝ 01 | 2090 | 277 |
| 23 | සංචාරක ෆෙස්ට් - අමාත්‍ය කථාබස් සජීවී වීඩියෝ 02 | 2967 | 125 |
| 24 | සංචාරක ෆෙස්ට් ක්‍රියාකාරිත්වය සජීවී වීඩියෝ 03 | 3745 | 65 |
| 25 | සංචාරක ෆෙස්ට් ක්‍රියාකාරිත්වය සජීවී වීඩියෝ 04 | 4032 | 130 |
| 26 | ශ්‍රී ලංකන් ගුවන් යානය 2016 දී සංචාරක තිළිඑ ? ඹබාැචැබාැබජැ ්රජ්ාැ බසඩැ ඩසාැදි 05 | 2055 | 410 |
| 27 | සංචාරක තිළිඑ ඃඩසිසවීරසබ්බන් බසඩැ ඩසාැදි 06 | 2373 | 318 |
| 28 | ශ්‍රී ලංකන් මිස්ටෙරා මිස්ටර් සංචාරක ෆෙස්ට් @ නිදහස් රියැලිටි ඇකඩමි වීඩියෝ 07 | 2707 | 762 |
| 29 | සංචාරක තිළිඑ ඃඩසිසවීරසබ්බන් බසඩැ ඩසාැදි 08 | 1372 | |
| 30 | ආකාස ස්වාධින චතුරස්රයේ සජීවී වීඩියෝවල සජීවීව සජීවීව 09 | 1686 | 86 |
| 31 | ප්‍රීතිමත් නත්තලක් හා සුභ නව වසරක් ඃ ශ්‍රී ලංකා සංචාරය ිරසබ්බන්ඔදමරසිප | 1993 | 11 |
| 32 | කැළණි පෙරහැර. දින 1 සජීවී වීඩියෝ 01 | 2273 | 189 |
| 33 | කැළණි පෙරහැර දින 2 සජීවී වීඩියෝ 02 | 2753 | 59 |
| 34 | කැළණි පෙරහැර උත්සවය දුරුතු මහා පෙරහැර 2017 #Visitsrilanka දින 2 සජීවී වීඩියෝ 02 | 3063 | 51 |
| 35 | කැළණි පෙරහැර උත්සවය දුරුතු මහා පෙරහැර 2017 #Visitsrilanka දින 2 සජීවී වීඩියෝ 04 | 3612 | 48 |
| 36 | කැළණි පෙරහැර උත්සවය දුරුතු මහා පෙරහැර 2017 #Visitsrilanka දින 2 සජීවී වීඩියෝ 05 | 1628 | 153 |
| 37 | කැළණි පෙරහැර උත්සවය දුරුතු මහා පෙරහැර 2017 #Visitsrilanka දින 2 සජීවී වීඩියෝ 06 | 5284 | 454 |

## දේශීය ජනමාධ්‍ය

**UNWTO පිළිබඳ මාධ්‍ය සම්මන්ත්‍රණය - පාසිකුඩා**

ප්‍රධාන අංග දෙක පිළිබඳව දේශීය මාධ්‍ය දැනුවත් කිරීම සඳහා ජූලි මස 7 වැනි දින පාසිකුඩාහිදී පැවැත්වීමට නියමිත UNWTO සම්මන්ත්‍රණය පිළිබඳ මාධ්‍ය හමුව 2016 මාර්තු 4 වන දින ට සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලදී.

**UNWTO සමුළුව පිළිබඳ දේශීය සඟරා හා ටැබ්ලොයිඩ් ලිපි**


UNWTO CONFERENCE

පාසිකුඩාහි පැවති සම්මන්ත්‍රණයට සහයෝගය දැක්වීමක් ලෙස ශක්තිමත් මහජන සම්බන්ධතා ව්‍යාපාරයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පවත්වනු ලැබුවේ ලේක්හවුස් පුවත්පත් වල සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා වලින් යුතු අතිරේක සකසා දීමෙන්ය.


UNWTO optimistic of 5% growth in 2016

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 50 වන සංවත්සරයට කෘතවේදීත්වය ලබාදීම සඳහා ලිපි සහ ලේඛන සැපයීම**

පුවත්පත් ලිපි හා දැන්වීම් පළ කිරීම මගින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ 50 වැනි සංවත්සරය සමරනු ලැබීය.

**ආසියානු ශතවර්ෂයේ දකුණු ආසියාව (SAAC) කොළඹ විශ්ව විද්‍යාලය**

දකුණු ආසියාතික ආර්ථික විද්‍යා ශිෂ්‍ය හමුව (SAES) යනු දකුණු ආසියාතික රටවල ආර්ථික උපාධි අපේක්ෂකයින්ගේ වාර්ෂික කලාපීය කුඩා ආර්ථික සමුළුවයි. දකුණු ආසියානු ප්‍රධාන විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සම්මන්ත්‍රණය පවත්වන ලදි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවෙන් 170 ක් සහ අනෙකුත් දකුණු ආසියාතික රටවල් වලින් 80 ක් වූ උපාධි අපේක්ෂක සිසුන් ලෙස 250 දෙනෙකු සහභාගි වූහ. මෙවර සමුළුවේ කටයුතු ලආසියානු ශත වර්ෂයේ දකුණු ආසියාවල යන තේමාව යටතේ දකුණු ආසියානු කලාපයේ අනාගත ආර්ථික විද්‍යාඥයින් වෙනුවෙන් පෙලගස්වාතිබුනි. දකුණු ආසියාතික අර්ථශාස්ත්‍රඥයින් 80 දෙනෙකුගේ සහභාගිත්වයේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ජාතික සංචාරක සංවිධානය ලෙස ඔවුන්ගේ සඟරාවේ පසු කවරයේ සම අනුග්‍රාහකයෙකු ලෙස ප්‍රචාරක දැන්වීමක් පල කළ අතර සමාරම්භක සැසියේ දී වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කෙරිනි.





**2015 සංචාරක ව්‍යාපාර ජයග්‍රහණ පිළිබඳ දැන්වීම් පල කිරීම**

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සැමරීම පිළිබඳව පෙබරවාරි මස 18 සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතේ විශේෂ අතිරේකය තුල දැන්වීමක් පළ කරන ලදී.




**ජාත්‍යන්තර මාධ්‍යවේදීන් සහ සංචාර මෙහෙයුම්කරුවන් සඳහා බොට්ල් මාධ්‍ය නිකුතුව පිළිබඳ පණිවුඩය**

මෙම ඊ පුවත් ලිපිය ඇමරිකාව / ආසියාව / දකුණු ආසියාව/යුරෝපය (ජාත්‍යන්තර මාධ්‍යවේදීන් 1700 ක් හා සංචාර මෙහෙයවන්නන්) පහත දැක්වෙන ප්‍රවෘත්ති සමග විද්‍යුත් තැපෑල මගින් යවනු ලැබීය.

කැලණිය 2016 දුරුතු මහ පෙරහැර නැරඹීම (සංස්කෘතික හා ආගමික කොටස්).

1. දකුණු ආසියාවේ ප්‍රථම රුධිර අයිවරි විනාශය සිදුවීම.
2. ඔබ 2016 දී ශ්‍රී ලංකාව නැරඹිය යුතු හේතු 10 ක්
3. ෆොක්ස් නිවුස්
4. ශ්‍රී ලංකාවේ සමනළ කාල වකවානුව.
5. දිගු කලක් හුදකලාව පැවති ශ්‍රී ලංකාවේ නැගෙනහිර, බටහිර හා දකුණු රන්වන් පැහැ වෙරළ තීරයන්
6. නුවරඑළිය සැමරුම
7. මහනුවර ඇසළ පෙරහැර
8. නිව්යෝර්ක් ටයිම්ස් විසින් ශ්‍රී ලංකාව 52 න් 22 වැනි ස්ථානයට පත් කිරීම
9. ශ්‍රී ලංකා සංචරක ප්‍රවර්ධන කාර්යාංශය ඇමෙරිකානු දරුවන් 8 දෙනෙකු Monkey Kingdom Trail සංචාරය සඳහා තෝරා ගැනීම
10. ලොව විශාලතම මුහුදු සිදුරු වලින් එකක් වන භූම්මානය
11. චීන Xi'an Silk Road Tourism එක්ස්පෝ 2015 හොඳම කුටිය ශ්‍රී ලංකාවට අත්විම
12. පාසිකුඩාහි පැවති ඔහැඋඩ සමුළුවේ සාර්ථකත්වය







**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ තේ පැන් හල**

මෙය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිහිටුවීම ලංකා තේ මණ්ඩලයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිදු කෙරිනි.2016 මැයි 25 සිට මැයි 30 දක්වා ගුවන් තොටුපල පර්යන්තයට පිවිසෙන සියලු දෙස් විදෙස් ජනයා ඉලක්ක කර ලංකා සංචාරක 50 වන සංවත්සරය සැමරීම හා ලංකා තේ පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා සංවිධානය කෙරිනි.



**කොළඹ සංචාරක තොරතුරු සේවා මධ්‍යස්ථානයේ සම්ප්‍රදායික අවුරුදු උළෙල (TIC)**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය තම සංචාරකයින් සඳහා සාදර පිළිගැනීමක් සිදු කිරීම හා සම්ප්‍රදායික අවුරුදු අත්දැකීමක් එක් කිරීම සිදු කළේය. TIC පරිශ්‍රයේ නිර්මාණය කළ මෙම අද්විතීය අලුත් අවුරුදු අත්දැකීම

මධ්‍යස්ථානය වෙත පැමිණි සියලුම සංචාරකයන්ට සිංහල හා හින්දු අලුත් අවුරුදු උළෙලේ වැදගත්කම අවධාරනය කිරීම සිදුවිය.





**නැගෙනහිර පළාතේ ආයෝජනය ප්‍රවර්ධන වැඩසටහන**

නැගෙනහිර ආයෝජනල නමැති ජාත්‍යන්තර ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපාරය යනු පශ්චාත් අර්බුද ආර්ථිකය තුළ ඍජු විදේශ ආයෝජන සඳහා (FDI) ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත තුල ඇති මෙතෙක් උදා කර නොගත් අතිමහත් අවස්ථා විවර කිරීමක් වන අතර ඊට මධ්‍යම සහ පළාත් ආණ්ඩු වල සක්‍රිය සහාය ලබා දෙන ලදී. මෙය 2016 ජනවාරි 28 දින කොළඹ ගලධාරි හෝටලයේ "Grand Ball" කාමරයේ දී පැවැත්විණි.

**WONCA සමුළුව**

WONCA දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය 2016 පෙබරවාරි 12 සිට 14 දක්වා කොළඹ "Water's Edge" හෝටලයේ දී පැවැත්විණි. එය දකුණු ආසියානු කලාපය මුහුණ දෙන ගැටළු ඉස්මතු කරන සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ පවුල් වෛද්‍යවරයාගේ භූමිකාව ප්‍රාථමික සත්කාර ශක්තිමත් කිරීම සඳහා අන් රටවල උපකාර ලබා ගැනීමල යන තේමාව කරගත් රසවත් වැඩසටහනක් විය.



**2016 LAW ASIA සමුළුව**

29 වන LAW ASIA සමුළුව යනු නියෝජිතයන් 350-400 ක් ඒකරාශි කළ ජාත්‍යන්තර නීති සංසදයක් වූ අතර එමගින් නීති පර්යේෂණ හා තොරතුරු හුවමාරු කර ගැනීමටත් ආසියානු, පැසිෆික් හා ඉන් ඔබ්බට වූ ප්‍රජාවන් අතර සහයෝගීතාවයන් ගොඩනගා ශක්තිමත් කිරීමටත් කදිම අවස්ථාවවක් විය. 29 වන LAW ASIA සම්මේලනයට අමතරව LAW ASIA හි ශත සංවත්සර සැමරුම ද යෙදී තිබුනි. එය ශ්‍රී ලංකාව විසින් සංවිධානය කළ අතර කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී 2016 අගෝස්තු 12 සිට 15 දින දක්වා පැවැත්විණි සම්මන්ත්‍රණ වැඩසටහන තුල පුළුල් මාතෘකා තේමා කරගත් සාකච්ඡා, සැසි, වැඩමුළු සැසි, ඉදිරිපත් කිරීම් සහ වෙනත් ක්‍රියාකාරකම් ඇතුළත් විය. එමගින් නීතිමය දැනුම වැඩිදියුණු කර ගැනීමට හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට ඔවුන්ට අවස්ථාව උදා විය.



**2016 ආරක්ෂක සම්මන්ත්‍රණය - බණ්ඩාරනායක අනුස්මරන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව**

ආරක්ෂක සම්මන්ත්‍රණය 2016 සැප්තැම්බර් 01 සහ 02 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණයේ තේමාව ගෝලීය ගැටළු මත අවම බලය සහ එහි බලපෑමල යන්නයි. ආසියානු කලාපයේ නියෝජිතයින් 100 කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

(බංග්ලාදේශය, චීනය, ඉන්දුනීසියාව, ඉන්දියාව, මැලේසියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය, සෙනෙගල් සහ වියට්නාමය ආදි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය TIC කවුන්ටරයක් පිහිටුවීම මගින් කාලීන සහ වැදගත් තොරතුරු ලබා දෙමින් මෙම අවස්ථාවට සම්බන්ධ විය. නියෝජිතයින්ගේ සංචාරක අවස්ථා වල දී වූ අවශ්‍යතා පිරිමැසීමට ද අපට හැකි විය.



**මගී යාත්‍රා ආගන්තුක සත්කාරය**

**"MV SEABOURN SOLOURN"**

MV SEABOURN SOLOURN යාත්‍රාව 2016 මාර්තු 22 වන දින කොළඹ වරායේ නැංගුරම්ලෑම සිදු විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංචාරක තොරතුරු කවුන්ටරයක් ඒතුල ස්ථාපනය කර නිලධාරීන්ට ප්‍රවර්ධන සහායන් ලබා දීමටත් මගී ජනයාට සහ යාවීමත් කොළඹට මෙන්ම මෙරට පිහිටි ප්‍රධාන සංචාරක ස්ථානය ප්‍රවර්ධනය සඳහා ද සහාය විය.





**"COSTA LUMINOSA"**

Costa Luminosa නෞකාව 2016 නොවැම්බර් 22 වන දින කොළඹ වරායේ නැංගුරම් ලන ලදී.





**"GENTING DREAMS"**

GENTING DREAMS නෞකාව 2016 ඔක්තෝබර් 31 වැනිදා කොළඹ වරායට සේන්දු විය.



**ලෝක අපනයන සංවර්ධන සමුළුව – 2016**

ලෝක අපනයන සංවර්ධන සමුළුවේ (WEDF) 16 සැමරුම 2016 ඔක්තෝබර් 12 සිට 13 දක්වා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විය. ව්‍යාපාරයන්හි නව ප්‍රවනතා සහ වැඩි දියුනුවීම් අධ්‍යයනය එය උපකාර වේ. WEDF යනු සුවිශේෂී ගෝලීය සම්මන්ත්‍රණයක් සහ ව්‍යාපාර මූලික කරගත් සංවර්ධනයට අතහිත සඳහා කැප වූ ව්‍යාපාරික- ව්‍යාපාරික (B2B) එක්කරන වේදිකාවක් වේ. ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ (ITC) ප්‍රධානතම අංගයක් ලෙස සංවර්ධනය වෙමින් පවතින රටවලට

ජාත්‍යන්තර තරඟකාරිත්වය සඳහා ව්‍යාපාරික නායකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, වෙළඳ සහ ආයෝජන ආධාර ප්‍රධානීන් සහ ජාත්‍යන්තර වෙළෙඳ සංවර්ධන නිලධාරීන් 600 කට අධික සංඛ්‍යාවකට මෙමගින් සේවය සැළසේ.



## ගමනාන්ත හා සමාජ වගකීම්

### ශ්‍රී ලංකාවේ තල්මසුන් හා ඩොල්ෆින් සංරක්ෂණය

ශ්‍රී ලංකාවේ තල්මසුන් සහ ඩොල්ෆින් සංරක්ෂණය සඳහා ඉවහල් වන තල්මසුන් හා ඩොල්ෆින් සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවක් සංවිධානය කිරීම Indian Ocean Ring Association (IORA- සහ International Whaling Commission (IWC) සිදු කරන ලදී. IORA හි සාමාජික රටවල් සඳහා ශ්‍රී ලංකාවේ වසර 5 ක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහාත් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී තල්මසුන් සහ ඩොල්ෆින් සංරක්ෂණයට සම්බන්ධ රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගනිමින් 2016 පෙබරවාරි 24 සිට 2016 පෙබරවාරි 26 දක්වා පැවැත්විනි. මෙහි සමාරම්භක අවස්ථාවේ සංස්කෘතික නැටුමක් සංවිධානය කිරීමට සඳහාත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කටයුතු යොදා ඇත.





### ලෝක සාගර දින වැඩසටහන

ලෝක සාගර දිනයට සමගාමීව සමුද්‍ර පරිසර ආරක්ෂණ කාර්යාංශය අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව වැල්ලවත්තේ හා කාක දූපතේ වෙරළ තීරයේ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. විහාරමහා දේවි උද්‍යානයේ සිට ගාලු මුවදොර දක්වා අතිගරු ජනාධිපතිතුමා ගේ ප්‍රධානත්වයෙන් පා ගමනකින් ආරම්භ විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් වැල්ලවත්තේ හා කාක දූපත් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩ සටහනට සහභාගී වූ ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන්, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත දිවා අහාර සහ වතුර බෝතල් ලබා දීම සිදු කෙරිනි.



ප්‍රදේශවාසී ජනයා ඇතුළු ඉහත විෂය ක්ෂේත්‍රය තුල ක්‍රියාකාරී වූ පාර්ශ්වකරුවන්ට ස්තුති පිදීම සමඟ මෙම කාර්යය 2016 ජූනි 8 වන දින සාර්ථකව අවසන්විය.

කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් වෙරළ තීරුවක් වන වැල්ලවත්තේ හා කාක දූපත වෙරළ තීරය තුළ මේ වන විටත් සංවිධානය කර ඇති වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනට බොහෝ පාර්ශ්වකරුවන් විශේෂයෙන් ශ්‍රී ලංකා නාවුක හමුදාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහභාගී වී ඇත.



ඉහත වැඩසටහන තුළ ඉහත සඳහන් සමස්ත ප්‍රදේශයම පිරිසිදු කරන ලද අතර කොළඹ මහ නගර සභාවට අයත් වාහන මගින් කසළ බැහැර කෙරිනි.



**සුවපහසු මධ්‍යස්ථාන සංවර්ධනය - උතුරු මැද පළාත (පොලොන්නරුව)**

පොලොන්නරුවේ සුවපහසු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මුදල් ආධාර (රුපියල් මිලියන 15 ක්) ලබා දීමට එකඟ වී ඇත. සුව පහසු මධ්‍යස්ථානය මේ වන විට ඉදිවෙමින් පවතින අතර උතුරුමැද පළාත් සභාව විසින් ඉටු කළ කාර්ය කොටස සඳහා වූ පළමු ගෙවීම සිදු කිරීමට නියමිතව ඇත.

**පළාත් සභා අනුග්‍රාහක වැඩසටහන යටතේ දකුණු පළාතේ වෙරළ තීරයේ තෝරාගත් දුම්රිය ස්ථානවල ඉදිකිරීම් හා පහසුකම් සංවර්ධනය කිරීම**

දකුණු පළාත් සභාවට ලබා දුන් මුළු ව්‍යාපෘතියෙන් 20% ක අත්තිකාරම් මුදලෙන් ඉහත කාර්යය සඳහා මුදල් යොදවා ඇති අතර තෝරාගත් දුම්රිය ස්ථානයන් වන බෙන්තොට, අම්බලන්ගොඩ, ගාල්ල, හික්කඩුව, මාතර සහ අහංගම යන තෝරාගත් දුම්රිය ස්ථානවල විදේශ හා මෙරට සංචාරකයන් භාවිතා කරන උක්ත දුම්රිය ස්ථානවල භාවිතාව සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංචාරක සඟරා නිර්මාණය කිරීම සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කටයුතු කරයි. දැනටමත් ක්‍රියාත්මක තලයේ පවතින මෙම ව්‍යාපෘතිය තුළ එක් එක් දුම්රිය ස්ථානයන්හි සිදු කළ යුතු කාර්යයන් දැනටමත් හඳුනාගෙන තිබේ.







වෙරළ තීරය පිරිසිදු කිරීමේ දිනය





**නව නිෂ්පාදිතයන් සහ NICHE SEGMENT අලෙවිකරණය**

"RAMAYAN TRAIL IN SRI LANKA" සැකසීම

**පොත් පිංච සැකසීම**




**ක්ෂේත්‍ර චාරිකා**

ඉන්දියාවේ රාමයානා වෙබ් අඩවි සඳහා යෝජිත යටිතල පහසුකම් නැංවීමට අදාළව ඉන්දියානු රජය වෙත තොරතුරු ලබාදීම සඳහා RAMAYAN TRAIL සම්බන්ධව මහනුවර කොන්සල් කාර්යාලය සඳහා ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදී. ලෝක හින්දු ප්‍රජාව ඉලක්ක කර ගෙන (විශේෂයෙන්ම ඉන්දියාවේ) වැලිමඩ, නුවර, මහියංගනය, වස්ගමුව, නුවරඑළිය, වැලිමඩ යන ස්ථාන වල ක්ෂේත්‍ර සංචාරය සිදු විය.



ශ්‍රී ලංකාව තුළ RAMAYAN TRAIL මාර්ග සඳහා ඇති හැකියාව සොයා බැලීමට මහනුවර කොන්සියුලර් කාර්යාලයේ ඉන්දියානු සහකාර මහ කොමසාරිස්වරයාගේ මූලයාධාර යටතේ සංවර්ධනය කිරීමට වඩාත් වැදගත් ස්ථාන හඳුනාගෙන ඇත. මෙය Ramayan Trail අඩවි වල යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා මූලයාධාර ලබා දීමට ඉන්දියානු රජය වෙත ශ්‍රී ලංකා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් විශ්වාසනීය තොරතුරු ලබාදු දුනි.



**CRUISE සංචාරක කර්මාන්තය**

**CRISTAL CRUISES හි VP වන ක්ලෑඩියස් ඩොසෙකල් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය**





**ශ්‍රී ලංකාවට පැමිණි මගී නෞකා පිළිගැනීම**

Genting Dream මගී නෞකාවේ ශ්‍රී ලංකා සංචාරය









**COSTA LUMINOSA** මගී නෞකාවේ ශ්‍රී ලංකා සංචාරය



## දේශීය ඉසව්

### කැළණියේ දුරුතු පෙරහැර

දුරුතු පෙරහැර ලෙස ද හැඳින්වෙන කැලණිය පෙරහැර 2016 ජනවාරි 22 දින කැළණිය රජමහා විහාරස්ථානයේ දී දේශීය සහ විදේශීය ලක්ෂ පහක ප්‍රේක්ෂක පිරිසකගේ සහභාගීත්වයෙන් සාර්ථකව නිම විය. දුරුතු පෙරහැර යනු ශ්‍රී ලංකාවේ වාර්ෂිකව පවත්වනු ලබන වැදගත් සංස්කෘතික චාරිත්‍ර අතුරින් එකකි. පෙරහැරේ ආරම්භය 1927 දක්වා අතීතයට දිව යන අතර දොන් වෝල්ටර් විජේවර්ධනයන් විසින් එය ආරම්භ කර ඇත. බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවේ තුන්වන වරට වැඩම කළ ස්ථානය වන කැළණිය රජමහා විහාරස්ථානය තුළ දුරුතු පෙරහැර පැවැත්වේ. ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ සම්ප්‍රදායට ඇලුම් කරන කරන විදේශිකයන් මේ හරහා ආකර්ෂණය කර ගැනීමට විශාල හැකියාවක් පවතී.








### ගංගාරම නවම් පෙරහැර

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලාංකේය සංස්කෘතික සංදර්ශන හා ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික උත්සව ලෝකය පුරා ප්‍රචලිත කිරීමේ කාර්යභාරය උර දෙන නෙදර්ලන්තයේ පැවති ශ්‍රී ලංකා සංචාරක ඉන්ටර්නැෂනල් 2016 හි ජයග්‍රාහිකාව වන නෙදර්ලන්තයේ වෙරරා බිරුන්ඩා ඩුකස්තා මහත්මිය පෙබරවාරි 21 සහ 22 යන දිනවල ගංගාරාම විහාරය විසින් මෙහෙයවන ලද කොළඹ නවම් පෙරහැර සහභාගි කරවීමට කටයුතු කළේය.





**ගංගාරාම බුද්ධ රශ්මි වෙසක් උත්සවය**

ගංගාරාම විහාරස්ථානය හා අරලියගහ මන්දිරය විසින් සංවිධානය කළ 2016 මැයි 21, 22, 23, 24 සහ 25 යන දිනවල ඓතිහාසික ගංගාරාම විහාරස්ථානයේ පැවති බුද්ධ රශ්මි වෙසක් උත්සවය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ අරලියගහ මන්දිරය අනුග්‍රාහකත්වය ලබා දුනි.



**CINNAMON ASIAN OCEAN OPTIMIST ශූරතාවලිය 2016**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය තොරතුරු කවුළු ස්ථාපනය කර ලද අතර විදේශීයන් ලියාපදිංචිවීමේදී ප්‍රවර්ධන ද්‍රව්‍ය වන කැප් තොප්පි සහ තෑගි ලෙස ලබා දුනි. අනුග්‍රාහිත ස්ටිකර සෑම බෝට්ටුවක අලවන ලද අතර සෑම රටකම කදවුරු බැනරය බැගින් ප්‍රදර්ශනය කෙරිනි. ශ්‍රී ලංකාවේ තේමාවන් 8 ක් අවධානයට ලක් කරමින් පෙනිසිටි කුඩා කොඩි 24 ක් හා ශ්‍රී ලංකා සංචාරක ධජ 20 ක් ස්ථාපනය කරන ලදී. ප්‍රමුඛතම ලාංඡන පසුබිමෙන් ප්‍රදර්ශනය කරවීම සමාප්ති උළෙලේදී සැබැවින්ම ආකර්ශනය ගෙන දෙන්නක් විය. ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, තුර්කිය, ජපානය, චීනය, ඉන්දියාව, තායිලන්තය, මැලේසියාව, කුවේට්, සිංගප්පූර්ව, ඕමානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මියන්මාරය, කොරියාව හා ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 20 ට අධික සහභාගි වු මෙම උළෙල ශ්‍රී ලංකාවට වැඩි වාසි ගෙන දීමටස සමත් විය. වයස අවුරුදු 12 ත් 15 ත් අතර ළමුන් තම දෙමාපියන්, පුහුණුකරුවන් වැනි ඔවුන්ගේ භාරකරුවන් සමඟ සහභාගී වූහ. ඉහත කී රටවල් වලින් 300 කට අධික පිරිසක් පැමිණ සිටියහ. 2016 මැයි 28 සිට 2016 ජූනි 5 වන දින දක්වා පවත්වන ලදී.






**ගාලු සාහිත්‍ය උළෙලේ පොත් ප්‍රදර්ශනය**

ගාලු උත්සවය වසර ගණනාවක් පුරා ගාල්ල සහ අවට ප්‍රදේශයන්හි ආර්ථිකයට දැඩි ශක්තියක් එක්කරන්නකි. තරු පහේ හෝටල්, විලා, අමුත්තන්ගේ නිවෙස්, ආපනශාලා, කැෆෙ සහ දේශීය සාප්පු වල සිට නවාතැන් සපයන්නන් සඳහා මෙම වැඩමුළුව තුලින් ප්‍රතිලාභ අත් කර දුනි. සහභාගී වූ අය අතරින් වැඩිම ප්‍රතිලාභ අත් වූ පිරිස වන්නේ ත්‍රී රෝද රථ රියදුරන් ය. උත්සව සමය තුළ පැවති සුළු පරිමාණ උත්සව වලින් ආර්ථිකයට ප්‍රතිලාභ අත් විය.








## 2016 නුවරඑළිය සැමරුම

මෙම උත්සවය අප්‍රේල් 15 සිට 25 දක්වා නුවරඑළියේ උත්සව සමයට සමගාමීව ශ්‍රී ලංකාව සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා දේශීයව වාර්ෂිකව පවත්වන්නකි. සෘතුමය වැඩපිළිවෙල විප්ලවීය වෙනසක් සඳහා දේශීය සංචාරකයින්ගේ හා අන්තර්ජාතික සංචාරකයින් අතර ජාතික හා අන්තර්ජාතික මට්ටමින් සැලකිය යුතු සංචාරක ස්ථානයක් ලෙස ප්‍රචලිත කිරීම සඳහා නව සිද්ධි සහ සංකල්ප එක් කරමින් අතිරේක හා වෙනස් අත්දැකීම් සංචාරකයන්ට ලබා දීම සිදු වේ.






## සංචාරක කර්මාන්ත පිළිබඳ දේශනය - ජෝන් ඊ. ස්කැන්ලන් මහතා - මහලේකම්, CIITIES AND BLOOD IVORY

වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ව විශේෂ පිළිබඳ අන්තර්ජාතික සම්මුති සංවිධානයේ මහලේකම් ජෝන් ඊ ස්කෑන්ලන් මහතාගේ වනජීවී පිළිබඳ අත්දැකීම් හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා හමුවක් 2016 ජනවාරි 25 වන දින ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පවත්වන ලදී.



## ලෝක ආර්ථික සමුළුවේ විශ්ව තරුණ නායකයෝ - සංස්කෘතික සැදෑව 2016







## MISS TOURISM SRI LANKA INTERNATIONAL

ජාත්‍යන්තර තරඟකරුවන් පෙනී සිටි මෙම තරඟයට මෙම ප්‍රමිතියෙන් යුත් උත්සව වලදී ශ්‍රී ලංකාව ගෝලීය වේදිකාවක් බව තහවුරු විය. අවසාන ජයග්‍රාහකයන් ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිදු කල පසු පුවත්පත් සාකච්ඡාවක් පැවැත්වූවේ ජයග්‍රාහකයන් ශ්‍රී ලංකාවේ වෙළඳ සන්නාම තානාපතිවරුන් ලෙස නම් කිරීම සඳහාය.



2016 පෙබරවාරි 8 සිට 21 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේ දී උළෙල පවත්වන ලදී. ඉන්දියාව, චීනය, රුසියාව, ඕස්ට්‍රේලියාව, ස්කැන්ඩිනේවියාව, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය සහ මැලේසියාව යන රටවල සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම මෙහි ඉලක්කය විය. මෙය වාර්ෂික උළෙලක් ලෙස ඉදිරිපත් කළ හැකි ජාත්‍යන්තර තරඟයක් සංවිධානය කිරීමට හා ඊට සත්කාරකත්වය දැරීම සඳහා ශ්‍රී ලංකාව සතු හැකියාවන් ප්‍රදර්ශනය කිරීමක් විය.






## ගෝලීය සංචාරක සංවිධානය (ගොල්ෆ් සංචාරක මෙහෙයුම්කරුවන්ගේ අන්තර්ජාතික සංගමය (IAGTO--

ගොල්ෆ් ක්‍රීඩාව යනු නිදහස් තරුණ ජීවන රටාවක් පමණක් නොව ඉහළ මට්ටමේ ආයතනික හා සාර්ථක පුද්ගලයන් විසින් ද පිළිගත් එකක් වන බැවින් ස්වාධීන අධ්‍යයනයට අනුව ගොල්ෆ් හි සහභාගීත්වය පසුගිය වසර දහය තුළදී 50% කට වඩා වැඩිවී තිබේ. 2016 ජනවාරි 04 සිට 08 වනදා දක්වා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති "IAGTO සභාපතිවරයාගේ ශ්‍රී ලංකානු සංචාරය" ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංවිධානය කෙරිනි.






### "ආයුර්වේද එක්ස්පෝ 2016 - ජාත්‍යන්තර දේශීය සෞඛ්‍ය සේවා ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණය

මෙම ප්‍රදර්ශනය 2016 ජුලි 08 දින සිට ජුලි 10 දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි. මෙමගින් අපේක්ෂිත වෙළඳපල වූයේ යුරෝපය සහ ජපානය, චීනය ඇතුළු ආසියානු රටවල් හා වෙනත් රටවල් වලින් දේශීය ප්‍රතිකාර පතා පැමිණෙන සංචාරකයන්ය.

### කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය - 2016

රටවල් 50 කට වැඩි ගණනක් නියෝජනය කරන ජාත්‍යන්තර ප්‍රජාවකගේ අවධානය දින දෙකක කාලයක් පුරා රඳවා ගැනීමට සමත් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සමගාමීව දෙස් විදෙස් ආරක්ෂක ක්ෂේත්‍රය සඳහා වූ 2016 සැප්තැම්බර් 01 සිට 02 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විය. මෙම සම්මන්ත්‍රණයේ අරමුණු අතර ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත්බාවය වර්ධනය කිරීම හා ලශ්‍රී ලංකාවල යනු නිවාඩුගත කිරීමට හා විනෝදාස්වාදය සඳහා ඇති හොඳම ස්ථාන වලින් එකක් බවට හඳුන්වාදීමටය.

### ශ්‍රී ලංකා සංචාරක ආයතනයේ ස්වර්ණ ජයන්තිය

ශ්‍රී ලංකානු සංචාරක කර්මාන්තයේ වර්ධනය පිළිබඳව වාර්තාමය වැඩසටහනක් සැකසීම

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳ මෙම වාර්තාමය වැඩසටහන සැකසීමේ අරමුණ වූයේ ආරම්භයේ සිට වර්තමානය තෙක් එය වර්ධනය වී ඇති ආකාරය හුවා දැක්වීම හා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ 50 වන සංවත්සරය සැමරීම සඳහා සංවිධානය කරන ලද අනෙකුත් උත්සව සඳහා එය යොදා ගැනීමයි. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, සීමා. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) සහ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට සම්බන්ධ ආයතන හතර වන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය යන ආයතන වල සභාපතිවරුන් මෙම විනාඩි 10 වාර්තා වැඩසටහන සැකසීමට සම්බන්ධ කර ගන්නා ලදී.

### නිර්මාණාත්මක තරඟ

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ස්වර්ණ ජුබිලියට සමගාමීව ඡායාරූපකරණය, වීඩියෝකරණය, රචනය සහ කලාව පිළිබඳව උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකිකයන් සඳහා තරඟ හතරක් මේ වනවිටත් පවත්වා තිබේ. රටේ සංචාරක ක්ෂේත්‍රයේ සන්නාම තානාපතිවරුන් වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ප්‍රසාදය දිනා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල කොටසක් ලෙස මෙම තරඟ සකස් කර ඇත. තරඟ පිළිබඳ ප්‍රචාරය පුවත්පත් දැන්වීම් හා ඔන්ලයින් ලෙස පල කෙරිනි. ජයග්‍රාහකයන්ට වටිනා මූල්‍යමය ත්‍යාග සහ වෙනත් තෑගි ලබා ගැනීමටත් තම හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට මෙය තෝතැන්නක් විය.

### ශ්‍රී ලංකාව පුරා සංචාරය කරන සංචාරකයින්ගේ අත්දැකීම් කැටිකරගත් වීඩියෝ පටයක් සැකසීම

සංචාරකයන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ස්ථානවල ගත කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිචාර ඇතුලත් මිනිත්තු 20 ක් දිග වීඩියෝ පටයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සකස් කෙරිනි. මෙම වීඩියෝ පටය ප්‍රධාන සැමරුම් උත්සව අවස්ථා වල ප්‍රදර්ශනය කළ අතර එය අපගේ අනාගත ජාත්‍යන්තර සහ දේශීය සංචාරක ප්‍රවර්ධන අවස්ථා හා ඊට අදාළ තත්වයන් වලදී ප්‍රවර්ධන වීඩියෝ පටයක් ලෙස භාවිතා කිරීමට අදහස් කර ඇත.

### 50 වන සංවත්සරය සඳහා ගුවන් තොටුපළ වර්ණවත් කිරීම්

ස්වර්ණ ජුබිලි සැමරුමට සමගාමීව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ගුවන් තොටුපොල හා ගුවන් සේවා වල මගින් ගැවසෙන ප්‍රදේශය සරසන ලදී. (මුද්‍රණය සහ ස්ථාපනය කිරීම් 18 ක්).

**ජයග්‍රහණ - 2016**

1. Dream Trips 2016 "ඔබගේ සංචාරක පැතුම් ලැයිස්තුවට එක් කළ හැකි ලොව අසාමාන්‍ය ස්ථාන" ලෙස ශ්‍රී ලංකාව 2016 සංචාරය කළ හොඳම ගමනාන්ත 10 න් එකක් ලෙස පිළිගෙන තිබේ.

2. ශ්‍රී ලංකාව ප්‍රබෝධාත්මක ගමනාන්ත සෙවීමට හෝ 2016 සඳහා ගමන් කිරීමේ ප්‍රවණතා පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා ABTA - බ්‍රිතාන්‍ය සංචාරක නියෝජිත සංගමය.

3. 2016 සංචාරක ලැයිස්තුවේ වසරේ අමතක නොවන ගමනාන්තයන්ගේ වර්ගීකරණය යටතේ 03 වැනි ස්ථානයේ ස්ථානගත කිරීම - Harper~s Bazaar (UK- සඟරාව - 2016 ජනවාරි)

4. ශ්‍රී ලංකාව 2016 වසරේ සංචාරය කල යුතු හොඳම ගමනාන්ත 16 ලෙස Condé Nast Traveller නම් කිරීම.

5. 2016 රේඩාර් සුරක්ෂිත ගමනාන්ත යටතේ ශ්‍රී ලංකාව 10 දෙනා අතරට FoxNews.Com පිළිගැනීම.

6. ආසියාවේ වඩාත් දැකුම්කළු ස්ථාන 50 අතුරින් සීගිරිය ද එක් ස්ථානයක් ලෙස Condé Nast Traveller නම් කිරීම.

7. 2016 Condé Nast සම්මාන උළෙලේ "Beaten Track" හි හොඳම ගමනාන්තය.

# අවසාන ගිණුම් 2016

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
## මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය
## 2016 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2016<br>රු. | 2015<br>ප්‍රතිසදහන් කිරීම් රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානකම් | 3 | 110,520,029 | 412,111,913 |
| කෙටි කාලීන ආයෝජන | | 2,000,000,000 | 1,750,000,000 |
| ලැබිය යුතු | 4 | 1,101,008,755 | 876,256,774 |
| අත්තිකාරම් | 5 | 13,326,419 | 1,582,500 |
| පෙර ගෙවුම් | 6 | 63,278,316 | 19,486,187 |
| සේවක ණය | 7 | 2,303,590 | 1,917,590 |
| බඩු තොග | | 1,181,485 | 8,642,016 |
| **මුළු ජංගම වත්කම්** | | **3,291,618,593** | **3,069,996,980** |
| **අස්පර්ශ වත්කම්** | | | |
| පරිගණක මෘදුකාංග | | 1,592,770 | 1,592,770 |
| | | **1,592,770** | **1,592,770** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 25,649,040 | 38,469,347 |
| පාරිතෝෂික ආයෝජන | | 7,248,677 | 5,429,336 |
| මුළු ජංගම නොවන වත්කම් | | **32,897,718** | **43,898,682** |
| **මුළු වත්කම්** | | **3,326,109,081** | **3,115,488,432** |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| කලින් ලද අරමුදල් | 9 | 13,003,521 | 10,766,000 |
| තැන්පතු ගෙවීම් | 10 | 2,440,493 | 1,029,510 |
| සේවක ප්‍රතිලාභ | 11 | 8,627,141 | 7,248,677 |
| උපචිත වියදම් හා ණය හිමියන් | 12 | 305,264,656 | 332,835,041 |
| | | **329,335,810** | **351,879,228** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගුකාලීන ණය ගැනීම් | | | |
| **මුළු වගකීම්** | | **329,335,810** | **351,879,228** |
| **ශුද්ධ වත්කම්** | | **2,996,773,270** | **2,763,609,204** |
| **ශුද්ධ වත්කම් /මූලධනය** | | | |
| ප්‍රාග්ධන දායකත්වය | | 33,069,157 | 33,069,157 |
| සමුච්චිත අතිරික්තයන් / (හිඟය) | | 2,963,704,114 | 2,730,540,047 |
| **මුළු ශුද්ධ වත්කම් / මූලධනය** | | **2,996,773,270** | **2,763,609,204** |

මූල්‍ය ප්‍රකාශන සහතිකය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 1971 අංක 38 දරන මුදල් පනත සහ 2005 අංක 38 දරණ ශ්‍රී ලංකා සංචාරක පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂක, මුදල් අංශය සහතික කෙරේ.

අධ්‍යක්ෂ මුදල්
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

මෙම මූල්‍ය වාර්තා සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.2017 මාර්තු මස 30 වන දින මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබිණි.

පී.එම්. විතාන
සභාපති (වැ.බ.)
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
2016 වර්ෂය සඳහා

| | සටහන් | 2016<br>රු. | 2015<br>ප්‍රතිසඳහන් කිරීම්<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අපගමන බදු | | 1,648,808,892 | 1,377,978,769 |
| සංචාරක සංවර්ධන බදු | | 823,781,247 | 780,140,925 |
| වෙනත් ආදායම් | 13 | 255,536,022 | 181,828,274 |
| **මුළු ආදායම** | | **2,728,126,161** | **2,339,947,967** |
| **වියදම්** | | | |
| කුලී, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 14 | 79,280,728 | 59,507,983 |
| පරිහරණ හා පාරිභොගික ද්‍රව්‍ය භාවිත කිරීම් | 15 | 34,710,831 | 33,264,246 |
| වෙළඳ සම්බන්ධ වියදම් | 16 | 867,033,675 | 786,924,530 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | | 10,640,595 | 9,592,761 |
| වෙනත් වියදම් | 17 | 2,708,286 | 3,072,364 |
| මූල්‍ය පිරිවැය | 18 | 587,980 | 591,419 |
| බොල්ණය | | | 3,304,920 |
| **මුළු වියදම්** | | **994,962,095** | **896,258,224** |
| **අදාළ කාලය සඳහා අතිරික්තය / (හිඟය)** | | **1,733,164,067** | **1,443,689,744** |
| **අඩු කළා: භාණ්ඩාගාර බදු** | | 1,500,000,000 | 500,000,000 |
| භාණ්ඩාගාර බදු පසු අතිරික්තය | | 233,164,067 | 943,689,744 |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය / (හිඟය) | | 2,730,540,047 | 1,786,850,303 |
| **ඉදිරියට ගෙන ගිය අතිරික්තය/(හිඟය)** | | **2,963,704,114** | **2,730,540,047** |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
## 2016 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වර්ෂය සඳහා
## ශුද්ධ වත්කම් / හිමිකම්වල වෙනස පිළිබඳ ප්‍රකාශය

| පාලක ඒකකයේ අයිතිකරුවන්ගේ ලැබීම් | | | මුළු ශුද්ධ වත්කම් / මූලධනය |
|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය / (හිගය) | |
| **2014 ජනවාරි 31 දිනට ශේෂය** | 33,069,157 | 1,929,667,250 | 1,962,736,406 |
| **ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්** (පූර්ව වර්ෂයේ ගැලපීම්) | | | |
| ප්‍රතිසැකසුම් ශේෂය | | | |
| **2015 සඳහා ශුද්ධ වත්කම් / මූලධනය වෙනස්වීම** | 33,069,157 | 1,929,667,250 | 1,962,736,406 |
| දේපල ප්‍රත්‍යාගණනය මත ලබා ගැනීම් | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණන අලාභය - | | | |
| පරිවර්තන මත හුවමාරු වෙනස - | | | |
| පරිවර්තන මත හුවමාරු වෙනස - | | | |
| ශුද්ධ වත්කම් / මූලධනය තුළ සෘජු ශුද්ධ ආදායම - | | | |
| කාලය සඳහා අතිරික්තය | | 906,783,523 | |
| **කාලය තුල හඳුනාගත් ආදායම හා වියදම** | | **906,783,523** | **906,783,523** |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 33,069,157 | 2,836,450,772 | 2,869,519,929 |
| ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් (පූර්ව වර්ෂ ගැලපීම්) | | (105,910,725) | (105,910,725) |
| නැවත සකස් කරන ලද ශේෂය | | 2,730,540,047 | 2,763,609,204 |
| 2016 සඳහා ශුද්ධ වත්කම් / මූලධනය වෙනස්වීම | | | |
| **දේපල ප්‍රත්‍යාගණනය මත ලබා ගැනීම්** | | | |
| **ආයෝජන ප්‍රත්‍යාගණන අලාභය -** | | | |
| **පරිවර්තන මත හුවමාරු වෙනස -** | | | |
| **විදේශීය මෙහෙයුම් -** | | | |
| ශුද්ධ වත්කම් / මූලධනය තුළ සෘජු ශුද්ධ ආදායම - | | | |
| කාලය සඳහා අතිරික්තය | | 233,164,067 | 233,164,067 |
| කාලය සඳහා හඳුනාගත් ආදායම හා වියදම | | **233,164,067** | **233,164,067** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **33,069,157** | **2,963,704,114** | **2,996,773,270** |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
## 2016 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වර්ෂය සඳහා වූ
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016<br>රු. | 2015<br>ප්‍රතිසඳහන් කිරීම් රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇති වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| ශුද්ධ ලාභය | 1,733,164,067 | 943,689,744 |
| ගැලපීම් | | |
| ක්ෂයවීම් | | |
| | 1,733,164,067 | |
| | 10,640,595 | 9,592,761 |
| ප්‍රතිතක්සේරු ගැලපීම | 6,200,000 | 3,304,920 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,750,004,661** | **956,587,425** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| ලැබීමට නියමිත දෑ (වැඩිවීම්) /අඩුවීම් | (224,751,982) | (202,405,083) |
| අත්තිකාරම් (වැඩිවීම්) / අඩුවීම් | (11,743,919) | 63,427 |
| පූර්ව ගෙවීම් (වැඩිවීම්)/අඩුවීම් | (43,792,129) | (16,513,167) |
| ණය - (වැඩිවීම්) / අඩුවීම් | (386,000) | 127,432 |
| භාණ්ඩ තොග (වැඩිවීම්) / අඩුවීම් | 7,460,531 | 4,041,896 |
| සේවක ප්‍රතිලාභ වැඩිවීම් / අඩුවීම් | 1,378,463 | 1,819,342 |
| පූර්ව ලැබුණු අරමුදල්වල - වැඩිවීම් /(අඩුවීම්) | 2,237,521 | (3,250,459) |
| තැන්පතු ගෙවීම් - වැඩිවීම් / (අඩුවීම්) | 1,410,983 | 332,587 |
| උපචිත වියදම් හා ණය හිමියන්ගේ වැඩිවීම් /(අඩුවීම්) | (27,570,385) | 786,854 |
| **මෙහෙයුම් කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,454,247,745** | **741,590,253** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| කෙටිකාලීන ආයෝජන (වැඩිවීම්) / අඩුවීම් | (250,000,000) | (1,750,000,000) |
| දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම් (වැඩිවීම්) / අඩුවීම් | (4,020,288) | (11,053,711) |
| පාරිතෝෂික ආයෝජන (වැඩිවීම්) /අඩුවීම් | (1,819,342) | (5,429,336) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(255,839,630)** | **(1,766,483,047)** |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| ඒකාබද්ධ අරමුදලකට අරමුදල් මාරු කිරීම භාණ්ඩාගාර බදු | (1,500,000,000) | (500,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,500,000,000)** | **(500,000,000)** |
| **මුදල් හා මුදල් සමානවල ශුද්ධ වර්ධනය/ (අඩුවීම)** | **(301,591,885)** | **(1,024,892,794)** |
| **කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමානවල** | **412,111,913** | **1,437,004,707** |
| **කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමානවල** | **110,520,029** | **412,111,913** |

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
අයවැය ප්‍රකාශය
2016 වර්ෂය සඳහා

| විස්තරය | සටහන | 2015 | 2016 | | | | රු. මිලි. 2017 |
|---|---|---|---|---|---|---|---|
| | | සත්‍ය | අයවැය | සත්‍ය | විචල්‍යතාවය වටිනාකම | % | අයවැය |
| **ආදායම** | | | | | | | |
| අපගමන බදු | | 1,377.98 | **1,625.01** | 1,648.81 | *23.80* | *101%* | **1,925.52** |
| සංචාරක සංවර්ධන බදු | | 780.14 | **796.00** | 823.78 | *27.78* | *103%* | **867.97** |
| වෙනත් ආදායම් | 13 | 181.83 | **143.00** | 255.54 | *112.54* | *179%* | **164.90** |
| **2016 වර්ෂය සඳහා මුළු ආදායම (A)** | | **2,339.95** | **2,564.01** | **2,728.13** | ***164.11*** | ***106%*** | **2,958.39** |
| පසුගිය වසරේ සිට ලැබිය යුතු TDL & EL | | 592.22 | **500.00** | 781.26 | *281.26* | *156%* | **935.49** |
| පසුගිය වසරේ අතැති මුදල් | | 412.11 | **250.00** | 110.52 | *(139.48)* | *44%* | **100.00** |
| කෙටිකාලීන ආයෝජන | | 1,750.00 | **1,750.00** | 2,000.00 | *250.00* | *114%* | **1,750.00** |
| වර්ෂය සඳහා අයවැය | | **5,094.28** | **5,064.01** | **5,619.91** | ***555.89*** | ***111%*** | **5,743.88** |
| **වියදම** | | | | | | | |
| පාරිශ්‍රමික, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 14 | 59.51 | **106.25** | 79.28 | *26.97* | *75%* | **173.00** |
| පරිහරණ හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතා කෙරේ | 15 | 33.26 | **120.15** | 34.71 | *85.43* | *29%* | **63.00** |
| වෙළඳ සම්බන්ධ වියදම් | 16 | 786.92 | **3,220.27** | 840.96 | *2,379.30* | *26%* | **3,732.10** |
| අයිතා ගෙවීම් | 16 | - | **120.00** | 26.07 | *93.93* | *22%* | |
| වෙනත් වියදම් | 17 | 3.07 | **3.55** | 2.71 | *0.84* | *76%* | **3.00** |
| මූල්‍ය පිරිවැය | 18 | 0.59 | **0.80** | 0.59 | *0.21* | *73%* | **1.00** |
| ආපදා ණය ප්‍රතිපාදන | | 3.30 | **-** | - | - | | |
| ගෝලීය ප්‍රචාරණ වැඩසටහන | | - | **463.00** | - | *463.00* | *0%* | |
| ප්‍රාග්ධන වියදම් * | 8 | 9.59 | **34.00** | 14.66 | *19.34* | *43%* | **8.00** |
| උපචිත වියදම් ** | | - | **200.00** | 142.82 | *57.18* | *71%* | |
| මුළු වියදම | | **896.26** | **4,268.01** | **1,141.80** | ***3,126.21*** | ***27%*** | **3,980.10** |
| **ගැලපීම** | | | | | | | |
| ප්‍රාග්ධන (අතිරේක 2016) * | | | | (4.02) | | | |
| පූර්ව වසරේ ගැලපීම් (උපචිත වියදම්) ** | | | | (142.82) | | | |
| **වර්ෂයට අදාළ මුළු වියදම (B)** | | **896.26** | | **994.96** | | | **3,980.10** |
| **අදාළ කාල සීමා අතිරික්තය / (හිගය) (A-B)** | | **1,443.69** | | **1,733.16** | | | **(1,021.71)** |
| භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම | | (500.00) | | (1,500.00) | | | |
| **භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීමෙන් පසු අතිරික්තය** | | **943.69** | | **233.16** | | | |

* වසර තුළදී ප්‍රාග්ධන වියදම, මූල්‍යමය කාර්යසාධනය සඳහා ඇතුළත් නොවන අතර, එය ශේෂ පත්‍ර අයිතමයකි.

** පූර්ව වර්ෂයට අදාළ වන බැවින්, වර්තන වියදම් සඳහා මූල්‍ය කාර්යසාධනයට ඇතුළත් නොවේ.

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
# 2016 වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන්

## 1. වාර්තාකරණ ආයතනය

### 1.1 සංස්ථාපනය කිරීම

2005 අංක 38 දරණ සංචාරක පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2007.10.01 දින සිට පිහිටුවා ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබේ.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ සමකොටස් වෙනස්කම් ප්‍රකාශනය, මුදල් ගලන ප්‍රකාශනය සහ ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් අන්තර් ගත වේ. මේවා සියල්ල ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති විගනකාධිපති සහ මුදල් හා සැලසුම් අමාත්‍යාංශයට අමතරව ශ්‍රී ලංකා ගිණුම් පිරිවිතර හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

### 1.4 තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදායට අනුව සකස් කර ඇත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය

ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව භාවිත කරනු ලබන ව්‍යයහාර මුදල් වර්ගය වන ශ්‍රීලංකා රුපියල් වලින් සියළුම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබේ.

### 1.6 ශේෂපත්‍ර දිනට පසුව සිදුවූ තත්වයන්

ශේෂපත්‍ර දිනට පසු වූ සියළු ද්‍රව්‍යාත්මක සිදුවීම් සැලකිල්ලට ලක් කර අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශන තුල අදාළ ගැලපීම්/ හෙලිදරවු කිරීම් කර ඇත.

## 2. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති

### 2.1 තොග

තොග අවම පිරිවැයට හෝ ශුද්ධ සත්‍යාපනය කළ හැකි වටිනාකමට පළමුවැන්නෙත් පළමු ක්‍රමවේදය (FIFO) භාවිතා කර තක්සේරු කර ඇත. රු. 1,590,362/- වටිනාකමැති ප්‍රවර්ධන භාණ්ඩ වල සත්‍යාපනය කළ හැකි වටිනාකමක් නොමැති බැවින් තොග ලේඛණයෙන් ඉවත් කර ඇත.

### 2.2 ක්ෂය

ක්ෂය සඳහා වූ ප්‍රතිපාදන සෘජු රේඛීය ක්‍රමය යොදා මිලදී ගත් මුදලට හෝ ලී බඩු හා සැකසුම්, පරිඝණක හා උපකරණ, වාහන, වායු සමීකරණ, කාර්යාල උපකරණ, දුරකථන හා විවිධ භාන්ඩ වැනි වත්කම් වල ප්‍රතිතක්සේරු කළ අගයට ඒවායේ පිරිවැය ලියා හැරීමට හැකි වන පරිදි ගණනය කෙරේ. මිලදී ගත් දින සිට ඇස්තමේන්තුගත භාවිත ආයුකාලයට අදාළ වටිනාකම පහත දක්වා ඇත.

| **වත්කම් විස්තරය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | 7.5% |
| පරිඝණක හා උපකරණ | 25% |
| වාහන | 25% |
| වායුසමීකරන යන්ත්‍ර | 7.5% |
| කාර්යාල උපකරණ | 7.5% |
| දුරකථන | 7.5% |
| විවිධ උපකරණ | 7.5% |

## 2.3 කාර්යාල ගොඩනැගිලි

කාර්යාංශයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය කුලී පදනම මත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් ලබා ගෙන ඇත.

## 2.4 විදේශ විනිමය ගණුදෙනු

මෙම ගණුදෙනු පහත පදනම් මත පරිවර්තනය කර ඇත.

- ලැබීම් හා ගෙවීම් - සත්‍ය අනුපාතය
- මුදල්, මුදල්වලට සමාන දෑ හා බැරකම් - අවසන් අනුපාතය
- ස්ථාවර වත්කම් - සත්‍ය අනුපාතය
- ප්‍රේෂණ - සත්‍ය අනුපාතය

## 2.5 අදාළ පාර්ශව අතර ගනුදෙනු

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව, අදාළ පාර්ශව අතර අනාවරණය කළයුතු ගනුදෙනු සිදු වී නොමැත.

## 2.6 පාරිතෝෂිත දීමනා සඳහා වූ ප්‍රතිපාදන

1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත යටතේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව වසරක සේවා කාලය සපුරා ඇති සියළු සේවකයන් හට ගෙවීමට සිදු වන පාරිතෝෂිත සඳහා වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ආයතනය සළසා ඇත. පාරිතෝෂිත ප්‍රදාන සඳහා අවශ්‍ය කරන ආයෝජන රාජ්‍ය බැංකු වල තැන්පත් කර ඇත.

## 2.7 උපචිත වියදම

මේ දක්වා ගෙවා නොමැති ඉන්වොයිස්පත් නොලද හෝ සැපයුම්කරු සමග විධිමත් එකගතාවයකට පැමිණියද මේ වන විට ආයතනය වෙත ලැබී ඇති හෝ සපයනු ලැබූ භාණ්ඩ හෝ සේවාවලට ගෙවීම් සඳහා පවතින වගකීම් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමුච්චිත වියදම් ලෙස අර්ථ දක්වා තිබේ.

## 2.8 අසම්භාව්‍ය ගෙවීම්

අවසන් නොවූ නඩු කටයුතු හා ඉන්දියන් ජාත්‍යන්තර චිත්‍රපට ඇකඩමි සම්මාන (IIFA) 2010 අදාළ පහත දැක්වෙන හිග ගෙවීම් වල නිසි ලේඛනගත වීමක් නොමැති විම සහ පියවීමට ඇති ගෙවීම් අසම්භාව්‍ය ගෙවීම් ලෙස අර්ථ දක්වා තිබේ.

2016 දෙසැම්බර් මස 31 දින වන විට, උක්ත ආයතනයේ පහත දැක්වෙන නඩු පිළිබඳ විස්තර පහත දැක්වේ

- සීමා. ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා SLTPB සහ සීමා. පීනික්ස් O & M (පුද්.) සමාගම - කොළඹ දිසා අධිකරණය
- පීනික්ස් O & M (පුද්.) සමාගම හා SLTPB අතර සමථ නඩුව - ICLP සමථ මධ්‍යස්ථානය

❖ පහත දැක්වෙන නඩු අවසන් වී ඇති අතර ඒවායේ තීන්දු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අවාසිදායක ඒවා වන බැවින් ගෙවීම් අධිකරණ නියෝගය පරිදි කිරීමට අවශ්‍ය වේ.

- වෝකර්ස් ටුවර්ස් රු. 657,950.38 ක නඩු අංක DMR/04049/2011 (ගෙවීම් 2017 මාර්තු මස තුල ගෙවා අවසන් කරනු ලැබේ.)
- ඒෂියන් හොටෙල්ස් & ප්‍රොපර්ටීස් PLC රු. මිලියන 30 (ආසන්න වශයෙන්) නඩු අංක මහාධිකරණය (සිවිල්) 480/2011/MR

මෙම හදිසි ගෙවීම් ඉදිරියේදී ගනු ලබන අධිකරණය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දු අනුව ගෙවීමට කටයුතු කරනු ඇත.

## 2.10 බදුකරණය

2014.04.01 දාතමැති අංක 01 දරණ ආදායක බදු චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සුදුසුකම් ලබන සේවකයන්ගෙන් ආදායක බදු අඩු කිරීමටත් ඒවා වසර තුල දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත.

## 2.11 අනෙකුත් ආදායම්

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් සංවිධානය කර පැවැත් වූ විදේශිය හා දේශීය ප්‍රවර්ධන වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වූ පුද්ගලික සහභාගීවන්නන්ගෙන් එකතු කරගත් ඇතුළ්වීමේ ගාස්තු මෙයට ඇතුළත් වේ.

## 2.12 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය භාවිතා කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වල මුදල් ගලන ප්‍රකාශ වලට අනුව සකස් කර තිබේ. මුදල් හා මුදල් වලට සමාන දෑ තුල තුල කෙටි කාලීන, සාමාන්‍ය මුදල් වලට ක්ෂණිකව හැරවිය හැකි ඉහළ ද්‍රවශීලිතාවයක් සහිත ආයෝජන ඇතුළත් වන අතර වටිනාකම් වල වෙනස්කම් වල ප්‍රදාන නොවන අවදානම් තුලට අන්තර්ගත වේ. මුදල් හා මුදල් වලට සමාන දෑ තුල අතැති මුදල් හා බැංකු ශේෂ අඩංගු වේ.

## 03. මුදල් හා මුදල් සාමයතා

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| බැංකුගත මුදල් - ප්‍රධාන කාර්යාල ප්‍රධාන ගිණුම | 92,269,456 | 308,649,379 |
| අතැති මුදල් - ප්‍රධාන කාර්යාල පුද්ගලික අංශය | 18,140,961 | 103,233,618 |
| බැංකුගත මුදල් - මහනුවර / TIC | 89,785 | 228,916 |
| සුළු මුදල් - ප්‍රවාහ | 19,826 | - |
| **මුදල් සහ මුදල් සමයතා එකතුව** | **110,520,029** | **412,111,913** |

## 04. ලැබිය යුතු මුදල්

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| පාරිභෝගික ප්‍රචාරන පත්‍රිකා - එක්සත් රාජධානිය | 2,428,920 | 2,428,920 |
| හික්කඩුව ටිකට්පත් | 876,000 | 876,000 |
| ඉන්ධන තැන්පතු | 200,000 | 200,000 |
| වාහන කුලී තැන්පතු - Excel Cabs | 20,000 | 20,000 |
| ඇමරිකන් ප්‍රිමියම් ජල පද්ධතිය | 4,000 | 4,000 |
| කෙටිකාලීන ආයෝජන පොලී ආදායම | 107,448,904 | 37,748,698 |
| ICPL බේරුම්කරණ මධ්‍යස්ථානය | 25,000 | 25,000 |
| අපගමන බද්ද | 464,971,472 | 343,651,711 |
| කටුනායක කුලී සඳහා තැන්පතු | 1,745,725 | 1,745,725 |
| සංචාරක සංවර්ධන බදු | 470,519,705 | 437,605,890 |
| දේපළ මූල්‍ය හා ආයෝජන - මහනුවර | 330,000 | 330,000 |
| තැන්පතු - TIC BIA කටුනායක | 290,074 | 290,074 |
| සහභාගීවීමේ ගාස්තු - BIT 2015 | 160,000 | 160,000 |
| දීමනාව EXPO Milano - 2015 | 63,094 | 63,094 |
| සහභාගී වීමේ ගාස්තුව TTG - 2014 | 80,000 | 80,000 |
| ප්‍රවර්ධන කුටි ඉදිකිරීම් - BIT 2014 | 80,000 | 80,000 |
| LSB - බීමට ජලය | 19,000 | - |
| තැන්පතු - KLCC | 332,846 | - |
| විවිධ ණයගැතියන් - SLTDA | 46,906 | 46,906 |
| තානාපති අංශ වෙතින් ලැබිය යුතු | 54,452,028 | 54,155,675 |
| ලැබිය යුතු - වෙළඳ දායකත්වය | 220,000 | 50,000 |
| ලැබිය යුතු මුළු මුදල | **1,104,313,675** | **879,561,694** |
| බොල් ණය හා අඩමාන ණය සඳහා බොල් ණය ප්‍රතිපාදන | (3,304,920) | (3,304,920) |
| **බොල් ණය ප්‍රතිපාදන පසු ලැබිය යුතු මුළු මුදල** | **1,101,008,755** | **876,256,774** |

## 05. අත්තිකාරම්

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| දේශීය අත්තිකාරම් | 1,721,000 | 1,582,500 |
| විදේශීය අත්තිකාරම් | 11,605,419 | - |
| **මුළු අත්තිකාරම්** | **13,326,419** | **1,582,500** |

**06. පූර්ව ගෙවීම්**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| JTTX සඳහා අවකාශ වෙන්කිරීම** | 6,882,229 | 5,345,220 |
| නිව්යෝර්ක් ටයිම්ස් සංචාර සංදර්ශනය සඳහා ඉඩ වෙන්කිරීම | 4,717,125 | 4,621,275 |
| 2016 නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක සංදර්ශන සඳහා සැරසිලි | - | 5,128,560 |
| ප්‍රේෂණය - නෝර්වේජියානු සංචාරක ප්‍රදර්ශනය | 589,912 | 742,044 |
| කැළණි දුරුතු පෙරහැර අනුග්‍රහය | 500,000 | 500,000 |
| වකන්තිබර්ග් සංදර්ශනය සඳහා ඉඩ ලබාගැනීම හා ඉදිරිපත් කිරීම් | 4,773,625 | 2,494,922 |
| TITF 2016 තායිලන්ත තානාපති කාර්යාල විනිමයවෙනස | - | 11,582 |
| ටෙලිග්‍රාප් සංචාර ප්‍රදර්ශනය, එක්සත් රාජධානිය - 2016 | - | 642,585 |
| වාහනය සඳහා රක්ෂණය | 415,293 | - |
| IMTM 2017 සඳහා ඉඩ වෙන්කිරීම** | 1,808,544 | - |
| MATKA 2017 සඳහා ඉඩ වෙන්කිරීම | 1,453,665 | - |
| රියාද් සංචාරක ප්‍රදර්ශනය 2017 සඳහා ඉඩ වෙන්කිරීම | 5,208,307 | - |
| රක්ෂණ ඔප්පුව - TIC BIA | 7,467 | - |
| ATM 2017 සඳහා ඉඩ වෙන්කිරීම | 32,982,481 | - |
| ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා වාර්ෂික ගිවිසුම | 30,895 | - |
| ලියාපදිංචිය හා ප්‍රවර්ධන කුටි FITUR 2017 * | 1,571,227 | - |
| TITF 2017 සඳහා ඉඩ වෙන්කිරීම | 1,599,475 | - |
| PR, MKT මූල්‍ය අංශවල වර්ණ ඡායාපිටපත් යන්ත්‍ර ගිවිසුම | 118,545 | - |
| ඔස්ට්‍රියා Ferien Masse 2017 සඳහා ඉඩ වෙන්කිරීම | 593,133 | - |
| වැටුප් හා ගිණුම්කරණ පැකේජය සඳහා සේවා ගාස්තු | 26,393 | - |
| මුළු පූර්ව ගෙවීම් | **63,278,316** | **19,486,187** |

* නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක ප්‍රදර්ශනය, නෝර්වේජියානු සංචාරක මංගල්‍යය, වකන්තිබර්ග් සංදර්ශනය, MATKA, FITUR, ඔස්ට්‍රියා ෆරීන් මාස් 2017 ජනවාරි මස පැවැත්විනි.

** ජේඩා සංචාරක සංදර්ශනය, IMTM, TITF 2017 පෙබරවාරි මස පවත්වන ලදී.

2017 පෙබරවාරි මස 28 වන දින වන විට පෙර ගිණුමේ ශේෂය රු. 39,289,380.51 ක් විය.

**07. සේවක ණය**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| ආපදා ණය | 2,092,484 | 1,742,293 |
| විශේෂ ණය | 151,606 | 140,797 |
| උත්සව ණය | 59,500 | 34,500 |
| සමස්ත කාර්ය මණ්ඩල ණය ප්‍රමාණය | **2,303,590** | **1,917,590** |

## 08 දේපල, පිරියත සහ උපකරණ

| විස්තරය | 01/01/2016 දිනට ශේෂය | එකතු කිරීම 2016 | 2016 වර්ෂ සඳහා ශුද්ධ එකතු කිරීම | 31/12/2016 දිනට ශේෂය | 01/01/2016 උපචිත ක්ෂය | 2016 ක්ෂයවීම් | ප්‍රතිඇගයුම් ක්ෂයවීම 2016 | 31/12/2016 දිනට සමුචිත ක්ෂය | 31/12/2016 දිනට ශුද්ධ පොත් වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ගොඩනැගිලි සංවර්ධන පිරිවැය | 10,602,454 | 310,238 | - | 10,912,692 | 5,231,936 | 806,799 | - | 6,038,735 | 4,873,957 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 845,462 | | - | 845,462 | 314,153 | 52,508 | - | 366,662 | 478,800 |
| දුරකථන ගාස්තු | 19,474,747 | 2,749,050 | - | 22,223,797 | 12,515,390 | 2,548,773 | - | 15,064,163 | 7,159,635 |
| පරිගණක උපකරණ | 6,228,684 | 603,950 | - | 6,832,634 | 1,989,193 | 487,053 | - | 2,476,245 | 4,356,389 |
| කාර්යාලීය උපකරණ | 27,600,000 | - | (2,100,000) | 25,500,000 | 9,999,246 | 6,375,000 | 4,100,000 | 20,474,246 | 5,025,754 |
| වාහන | 1,592,770 | - | - | 1,592,770 | - | - | - | - | 1,592,770 |
| පරිගණක මෘදුකාංග | 717,900 | 283,050 | - | 1,000,950 | 310,137 | 57,613 | - | 367,750 | 633,200 |
| වායුසමීකරණ | 4,115,675 | 74,000 | - | 4,189,675 | 755,521 | 312,849 | - | 1,068,370 | 3,121,305 |
| විවිධ උපකරණ | **71,177,693** | **4,020,288** | **(2,100,000)** | **73,097,981** | **31,115,576** | **10,640,595** | **4,100,000** | **45,856,170** | **27,241,810** |
| මුළු එකතුව | 1,592,770 | | | 1,592,770 | | | | | **1,592,770** |
| පරිගණක මෘදුකාංග | **69,584,923** | | | **71,505,211** | | | | **45,856,170** | **25,649,040** |
| **පරිගණක මෘදුකාංග අඩු කිරීමෙන් පසු** | | | | | | | | | |

**09. අත්තිකාරම් ලෙස ලබාගත් මුදල්**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| සැපයුම්කරු ලියාපදිංචිය | 122,900 | - |
| සහභාගීවීමේ ගාස්තු අත්තිකාරම් | 12,880,621 | 10,766,000 |
| අත්තිකාරම් මුළු ආදායම | **13,003,521** | **10,766,000** |

**10. තැන්පතු හා ගෙවිය යුතු දෑ**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව | 457,080 | 457,080 |
| ගෙවිය යුතු රැඳවුම් ගාස්තු | 210,953 | 193,553 |
| වෙනත් | 1,772,459 | 378,877 |
| ගෙවියයුතු මුළු තැන්පත් මුදල | **2,440,493** | **1,029,510** |

**11. සේවක ප්‍රතිලාභ**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| ඉදිරියටගෙන ආ විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිපාදන | 7,248,677 | 5,429,336 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 1,378,463 | 1,819,342 |
| සමස්ත සේවක ප්‍රතිලාභ ප්‍රමාණය | **8,627,141** | **7,248,677** |

**12. උපචිත වියදම් හා ණයගැතියන්**

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| උපචිත වියදම් 2014 | 134,353,759 | 158,479,876 |
| උපචිත වියදම් 2015 | 30,442,588 | 159,754,262 |
| උපචිත වියදම් 2016 | 121,718,005 | - |
| විවිධ ණයගැතියන් - SLTDA (ජල, විදුලි හා දුරකථන බිල්පත්) | 18,750,304 | 14,600,904 |
| සමස්ත ණයහිමියන් | **305,264,656** | **332,835,041** |

## 13. වෙනත් ආදායම්

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| මුද්‍රිත භාන්ඩ හා ඡායාරූප ආදායම | 463,660 | 424,880 |
| ආදායම - සේවක ණය පොලී | 66,359 | 74,471 |
| වෙළඳ දායකත්වය | 90,631,877 | 106,807,469 |
| පොළී ආදායම - බැංකු | 160,864,427 | 74,006,140 |
| විනිමය අනුපාත වාසිය | 262,717 | 406,095 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 42,400 | 95,000 |
| වෙනත් | 3,204,583 | 14,219 |
| මුළුවෙනත් ආදායම | **255,536,022** | **181,828,274** |

## 14. වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| වැටුප් හා දීමනා | 53,011,388 | 43,275,167 |
| නිවාඩු හිලව් දීමනාව | 5,059 | 11,231 |
| අතිකාල | 632,131 | 1,059,799 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකවීම - සේවක අර්ථසාධක අරමුදල | 5,748,537 | 2,510,810 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකවීම - සේ.නි.භා.අ. | 1,153,409 | 504,028 |
| කාර්යමණ්ඩල සුභසාධනය සහ පැමිණිමේ දිරිගැන්වීම් | 7,991,607 | 4,804,807 |
| ප්‍රවාහන - දේශීය | 126,050 | 169,312 |
| කාර්ය මණ්ඩල නිලඇඳුම් | 813,181 | 438,620 |
| පාරිතෝෂිත ගෙවීම් | 1,378,463 | 1,819,342 |
| රක්ෂණ ගාස්තු | 7,130,530 | 4,009,120 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 1,290,374 | 905,749 |
| මුළු පාරිශ්‍රමික, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | **79,280,728** | **59,507,983** |

## 15. සැපයුම් හා භාවිතා කරන ලද පාරිභෝගික ද්‍රව්‍ය

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| මුද්‍රණ කිරීම් හා ලිපිද්‍රව්‍ය | 7,773,826 | 2,793,770 |
| දුරකථන සහ අන්තර්ජාල පහසුකම් | 2,797,139 | 1,987,630 |
| තැපැල්, පාර්සල් යැවීම් සහ මුද්දර | 735,484 | 274,834 |
| ගොඩනැගිලි කුලී | 8,871,507 | 9,738,759 |
| විදුලි ගාස්තු | 3,035,291 | 3,319,192 |
| නඩත්තු කිරීම් - උපකරණ | 1,454,063 | 689,931 |
| නඩත්තු හා අලුත්වැඩියා කිරීම් - වාහන | 616,116 | 946,604 |
| කුලී වාහන | 228,984 | 4,264,236 |
| ජල ගාස්තු | 332,421 | 315,551 |
| පොත් හා වාරප්‍රකාශන | 612,016 | 249,406 |
| ඉන්ධන ගාස්තු | 969,761 | 1,265,061 |
| විනෝදාස්වාද - දේශීය | 81,649 | 50,998 |
| ගෘහපාලන සැපයුම්කරුවන් | 1,793,262 | 1,650,250 |
| ආරක්ෂාව සැලසීම් | 2,123,798 | 1,461,894 |
| ගොඩනැලි නඩත්තුව | 490,825 | 1,507,000 |
| ගාස්තු සහ බලපත්‍ර | 23,610 | 9,250 |
| කාර්යමණ්ඩල බඳවාගැනීම් | 1,394,085 | 2,013,463 |
| මුද්‍රණ කිරීම් හා ප්‍රකාශන | 1,152,921 | 346,314 |
| වාහන රක්ෂණ | 214,846 | 380,104 |
| කාර්යාල ගෘහභාණ්ඩ නඩත්තුව | 2,375 | - |
| තොරතුරු මධ්‍යස්ථාන නඩත්තුව | 6,850 | - |
| **මුළු සැපයුම් හා භාවිතා කරන ලද පාරිභෝගික ද්‍රව්‍ය** | **34,710,831** | **33,264,246** |

## 16. වෙළඳ අදාළ වියදම්

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| ප්‍රවර්ධනය කිරීම් සහ දැන්වීම් පල කිරීම් - විදේශීය | 675,301,442 | 635,544,669 |
| ප්‍රවර්ධනය කිරීම් සහ දැන්වීම් පල කිරීම් - දේශීය (මාධ්‍ය) | 3,030,882 | 5,617,568 |
| සංචාරක සන්නිවේදන උපකරණ නිෂ්පාදනය | 25,536,746 | 19,952,933 |
| උත්සව (ප්‍රදාන ඇතුළුව) | 88,714,836 | 78,367,607 |
| VJP සහ Trade FAM සංචාර | 10,458,993 | 137,518 |
| සමාජ වගකීම් ප්‍රවර්ධනය | - | 17,540,275 |
| නව නිපැයුම් සංවර්ධනය හා විනෝදය සඳහා ප්‍රසිද්ධ ස්ථාන | 5,582,089 | 467,706 |
| වෙබ් අඩවි ජාලය නඩත්තු කිරීම සහ ඊ - පුවත්, ග්ලෝබල් ඔන්ලයින් | 1,693,076 | 982,563 |
| ප්‍රචාරණය - සාමාන්‍ය හා මුද්‍රිත මාධ්‍ය | - | 1,620,983 |
| ගෝලීය ප්‍රචාරණ වැඩසටහන | 54,299 | 1,384,956 |
| ගෝලීය මහජන සම්බන්දතා වැඩසටහන | 5,371,375 | 11,949,892 |
| මහා පරිමාණ ඒකාබද්ධ ව්‍යාපාර | - | 388,000 |
| බ්ලොග් වැඩසටයහන | 10,218,954 | - |
| නැරඹුම් පහසුකම් සහ ආකර්ෂණය කිරීම් | 1,519,370 | 505,005 |
| ගුවන් සමාගම් හා විශේෂ සේවා සමඟ කටයුතු කිරීම | - | 12,464,854 |
| Online PR ක්‍රියාකාරකම් | 602,639 | - |
| මාධ්‍යය දැනුවත් කිරීමේ චාරිකා | 11,370,161 | - |
| ගෝලීය Online ඩිජිටල් | 981,500 | - |
| විශේෂ ව්‍යාපෘති | 528,000 | - |
| IIFA ගෙවීම් | 26,069,314 | - |
| මුළු වෙළඳ වියදම් - දේශීය | **867,033,675** | **786,924,530** |

## 17. වෙනත් වියදම්

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 1,081,628 | 719,585 |
| ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනා | 503,750 | 675,607 |
| නෛතික ගාස්තු | 987,818 | 1,630,933 |
| මුද්දර ගාස්තු | 33,485 | 29,130 |
| රජයේ ආදායම - දූත මණ්ඩල | 101,605 | 17,110 |
| **වෙනත් මුළු වියදම්** | **2,708,286** | **3,072,364** |

## 18. මූල්‍ය පිරිවැය

| විස්තර | 2016 (රු.) | 2015 (යළි උපලේඛන ගත කරන ලද) (රු.) |
|---|---|---|
| බැංකු ගාස්තු | 87,980 | 116,419 |
| විගණන ගාස්තු | 500,000 | 475,000 |
| **මුළු මූල්‍ය වියදම්** | **587,980** | **591,419** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ටීඅයිඑම්/ඒ/එස්එල්ටීපීබී/1/16/02 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 28 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ **2016** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **1971** අංක **38** දරන මුදල් පනතේ **14(2) (සී)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් : 1. ලේකම්, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
මුදල් අංශය
08 MAR 2018
Finance Division
229
SRI LANKA TOURISM PROMOTION BUREAU

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } විඅයිපී/ඒ/එස්එල්ටීපීබී/1/16/02  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 22 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2017 දෙසැම්බර් 29 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  ag@auditorgeneral.gov.lk  www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

(i) 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ සංචාරක සංවර්ධන බදු මුදල ඉක්මවා, එම වර්ෂය වෙනුවෙන් ලද රු.28,123,058 ක සංචාරක සංවර්ධන බදු මුදල ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීමක් ලෙස හඳුනාගෙන වෙනස සිදු වූ කාලපරිච්ඡේදයේදී ගැලපීම සිදු කළ යුතු වුවද කාර්යාංශය විසින් එම සංචාරක සංවර්ධන බදු ඇස්තමේන්තුවෙහි සිදු වූ වෙනස අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශන වල ගලපා තිබුණි.

(ii) කාර්යාංශය විසින් පෙර වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් වෙනුවෙන් හර එකතුව රු.189,974,569 ක් හා බැර එකතුව රු.84,063,843 ක් සමාලෝචිත වර්ෂයේදී අදාළ ගිණුම්වල ගැලපීම් කර තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

(i) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක ඒ සඳහා ප්‍රතිපාදන කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්යාංශයට අවාසිදායක ලෙස ප්‍රකාශයට පත් කර තිබූ ඉන්දියානු චිත්‍රපට සම්මාන උළෙල වෙනුවෙන් වූ නඩු තීන්දු ප්‍රකාරව පසුගිය වර්ෂවලට අදාළව ගෙවියයුතු රු.30,570,497 ක් 2017 වර්ෂයේදී ගෙවා තිබූ නමුත් ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.588,197,382 ක මුදලක් අසම්භාව්‍ය බැරකම් වශයෙන් හෙළිදරව් කර තිබුණු අතර ඉන් 2014 වර්ෂයට අදාළ රු.310,762,704 ක වටිනාකමින් රු.206,353,290 ක් 2017 අගෝස්තු 21 දින පෞද්ගලික මාධ්‍ය ආයතනයකට ගෙවා තිබුණි. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්ථන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් උක්ත ගෙවා ඇති මුදල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේදී රු.3,304,920 ක් බොල් ණය හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර තිබුණද ඒ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 'සිංගප්පූරු තානාපති කාර්යාලය විසින් එවන ලද ශේෂ සනාථ කිරීම්වලට අනුව කාර්යාංශයට ලැබිය යුතු රු.434,832 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී පවත්වන ලද ඉන්දියානු චිත්‍රපට සම්මාන උළෙළ සඳහා දරන ලද වියදම් අය කර ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් සමඟ ඉකුත් වර්ෂවලදී ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.26,069,313 ක් ගෙවා තිබුණි. මෙම වියදම් මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පිරිවැය රු.7,400,000 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් රථ දෙකකට අදාළ ප්‍රත්‍යාගණන ගැලපීමේදී එම මෝටර් රථ දෙකකට අදාල සමුච්චිත ක්ෂය රු.7,400,000 ක් සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.7,400,000 කින් අධි තක්සේරු වී ඇති අතර මෝටර් රථ ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම රු.5,300,000 ක් විය යුතු ප්‍රත්‍යාගණන අතිරික්තය රු.2,100,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2015 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද නැවත ප්‍රකාශිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති සංඛ්‍යා සහ විගණනය විසින් එකී අයිතමයන්ට අදාළව ගණනය කරන ලද සංඛ්‍යා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| | ගිණුම | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව ශේෂය රු. | ගණනය කිරීම අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|---|
| i. | ලැබිය යුතු ගිණුම් | 876,256,774 | 864,656,912 | 11,599,862 |
| ii. | අත්තිකාරම් | 1,582,500 | 1,577,350 | 5,150 |
| iii. | දේපල පිරියත උපකරණ | 38,469,347 | 32,269,347 | 6,200,000 |
| iv. | කලින් ලද ආදායම් | 10,766,000 | 11,319,550 | (553,550) |
| v. | ගෙවිය යුතු තැන්පතු | 1,029,510 | 1,085,735 | (56,225) |
| vi | උපචිත වියදම් සහ ණයහිමියෝ | 332,835,041 | 314,420,254 | 18,414,787 |

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් එහෙත් භෞතික සත්‍යාපනය සඳහා විගණනයට ඉදිරිපත් නොකළ රු.3,193,011 ක් වටිනා විවිධ උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.239,475 ක් ක්ෂය කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.8,200,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් උපචිත වියදම් එම වටිනාකමින් වැඩියෙන් සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) පූර්ව වර්ෂ ගැලපීම්වලට අදාළව කළ නියැදි පරීක්ෂාවේදී 2014 වර්ෂයට අදාළ උපචිත වියදම් රු.13,994,803 ක් 2015 වර්ෂයේදී කපාහැර තිබූ අතර නැවතත් 2016 වර්ෂයේදී 2014 වර්ෂයට අදාළව රු.135,784,470 ක් උපචිත වියදම් වෙන්කර තිබූ අතර රු.2,171,110 ක් කපා හැර තිබුණි. මේ අනුව උපචිත වියදම් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය මෙන්ම මූල්‍ය තත්ත්වයද නිවැරදිව පිළිබිඹු නොවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඌ) 2013 වර්ෂයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම වෙනුවෙන් මිලට ගෙන තිබුණු රු.1,529,500 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු නොකර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඊට අදාළ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| (අ) තනාපති කාර්යාල වෙත ප්‍රේෂණය කළ මුදල් | 24,491,929 | ශේෂ සනාථ කිරීම |
| (ආ) ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙලේ වියදම් | 276,000 | අදාළ නඩු තීන්දුවේ පිටපත |
| (ඇ) දේපළ, පිරියත හා උපකරණ | 3,193,011 | භෞතිකව තහවුරු කිරීමට අදාළ වත්කම් |

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මතු දැක්වෙන ගිණුම් ශේෂ සංචාරක සංවර්ධන අරමුදලේ හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් ශේෂ සමඟ සැසඳීමේදී පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් අනුව | සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් අනුව | සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව | වෙනස |
| --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. |
| (අ) ලැබිය යුතු අපගමන හා සංචාරක සංවර්ධන බදු ආදායම | 935,491,177 | 995,584,564 | - | 60,093,387 |
| (ආ) විවිධ ණයහිමියෝ | 18,750,304 | - | 24,448,523 | 5,698,219 |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවලින් රු.3,328,920 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් ද, රු.355,000 ක් වර්ෂ 03 කට වැඩි වර්ෂ 05 කට අඩු කාලයක් ද රු.2,618,893 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක් ද සහ රු.1,043,291,927 ක් වර්ෂ 1 කට අඩු කාලයක් ද සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ආ) චීන තානාපති කාර්යාලයෙන් අයවිය යුතු වර්ෂ 4 කට වැඩි ණයගැති ශේෂය රු.19,731,593 ක් වූ අතර අනෙකුත් තානාපති කාර්යාලවලින් වර්ෂ 01 කට වැඩි හා වර්ෂ 03 කට අඩු අයවිය යුතු ණයගැති ශේෂය රු.16,186,544 ක්ද වර්ෂ 01 කට අඩු අයවිය යුතු ණය ශේෂය රු.18,533,891 ක්ද විය.

(ඇ) ගෙවිය යුතු ශේෂවල ඇතුළත් රු.1,277,280 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද රු.6,607,680 ක් වර්ෂ 05කට අඩු වර්ෂ 04 කට වැඩි කාලයක්ද රු.2,839,476 ක් වර්ෂ 04 කට අඩු වර්ෂ 01 කට වැඩි කාලයක්ද රු.8,025,868 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ඈ) අන්තර් ජාතික ඉන්දියානු චිත්‍රපට සම්මාන උළෙල - 2010 (IIFA) වෙනුවෙන් 2010 වර්ෂයේදී හෝටලයක් වෙත ගෙවන ලද රු.1,575,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලින් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක්. ලින් වර්ෂයේ මාස හයක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්. කාර්යාංශය ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ඉදිරි 03 අවුරුදු කාලසීමාවකට අපේක්ෂිත සැලැස්මක් හා පූර්ව වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් |

| | |
|---|---|
| | සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය සහ ඉෂ්ඨ කර ගැනීම ඇතුලත් ප්‍රකාශයන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වගන්තියේ 5 උපවගන්තිය සහ 11 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ රු.233,164,067 ක අතිරික්තයක් ලැබී තිබුණු අතර මුදල් පනතේ විධිවිධානවල සඳහන් මුදල් යෙදවීමෙන් පසු වර්ෂයේ ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට කටයුතුකර නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.මිලියන 2,000 ක් කෙටිකාලීන ආයෝජන ලෙස රාජ්‍ය බැංකු වල ආයෝජනය කර තිබුණි. මේ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | වටිනාකම රු.308,700 ක් වන ලැප්ටොප් පරිගණක 03 ක් නැති වීම සම්බන්ධ වූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර භාණ්ඩාගාර ලේකම්ගේ එකඟත්වය ලබා ගත යුතු වුවද, කාර්යාංශය විසින් මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2011පෙබරවාරි11දිනැති අංක පීඊඩී/57දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වටිනාකම රු.2,000,000 ඉක්මවන රාජ්‍ය ආයතන හා රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා කරන අනුග්‍රාහක වියදම් හෝ පරිත්‍යාග සඳහා හා ඉන් බාහිරව ගෙවනු ලබන රු.100,000 ඉක්මවන අනුග්‍රහක වියදම් හෝ පරිත්‍යාග සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2016 වර්ෂයේදී එවැනි අනුමැතියකින් තොරව අනුග්‍රහක වියදම් සහ පරිත්‍යාග සඳහා එකතුව රු.26,278,110ක් ගෙවා තිබුණි. |

### 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,733,164,067 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,443,689,744 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.289,474,323 ක වැඩිවීමක් දැක්වුණි. අපගමන බදු රු.270,830,123 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.476,209,102 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂය අවසානයට රු. 233,164,067 ක් ලෙස පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2012 වර්ෂයේ දායකත්වය රු. 508,664,239 ක් වූ අතර 2016 වර්ෂයේ දී රු. 1,823,085,390 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 කාර්යාංශයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

බාහිර පාර්ශව විසින් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබූ නඩු 07ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නොවිසඳී තිබුණි.

## 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයට අදාළව ජංගම අනුපාතය පිළිවෙලින් 10:1 හා 14:1 ක් වූයෙන් ඉහල ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අඛණ්ඩව කෙටිකාලීන ආයෝජන වල මුදල් යොදවා තිබීම මෙයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 40(4) වගන්තිය අනුව කාර්යාංශයේ පරමාර්ථ පහත පරිදි වේ.

- අධිකාරියේ උපදෙස් විමසා සංචාරක සංවර්ධන සැලැස්මට අනුකූලව විශිෂ්ඨ සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සෘජුව හෝ වක්‍රව ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රයේ අළෙවිකරණය සහ ප්‍රවර්ධනය;
- දකුණු ආසියා කලාපයට දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම; සහ
- කලාපයේ විශිෂ්ට සංචාරක කර්මාන්ත කළමනාකරණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකට භාවයට පත් කිරීම.

### 4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර නර්තන සැණකෙළිය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදීම වෙනුවෙන් කාර්යාංශය විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ රු.1,500,000 ක අත්තිකාරම් ගෙවා තිබුණ ද අදාල සැණකෙළිය පවත්වා නොතිබුණු අතර ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී රු.70,321,758 ක වියදමක් දරා පෞද්ගලික ආයතනයක් වෙතින් Global Television Campaign නමින් රූපවාහිනී වැඩසටහන් දෙකක් 2014 වර්ෂයේ නිර්මාණය කර තිබුණද අල් ජසීරා රූපවාහිනී සේවය ඔස්සේ එකී වැඩසටහන් විගණිත දිනය වූ 2017 ජූනි 30 දක්වා ප්‍රචාරයවූ බවට සනාථ නොවිය.

(ඇ) 2013, 2014 හා 2015 වර්ෂවලදී කාර්යාංශය මගින් අධිකාරිය වෙත ජලය, විදුලිය හා දුරකථන බිල්පත් වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු.824,363ක මුදල වෙන් වෙන්ව හඳුනාගෙන තිබුණද 2016 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂය සඳහා උපචිත වියදම් ලෙස විවිධ අංශවලින් ඉදිරිපත් කළ වටිනාකමින් රු.25,102,429 ක් ගිණුම් අංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව කළමනාකරණය විසින් උපචිත වියදම් හඳුනාගැනීමේදී නිසි පදනමකින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 04 කට 2017 නොවැම්බර් 20 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අන්තර් ජාතික ඉන්දියානු චිත්‍රපට උළෙල 2010 වෙනුවෙන් වියදම් දැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යන ආයතන දෙකට එරෙහිව ගොනු කරන ලද අංක HC(civil)480/2011/DMR දරන නඩුවේ තීන්දුව අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල රු.23,803,179 ක් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

(ආ) 2014 සහ 2015 වර්ෂවල ගිණුම් ඉදිරිපත් කිරීමේදී හඳුනා ගෙන නොතිබුණු 2014 වර්ෂයට අදාළ රු.135,784,470 ක් 2016 වර්ෂයේදී ගිණුම්වලට ඇතුළත් කර තිබුණි.

## 4.4 දූෂණ අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටිකට්පත් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එකී ටිකට්පත් තොග ආයතනය වෙත ලැබී නොතිබූ අතර එකී මිලදී ගැනීම වෙනුවෙන් පිළියෙල කළ ලේඛන පිළිගත නොහැකි විය.

(ආ) පිළිගත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව 2010 වර්ෂයේදී ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙල (IIFA) වෙනුවෙන් රු.1,116,000 ක් වැයකර මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 07 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් ගබඩාවට භාරගත් බවට හෝ නිලධාරීන් අතර බෙදාහැරි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකළ අතර ඒවා භෞතික පරීක්ෂාවටද ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 69 ට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබියදී හා එහි රීති 74 ට අනුව ගොනුවක් පවත්වා නොතිබියදී, අමාත්‍යාංශ අනුමැතියකින් හා කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව සුදුසුකම් නොමැති නිලධාරිනියක උත්සව අවස්ථා අධ්‍යක්ෂක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර 2014 දෙසැම්බර් සිට 2016 මැයි දක්වා ඇයට වැටුප්, දුරකථන බිල්, ඉන්ධන හා වාහන දීමනා හා සුව දැහැන රක්ෂණ ක්‍රමය වෙනුවෙන් රු.1,689,340ක් ගෙවා තිබුණි.

(ඈ) ප්‍රංශ සංචාරක නියෝජිත ජාතික සංගමයේ වාර්ෂික සම්මේලනය ශ්‍රී ලංකාවේ පැවැත්වීම වෙනුවෙන් සම්මේලන කාර්යාංශය සමඟ ඇති කර ගෙන තිබූ අවබෝධතා ගිවිසුමට අනුව ගුවන් ගමන් ගාස්තු යුරෝ 500 ක් දක්වා පැමිණෙන සංචාරකයන් විසින් දරාගත යුතුය. එහෙත් ශ්‍රී ලංකාව හා ප්‍රංශය අතර සෘජු ගුවන් ගමන් නතර කිරීම හේතුවෙන් මගියෙකුට දැරීමට සිදුවන වැඩිවන ගුවන් ගමන් ගාස්තුව පහසුකම් සපයන රටින් දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව වැඩිවන ගුවන් ගමන් ගාස්තුව පමණක් කාර්යාංශය මඟින් දැරිය යුතු වුවද, ගෙවිය යුතු ගාස්තුව නිශ්චය කර ගැනීමකින් තොරව ගුවන් සේවා සමාගම විසින් ඉදිරිපත් කරන ලද බිල්පතෙහි සම්පූර්ණ වටිනාකම වූ රු.37,442,851 ක් වර්ගීකරණය කර ගැනීමකින් තොරව කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 20කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවති අතර එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 09 ක් විය.

(ආ) සංචාරක කටයුතු පනතේ 40(7) වගන්තියට හා රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 69,70,72,73 හා 74 ට පටහැනිව කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂක තනතුරට සුදුසුකම් නොමැති නිලධාරියෙකු බඳවා ගෙන 2016 මාර්තු සිට මැයි දක්වා කාලය සඳහා වැටුප් ලෙස රු.1,556,110 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි. කෙසේ වුවද,ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේ දී වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 534 න් 225 ක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විදේශ අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් ප්‍රධාන රටවල් 21 ක් තුළ ඉසව් 122 ක් සැලසුම් කර තිබුණද එයින් ඉසව් 80 ක් පමණක් පවත්වා තිබුණි. ඒ වෙනුවෙන් විදේශ මුදල් ඒකක වලින් විදේශ සැපයුම්කරුවන්ට ගෙවා තිබූ රුපියල් මිලියන 438.36 ක මුදලින්, රුපියල් මිලියන 78.92 ක් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ගෙවීම් සිදු නොකර සෘජුවම කාර්යාංශය විසින් සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ පරිච්ඡේදයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ විෂයයන් 43 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 45 ක සිට සියයට 659 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 ජූලි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 03 දින සිට 06 දක්වා එක්සත් රාජධානියේ පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව මිලදී ගන්නා ලද රු.350,000 ක් වටිනා මැණික් ගල් 02 ක් හා නොමිලේ කාර්යාංශය වෙත ලැබුණු මැණික් ගල් 02 ක් ගබඩා තොග පොත්වල ඇතුලත් කර නොතිබුණු අතර නොමිලයේ ලැබුණ මැණික් ගල් 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමද සිදු කර නොතිබුණි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා අනුව කැරට් 1.4,1.6,1.63 හා 1.54 බර මැණික් 4 ක් කාර්යාංශයට ලැබී තිබුණු බැවින් රු.350,000 කට මිලදීගත් මැණික් ගල් 02 ක බර කැරට් 5.6 ක් වූයෙන් ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා හා ඉන්වොයිසියේ සඳහන් විස්තර අනුව මැණික් ගල් වල කැරට් බර නොසැසඳුණි.

(ආ) 2014 වර්ෂයේ ලෝක සංචාරක දිනය නිමිත්තෙන් යයි දක්වමින් රු.5,824,000 ක මුදලක් වැයකර මුද්‍රණය කර තිබූ ටීෂර්ට්, එකී සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගේ ප්‍රකාශය පරිදි මුද්‍රණයකර තිබුණේ දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුත්තක් ලෙසිනි.

(ඇ) සංචාරක ක්ෂේත්‍රය තුළ සමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට රු.99,439,900 (බදු රහිත) ක මුදලක් ගෙවා තිබූ නමුත් එකී ගෙවීම පිළිගත නොහැකි ගෙවීම් බවට නිරීක්ෂණය විය.

(ඈ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළෙඳ ප්‍රදර්ශනයේ " (WTM) (UK) 2014" වෙළඳ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කළයුතු දිනට දින 04 කට කලින් විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එම ඉදිකිරීම සඳහා කාර්යාංශය විසින් රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය සිදු කර තිබුණි.

(ඉ) චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ කිහිපයක් ආවරණය වන පරිදි සිදු කළ FAM චාරිකාව සඳහා රු.3,506,757 ක් වැයකර තිබුණු අතර එම චාරිකාව පිළිබඳ වාර්තා චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2014 (ICC) ලෝක කුසලාන විස්සයි විස්ස ක්‍රිකට් තරඟාවලියේ ක්‍රිකට් පෝස්ටර් මුද්‍රණ සම්බන්ධ ප්‍රසම්පාදනයේ, ප්‍රසම්පාදන කමිටු තීරණය 2014 අප්‍රේල් 28 දින ලබා දී තිබුණද, ටෙන්ඩර් විවෘත කළ 2014 අප්‍රේල් 08 දිනදීම තාක්ෂණික ඇගයීම් කමිටුව රැස් වී තම වාර්තාව ලබා දීම, පෞද්ගලිකආයතනයකින් බදු සමඟ රු. 700,000 ක ඉන්වොයිසිය ලැබීම සහ ක්‍රිකට් පෝස්ටර් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත ලැබීමට අදාල භාණ්ඩ භාර ගැනීමේ පත්‍රිකාව නිකුත් කිරීම නිසා මෙම කාර්යය විනිවිදභාවයකින් යුතුව සිදු වී තිබෙද යන්න පිළිබදව විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්කරණය නොකිරීම, ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල අගය නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම සහ ලැබිය යුතු ගිණුම් නිවැරදිව ගිණුම්වලින් හෙළිදරව් නොකිරීම, පූර්ව වර්ෂ ගැලපීම් නිවරදිව ගිණුම්ගත නොකිරීම. |
| (ආ) අයවැය ලේඛනමය පාලනය | අයවැය සහ තථ්‍ය වියදම්වල සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩලය පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) ස්ථාවර වත්කම් ලේඛනමය පාලනය | කාර්යාංශය ස්ථාවර වත්කම් සියල්ල හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති




srilanka

WONDER OF ASIA

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අංක 80,ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව

දුරකථන : +94 112 432 059 – 60 | www.srilanka.travel